# 2

# ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම

## 2.1 සමස්ත නිරීක්ෂණ

2016 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.8 ක වර්ධනයට **සාපේක්ෂව දේශීය මෙන්ම විදේශීය වශයෙන් වූ අභියෝග මධ්‍යයේ සියයට 4.4 කින් වර්ධනය විය.** දේශීය වශයෙන් ගත් කල, රජයේ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් නැවත ආරම්භ කිරීම මෙන්ම ආයෝජන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ද ආර්ථික වර්ධනය කෙරෙහි දායක විය. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට අදාළව විශේෂයෙන්ම රජයේ ආදායම වර්ධනය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, සැපයුම් අවහිරතා සහ බදු ප්‍රතිපත්ති හේතුවෙන් 2016 වසරේ අවසාන භාගයේ දී පැවැති ඉහළ උද්ධමන වාතාවරණය, මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම වසර පුරාම පැවැති අහිතකර කාලගුණික තත්ත්වයන් ද ආර්ථික වර්ධනය මන්දගාමී වීම කෙරෙහි හේතුවිය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබන ව්‍යාපාරික සමීක්ෂණවලට ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලද පරිදි ඉහළ වර්ධන වේගයක් පවත්වා ගැනීමට මූලික බාධාවක් වූ 2016 වසරේ ආරම්භක කාලසීමාවේ දී ප්‍රතිපත්තිවල පැවැති අස්ථිරභාවය හේතුවෙන් හටගත් අවිනිශ්චිතතාවය ද සමස්ත ආර්ථික කටයුතු කෙරෙහි බලපෑම් ඇති කරන ලදී. එමෙන්ම මෙම සමීක්ෂණවලට ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කළ පරිදි පුහුණු ශ්‍රමික හිඟය මෙන්ම කාන්තා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ යෑම වැනි ව්‍යුහාත්මක අවහිරතා ද ආර්ථික කටයුතුවල අඛණ්ඩ වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කරමින් පවතී. විදේශීය වශයෙන් ගත් කල, ගෝලීය ආර්ථික වර්ධනය අඩු මට්ටමක පැවැතීම, ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල අඩු වර්ධනයක් පැවැතීම, එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ නැංවීම මෙන්ම 2016 වසර තුළ දී අනපේක්ෂිත ගෝලීය ආර්ථික සහ දේශපාලනික තත්ත්වයන් හේතුවෙන් පැන නැගුණු ප්‍රතිපත්තිවල අස්ථිරභාවය ද විදේශීය ඉල්ලුමෙහි අපේක්ෂිත වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී.

**නිෂ්පාදන අංශය සැලකූ විට, 2016 වසර තුළ දී පැවැති අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීමක් දක්නට ලැබුණු අතර කර්මාන්ත සහ සේවා කටයුතුවල වර්ධනය සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය.** ආර්ථික වර්ධනය සඳහා වැඩිම දායකත්වයක් දක්වන සේවා ආශ්‍රිත කටයුතුවල වර්ධනය සඳහා මූල්‍ය සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් මෙන්ම ප්‍රවාහන සේවාවන්හි වර්ධනය ද ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල දක්නට ලැබුණු ඉහළ වර්ධනය, කර්මාන්ත කටයුතුවල සැලකිය යුතු වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් විය. අහිතකර කාලගුණික තත්ත්වයන් මෙන්ම රුසියාව සහ ඇතැම් මැදපෙරදිග රටවල් වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික අපනයන වෙළඳ පාර්ශ්වකාර රටවල පැවැති අඩු මිල මට්ටම් සහ අඩු ඉල්ලුම ද කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීම කෙරෙහි හේතු විය.

**වියදම් ප්‍රවේශයේ ඇස්තමේන්තුවලට අනුව, නාමික මෙන්ම මූර්ත වශයෙන් ද ආයෝජනවල දක්නට ලැබුණු වර්ධනය සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි බෙහෙවින් ඉවහල් විය.** රජයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මෙන්ම ඒ හා සමගාමීව ඉදිකිරීම්

කටයුතු සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ යෑම ද හේතුවෙන් දක්නට ලැබුණු ඉදිකිරීම් කටයුතුවල ප්‍රසාරණය, ආයෝජනවල වර්ධනය ඉහළ යෑමට හේතු විය. මේ අතර, පොලී අනුපාතික සහ බදු ඉහළ නැංවීම, පරිභෝජන භාණ්ඩ ආනයන මිල ගණන් ඉහළ යෑම මෙන්ම දේශීය මුදල් ඒකකයෙහි අගය පිරිහීම ද හේතුවෙන් පෞද්ගලික පරිභෝජන වියදම මන්දගාමී විය. එමෙන්ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට අදාළව ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් රජයේ පරිභෝජන වියදමෙහි ද පහළ යෑමක් දක්නට ලැබුණි. තවද, ප්‍රධාන වශයෙන් අපනයනවලට සාපේක්ෂව ආනයන ප්‍රමාණාත්මකව ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම 2016 වසර තුළ දී පහත වැටුණි. ආයෝජන කටයුතුවල වර්ධනයත් සමගම

### 2.1 සංඛ්‍යා සටහන

### කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (අ)(ඇ)
### (2010 ස්ථාවර මිල අනුව)

| ආර්ථික කටයුතු | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි. හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2015(ආ) | 2016 | 2015(ආ) | 2016 | 2015(ආ) | 2016 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **4.8** | **- 4.2** | **7.6** | **- 7.4** | **7.8** | **7.1** |
| ධාන්‍ය වගාව (වී හැර) | 7.3 | - 10.5 | 0.3 | - 0.4 | 0.2 | 0.1 |
| වී වගාව | 25.0 | - 31.0 | 3.8 | - 6.2 | 0.9 | 0.6 |
| එළවළු වගාව | 2.7 | - 2.1 | 0.4 | - 0.3 | 0.7 | 0.6 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | - 15.0 | 13.4 | - 0.1 | 0.1 | 0.0 | 0.0 |
| පලතුරු වගාව | 17.5 | - 3.7 | 1.8 | - 0.5 | 0.6 | 0.5 |
| තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම් වගාව) | 5.2 | - 0.6 | 0.8 | - 0.1 | 0.8 | 0.7 |
| තේ වගාව | - 2.6 | - 11.2 | - 0.5 | - 2.1 | 0.8 | 0.7 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | - 18.1 | 7.5 | - 0.1 | 0.0 | 0.0 | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 6.9 | 6.4 | 1.0 | 1.0 | 0.7 | 0.7 |
| රබර් වගාව | - 10.1 | - 10.7 | - 0.7 | - 0.7 | 0.3 | 0.3 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 9.3 | - 2.2 | 0.4 | - 0.1 | 0.2 | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 8.1 | 6.3 | 1.0 | 0.9 | 0.6 | 0.6 |
| පැල බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 6.7 | - 4.7 | 0.2 | - 0.1 | 0.1 | 0.1 |
| වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 1.9 | 5.5 | 0.2 | 0.7 | 0.6 | 0.6 |
| ධීවර කර්මාන්තය | - 2.6 | 1.6 | - 0.8 | 0.5 | 1.4 | 1.3 |
| **කර්මාන්ත** | **2.1** | **6.7** | **11.5** | **40.1** | **26.2** | **26.8** |
| පතල් හා කැණීම් කර්මාන්තය | - 5.2 | 14.4 | - 2.6 | 7.3 | 2.2 | 2.4 |
| නිෂ්පාදන කර්මාන්ත | 4.9 | 1.7 | 16.0 | 6.3 | 15.7 | 15.4 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම | 5.9 | 8.4 | 1.2 | 1.9 | 1.0 | 1.0 |
| ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 4.4 | 7.9 | 0.1 | 0.3 | 0.1 | 0.1 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | 24.9 | 17.8 | 1.1 | 1.0 | 0.3 | 0.3 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | - 2.7 | 14.9 | - 4.2 | 23.4 | 6.9 | 7.6 |
| **සේවාවන්** | **5.7** | **4.2** | **66.5** | **54.0** | **56.6** | **56.5** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 4.8 | 3.4 | 23.1 | 17.9 | 23.1 | 22.9 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 10.9 | 8.0 | 1.2 | 1.0 | 0.6 | 0.6 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 13.3 | 8.4 | 31.3 | 23.5 | 12.3 | 12.8 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 1.8 | 0.7 | 4.5 | 1.8 | 11.9 | 11.4 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 3.6 | 4.9 | 6.5 | 9.7 | 8.7 | 8.7 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **4.6** | **4.2** | **85.7** | **86.6** | **90.6** | **90.4** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | 7.5 | 6.2 | 14.3 | 13.4 | 9.4 | 9.6 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **4.8** | **4.4** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | - 18.1 | - 14.0 | | | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **4.5** | **4.1** | | | | |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


අන්තර් භාණ්ඩ මෙන්ම ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යැම සමස්ත ආනයන වර්ධනය වීම කෙරෙහි බෙහෙවින් හේතු විය. අපනයන නාමික වශයෙන් වර්ධනය වුවද, එය ආනයනවල වර්ධනය තුළින් ඇති වූ බලපෑම සමනය කිරීමට තරම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම දුර්වල විය.

**මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීමත් සමගම පෞද්ගලික ඉතුරුම්වල වර්ධනය මෙන්ම, රාජ්‍ය නිර්-ඉතුරුම්වල පහළ යැමෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ඉතුරුම් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** තවද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යැම හේතුවෙන් විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම සැලකිය යුතු ලෙස අඛණ්ඩව වර්ධනය වීම හා සමගාමීව ජාතික ඉතුරුම් වර්ධනය විය. මේ අතර, විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් මෙම වසර තුළ දී පහත වැටුණි. ඒ අනුව, 2015 වසරට සාපේක්ෂව ජාතික ඉතුරුම් 2016 වසර තුළ ඉහළ වර්ධනයක් වාර්තා කරන ලද අතර එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද ඉහළ ගියේය. කෙසේ වුවද, ආයෝජන සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් ඉතුරුම්-ආයෝජන පරතරය පසුගිය වසරට සාපේක්ෂව සුළු වශයෙන් වර්ධනය විය. මේ අතර, ආදායම් ප්‍රවේශය යටතේ, දළ මෙහෙයුම් අතිරික්තය 2016 වසරේ දී ද ආර්ථිකයේ ආදායම ජනනය කරනු ලබන ප්‍රධානතම සංරචකය ලෙස පැවැති අතර ගෘහ ඒකක අංශය ආදායම සඳහා වැඩිම දායකත්වය දක්වන ලද ආයතනික අංශය විය.

## 2.2 ද.දේ.නි., ඒක පුද්ගල ද.දේ.නි. සහ දළ ජාතික ආදායම (ද.ජා.ආ.)

**2016 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි., 2015 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 10,951.7 (එ.ජ.ඩොලර් බිලියන 80.6) ක අගයට සාපේක්ෂව රුපියල් බිලියන 11,839.0 (එ.ජ.ඩොලර් බිලියන 81.3) ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** ඒ අනුව, 2016 වසරේ දී ද.දේ.නි., 2015 වසරේ දී නාමික වශයෙන් වාර්තා කළ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.1 කින් වර්ධනය විය. නාමික වශයෙන් වූ මෙම වර්ධනය කෙරෙහි 2015 වසරේ දී සියයට 0.8 ක් වූ ද.දේ.නි. ගම්‍ය මිල අවධමනකය 2016 වසරේ දී සියයට 3.6 ක් දක්වා ඉහළ යැම මූලික වශයෙන් හේතු විය. මේ අතර, 2016 වසරේ දී ද.දේ.නි. මූර්ත වශයෙන්, 2015 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 8,633.9 ක අගයට සාපේක්ෂව රුපියල් බිලියන 9,012.0 ක් විය. මේ අනුව, 2016 වසරේ දී ද.දේ.නි.හි මූර්ත වටිනාකම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.4 කින් වර්ධනය විය.

**2.1 රූප සටහන**
**වාර්ෂික වර්ධන අනුපාතිකය (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2016 වසරේ දී ඒක පුද්ගල ද.දේ.නි., 2015 වසරේ දී වාර්තා කළ රුපියල් 522,355 ට සාපේක්ෂව රුපියල් 558,363 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** ඒ අනුව, ප්‍රධාන වශයෙන් ද.දේ.නි.හි නාමික වටිනාකමෙහි සිදු වූ වර්ධනය හේතුකොට ගෙන 2016 වසරේ දී ඒක පුද්ගල ද.දේ.නි., 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 6.9 ක වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, එක්සත් ජනපද ඩොලර් අගය අනුව ගණනය කිරීමේ දී 2015 වසරේ දී එ.ජ. ඩොලර් 3,843 ක් වූ ඒක පුද්ගල ද.දේ.නි. 2016 වසරේ දී එ.ජ. ඩොලර් 3,835 දක්වා පහත වැටුණි. එ.ජ. ඩොලරයට සාපේක්ෂව දේශීය මුදල් ඒකකයෙහි අගය පිරිහීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**ද.දේ.නි.ට විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම ගැලපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන ද.ජා.ආ. 2016 වසරේ දී රුපියල් බිලියන 11,506.2 දක්වා සියයට 7.8 කින් නාමික වශයෙන් වර්ධනය වූ අතර එය 2015 වසරේ දී සියයට 5.4 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** ද.දේ.නි.හි නාමික වර්ධනය 2016 වසර තුළ ඉහළ යැම මෙන්ම විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම 2015 වසරේ දී වාර්තා කළ සියයට 19.2 ක පහත වැටීමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 18.3 ක් ලෙස අඩු වේගයකින් පහත වැටීම ද ද.ජා.ආ.හි දක්නට ලැබුණු වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

## 2.3 ආයතනික අංශයන්හි දායකත්වය

**ආර්ථික කටයුතු ආයතනික අංශ වර්ගීකරණයට අනුව සැලකීමේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය ආර්ථිකයේ සමස්ත එකතු කළ අගය සඳහා ප්‍රධානතම දායකත්වය තවදුරටත් සපයන ලදී.**

### 2.2 සංඛ්‍යා සටහන
### පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගය (අ)(ඇ)

| අයිතමය | ප්‍රතිශතක දායකත්වය (%) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015 (ආ) | | | | 2016 | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. තො. ගෘ. සේ. ආ.* අංශය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. තො. ගෘ. සේ. ආ.* අංශය |
| කෘෂිකර්මාන්තය | 16.9 | - | - | 83.1 | 18.6 | - | - | 81.4 |
| කර්මාන්ත | 60.4 | - | 4.3 | 35.3 | 61.1 | - | 2.2 | 36.6 |
| සේවාවන් | 23.8 | 7.0 | 15.3 | 53.9 | 23.9 | 7.6 | 15.1 | 53.4 |
| මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය | 34.0 | 4.3 | 10.7 | 51.0 | 34.5 | 4.7 | 10.1 | 50.7 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
* ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඒ අනුව, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය 2016 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව ආර්ථිකයෙහි සමස්ත එකතු කළ අගයෙන් සියයට 50.7 කට දායකත්වය දක්වන ලදී. තවද, 2016 වසරේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශයෙහි සමස්ත එකතු කළ අගය, නාමික වශයෙන් 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.4 ක වර්ධනයට සාපේක්ෂව සියයට 6.2 කින් වර්ධනය විය. මේ අතරතුර දී, මූල්‍ය නොවන ආයතන අංශය 2016 වසරේ දී ද ආර්ථිකයේ දෙවන විශාලතම අංශය බවට පත්වෙමින් සමස්ත එකතු කළ අගයෙන් සියයට 34.5 කට දායකත්වය ලබා දෙන ලදී. තවද, මූල්‍ය නොවන ආයතන අංශය 2015 වසරේ දී වාර්තා කළ සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 8.3 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, ආර්ථික කටයුතු සඳහා රජයේ දායකත්වය පිළිබිඹු කරනු ලබන රාජ්‍ය අංශය 2016 වසරේ දී ආර්ථිකයේ සමස්ත එකතු කළ අගයෙන් සියයට 10.1 කට දායකත්වය දක්වමින් සියයට 0.2 කින් සුළු වශයෙන් වර්ධනය විය. තවද, මූල්‍ය ආයතන අංශයෙහි එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 3.5 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 17.3 කින් වර්ධනය විය. මෙම අංශය ආර්ථිකයේ සමස්ත එකතු කළ අගයෙන් සියයට 4.7 කට දායකත්වය දක්වන ලදී.

**ආර්ථිකයේ කෘෂිකාර්මික සහ සේවා කටයුතුවල සමස්ත එකතු කළ අගය සඳහා ප්‍රමුඛතම දායකත්වය ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය විසින් සපයා ඇති අතර මූල්‍ය නොවන ආයතන අංශය විසින් කර්මාන්ත කටයුතු සඳහා ප්‍රධානතම දායකත්වය දක්වා ඇත.** ඒ අනුව, 2016 වසරේ දී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය කෘෂිකාර්මික කටයුතුවල සමස්ත එකතු කළ අගයෙන් සියයට 81.4 කට දායකත්වය දැක්වූ අතර මූල්‍ය නොවන ආයතන අංශය සෙසු සියයට 18.6 සඳහා දායක වී ඇත. කෘෂිකාර්මික කටයුතු අතරින්, ධීවර කර්මාන්තය, එළවළු වගාව, කුළුබඩු හෝග වගාව සහ වී වගාව සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය බහුල වශයෙන් දායක වී ඇත. මේ අතර, මූල්‍ය නොවන ආයතන අංශය විසින් සත්ත්ව නිෂ්පාදනය සහ තේ වගාව සඳහා වැඩි වශයෙන් දායක වී ඇත. කර්මාන්ත කටයුතු සැලකීමේ දී, 2016 වසරේ දී එහි සමස්ත එකතු කළ අගයෙන් සියයට 61.1 කට මූල්‍ය නොවන ආයතන අංශය දායක වී ඇති අතර සියයට 36.6 ක් සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය ද සියයට 2.2 ක් සඳහා රාජ්‍ය අංශය ද සිය දායකත්වය දක්වා ඇත. කර්මාන්ත කටයුතු අතරින් නිෂ්පාදන කර්මාන්ත සඳහා මූල්‍ය නොවන ආයතන අංශය විසින් ඉහළම දායකත්වය දක්වා ඇත. ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය නිෂ්පාදන කර්මාන්ත සඳහා දෙවැනි විශාලතම දායකත්වය දක්වා ඇත. මෙහි දී කර්මාන්ත කටයුතු සඳහා රාජ්‍ය අංශයෙහි දායකත්වය දැකිය හැකි වනුයේ ඉදිකිරීම් කටයුතු සඳහා වේ. මේ අතරතුර දී, සේවා කටයුතුවල සමස්ත එකතු කළ අගය සඳහා සිව් අංශයම දායක වී ඇත. මෙහිදී ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය සියයට 53.4 ක් ලෙස ප්‍රමුඛ දායකත්වයක් දැක්වූ අතර මූල්‍ය නොවන ආයතන අංශය සියයට 23.9 ක් සඳහා ද රාජ්‍ය අංශය සියයට 15.1 ක් සඳහා ද මූල්‍ය ආයතන අංශය සියයට 7.6 ක් සඳහා ද දායක වී ඇත. තවද, ප්‍රවාහන සේවා

සහ වෙනත් පෞද්ගලික සේවාවන් සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය සිය ඉහළම දායකත්වය දක්වා ඇති අතර මූල්‍ය නොවන ආයතන අංශය තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු සහ ප්‍රවාහන සේවාවන් සඳහා වැඩි වශයෙන් දායක වනු දක්නට ලැබුණි. මේ අතරතුර දී, මූල්‍ය ආයතන අංශය විසින් මූල්‍ය සහ රක්ෂණ සේවාවන් සඳහා වැඩි වශයෙන් දායක වී ඇති අතර රාජ්‍ය අංශය ප්‍රධාන වශයෙන් රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය සඳහා සිය ඉහළ ම දායකත්වය දක්වා ඇත.

## 2.4 නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටලු

### කෘෂිකර්මාන්තය

**2016 වසරේ දී කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී අත්කර ගත් සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.2 කින් පහත වැටුණි.** විශේෂයෙන්ම වසරේ දෙවන කාර්තුවේ දී පැවැති ගංවතුර සහිත කාලගුණික තත්ත්වය මෙන්ම වරින්වර පැවැති වියළි කාලගුණික තත්ත්වයන් වැනි වසර පුරාම පැවැති අයහපත් කාලගුණික වාතාවරණය කෘෂිකාර්මික කටයුතු අඩාල වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, වී, තේ, රබර් සහ පලතුරු වගාවන්හි එකතු කළ අගය පහත වැටීම කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය පහත වැටීම සඳහා ප්‍රධාන ලෙස හේතු වූ අතරම ධාන්‍ය වගාව, එළවළු වගාව, තෙල් සහිත පලතුරු භෝග වගාව මෙන්ම පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් හි එකතු කළ අගය ද වසර තුළ දී පහත වැටුණි. එසේ වුවද, කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීම යම් පමණකට සමනය කරමින් සත්ත්ව නිෂ්පාදනය, වන වගාව, ධීවර කර්මාන්තය, උක් වගාව සහ වෙනත් පානීය භෝග වගාව වසර තුළ දී හිතකර ලෙස වර්ධනය විය. කෘෂිකාර්මික කටයුතුවල දක්නට ලැබුණු මෙම මන්දගාමිත්වය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි කෘෂිකාර්මික අංශයට අදාළ උප දර්ශක මගින් ද පිළිබිඹු විය. ඒ අනුව, ව්‍යාපාර තත්ත්වය, ඉල්ලුම, නිෂ්පාදනය සහ විකුණුම් යන උප දර්ශකවල වාර්ෂික සාමාන්‍යය එහි කඩඉම් මට්ටමට වඩා පහළ මට්ටමක පැවැතුණි.

### කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

**කෘෂිකාර්මික හා මත්ස්‍ය අංශයේ නිමැවුමෙහි වෙනස්වීම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය, 2015 වසරේ දී වාර්තා වූ සියයට 4.4 ක සමස්ත වර්ධනය හා සැසඳීමේ දී 2016 වසරේ දී සමස්තයක් ලෙස සියයට 2.4 කින් පහත වැටුණි.** කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකයේ උප දර්ශක වූ වී, තේ, රබර්, පොල් සහ අනෙකුත් භෝග (පලතුරු සහ වෙනත් ක්ෂේත්‍ර භෝග) හා සම්බන්ධ දර්ශක පසුගිය වසරට සාපේක්ෂව පහත වැටුණු අතර, අනෙකුත් භෝග උප දර්ශකය යටතේ වූ එළවළු උප අංශය පසුගිය වසරට සාපේක්ෂව ඉහළ ගියේය. වසර තුළ දී පශු සම්පත් අංශයේ ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස වර්ධනය වුව ද, කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය මගින් පෙන්නුම් කෙරෙන ආකාරයට එම අංශයේ වර්ධනය 2015 වසරට වඩා මන්දගාමී විය. පසුගිය වසරේ දී මෙන්ම, 2016 වසරේ දී ද ධීවර කටයුතු සුළු වර්ධනයක් පමණක් පෙන්නුම් කළේය.

**2.3 සංඛ්‍යා සටහන**

**කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක**
**(2007-2010 = 100)**

| අයිතමය | 2015 (අ) | 2016 (ආ) | වර්ධන වේගය (%) | |
|---|---|---|---|---|
| | | | 2014/15 (අ) | 2015/16 (ආ) |
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 127.3 | 124.2 | 4.4 | -2.4 |
| 1. කෘෂිකාර්මික | 121.2 | 116.9 | 5.3 | -3.5 |
| 1.1 කෘෂිකාර්මික භෝග | 117.8 | 111.9 | 4.3 | -5.0 |
| වී | 128.9 | 118.2 | 4.3 | -8.3 |
| තේ | 105.5 | 93.9 | -3.3 | -11.0 |
| රබර් | 66.0 | 59.0 | -32.1 | -10.6 |
| පොල් | 107.9 | 106.3 | 21.6 | -1.5 |
| අනෙකුත් භෝග | 140.7 | 140.8 | 12.3 | 0.1 |
| එළවළු | 136.1 | 141.2 | 0.7 | 3.7 |
| පලතුරු | 152.8 | 145.8 | 33.4 | -4.6 |
| අනෙකුත් ක්ෂේත්‍ර භෝග | 144.6 | 138.5 | 11.6 | -4.2 |
| 1.2 පශු සම්පත් | 147.2 | 154.6 | 11.4 | 5.0 |
| 2. මත්ස්‍ය | 155.9 | 159.1 | 1.4 | 2.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### වී

**වී නිෂ්පාදනය, 2015 වසරේ දී වාර්තා වූ ඉහළම අස්වැන්නෙන් පසු 2016 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 4.4 ක් දක්වා සියයට 8.3 කින් පහත වැටුණි.** අස්වැන්න නෙළා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,010,989 ක් දක්වා සියයට 7.1 කින් පහළ ගිය අතර, 2015 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,428 ක් වූ වී ඵලදාව ද 2016 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,372 ක් දක්වා පහත වැටුණි. මෙය, 2015/16 මහ කන්නය තුළ වී නිෂ්පාදනයේ ඉහළ යෑමේ සහ 2016 යල කන්නය තුළ වී නිෂ්පාදනයේ පහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. 2015/16 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.9 ක් දක්වා පසුගිය මහ කන්නයට වඩා සියයට 0.9 කින් ඉහළ ගියේය. 2015 වසර අග භාගයේ දී පැවති හිතකර

2

**2.4 සංඛ්‍යා සටහන**

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යාන**

| අයිතමය | ඒකකය | 2015 (අ) | | | 2016 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 773 | 481 | 1,254 | 756 | 358 | 1,114 |
| අස්වැන්න නෙළාගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 735 | 476 | 1,211 | 743 | 380 | 1,123 |
| අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 659 | 429 | 1,088 | 667 | 344 | 1,011 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 2,877 | 1,942 | 4,819 | 2,903 | 1,517 | 4,420 |
| | බුසල් දහස් | 137,882 | 93,091 | 230,973 | 139,114 | 72,722 | 211,836 |
| සාමාන්‍ය ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,364 | 4,527 | 4,429 | 4,349 | 4,417 | 4,372 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 3,261 | 2,321 | 5,582 | 3,401 | 2,450 | 5,851 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 286 | - | - | 30 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 409 | - | - | 43 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව


වර්ෂාපතන තත්ත්වයත්, වී වගා කරන ප්‍රධාන ප්‍රදේශවල අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණයෙහි ඉහළ යෑමත් මහ කන්නයේ වී නිෂ්පාදනය ඉහළ යෑමට හේතු විය. 2015/16 මහ කන්නයේ දී අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 667,483 ක් දක්වා සියයට 1.2 කින් සුළු වශයෙන් වර්ධනය විය. කෙසේ වුව ද, වී වගා කරන ප්‍රදේශ කිහිපයක ඇති වූ සුදු පුල්ලි රෝගය සහ කොළ හැකිළීමේ රෝගය හේතුවෙන් 2015/16 මහ කන්නයේ වී ඵලදාව, පෙර වසරේ මහ කන්නයේ වාර්තා කළ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,364 සිට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,349 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් අඩු විය. මේ අතර, වසරේ දෙවන කාර්තුවේ හටගත් ඇඩි කුණාටු තත්ත්වය නිසා ඇති වූ ගංවතුර හා නායයෑම් හේතුවෙන් 2016 යල කන්නයේ වී නිෂ්පාදනය, 2015 යල කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 1.5 ක් දක්වා සියයට 21.9 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මෙම තත්ත්වය වී වගා කරන ප්‍රධාන ප්‍රදේශවල යල කන්නයේ වී වගා කිරීම ප්‍රමාද වීමටත්, නැවත වගා කිරීමේ තත්ත්වයක අවශ්‍යතාවක් ඇති කිරීමටත් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2016 යල කන්නයේ අස්වැන්න නෙළා ගන්නා ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 343,506 ක් දක්වා සියයට 20.0 කින් විශාල ලෙස අඩු විය. 2015 යල කන්නයේ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,527 ක් වූ වී ඵලදාව 2016 යල කන්නයේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,417 දක්වා සියයට 2.4 කින් අඩු විය. 2016 වසර තුල මහ සහ යල කන්න දෙකෙහි දී ම නිෂ්පාදනය කළ වී ප්‍රමාණය සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.8 කට සමාන වූ අතර, එය දළ වශයෙන් මාස 14 ක දේශීය සහල් පරිභෝජන අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**වී සැපයුම ඉහළ යෑමත්, වී මිලදී ගැනීම සඳහා වූ සහතික මිල අඩු කිරීමත් හේතුවෙන් 2016 වසර පළමු භාගයේ දී විවෘත වෙළෙඳපොළෙහි වී මිල ගණන් පහළ මට්ටමක පැවතුණි.** දේශීය වෙළඳපොළ තුළ සහල් මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීමේ අරමුණින්, 2016 අයවැය මගින් යෝජනා කළ පරිදි වී සඳහා වූ සහතික කළ ගැනුම් මිල අඩු කෙරිණි. කීරි සම්බා වී සඳහා සහතික කළ ගැනුම් මිල කිලෝග්‍රෑමයකට රුපියල් 50.00 ක් ලෙස නොවෙනස්ව පැවති අතර, සම්බා වී ප්‍රභේද සඳහා සහතික කළ ගැනුම් මිල කිලෝග්‍රෑමයකට රුපියල් 50.00 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 41.00 ක් දක්වා ද, නාඩු වී කිලෝග්‍රෑමයක සහතික ගැනුම් මිල රුපියල් 45.00 සිට රුපියල් 38.00 ක් දක්වා ද පහත දමන ලදී. කෙසේ වෙතත්, 2016 වසරේ යල කන්නයේ වී නිෂ්පාදනයෙහි සිදු වූ අඩු වීම හේතුවෙන් වී සැපයුම සීමාසහිත වීම නිසා ප්‍රධාන වශයෙන් වී වගා කරන බොහෝ ප්‍රදේශයන්හි සියලුම වී ප්‍රභේදවල මිල 2016 වසර අග භාගයේ දී ක්‍රමයෙන් වැඩි විය. වී මිල ඉහළ යෑමට අනුකූලව, වැඩි වශයෙන් පරිභෝජනය කරන සම්බා සහ නාඩු සහල්වල සාමාන්‍ය සිල්ලර මිල, 2016 වසරේ දී පිළිවෙළින් සියයට 1.7 කින් සහ සියයට 2.0 කින් ඉහළ ගියේය.

**2015 සහ 2016 වසරවල දී සහල් ආනයනය සඳහා පනවන ලද බදු ඉහළ යෑම සහ 2015 වසරේ දී වාර්තා වූ ඉහළ වී අස්වැන්න හේතු කොට ගෙන පැවැති සහල් තොග ඉහළ යෑමට අනුකූලව, 2016 වසරේ දී සහල් ආනයනය ශීඝ්‍ර ලෙස පහත වැටුණි.** සහල් ආනයනය මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ නැංවීමට ප්‍රතිචාරයක් වශයෙන් 2015 දෙවන කාර්තුවෙහි සිට ආනයනය කෙරුණු සහල් ප්‍රමාණය පහළ යෑම ඇරඹුණු අතර, මෙම ප්‍රවණතාවය 2016

**2.2 රූප සටහන**

**සහල්: සැපයුම සහ ඉල්ලුම**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසරේ පළමු මාස දහය තුළ ද පැවතුණි. සහල් ආනයනය තවදුරටත් සීමා කිරීම පිණිස 2016 නොවැම්බර් මස 01 වෙනිදා සිට ආනයනය කරන සහල් කිලෝග්‍රෑමයකට රුපියල් 50.00 ක රේගු බද්දක්, සියයට 15.0 ක එකතු කළ අගය මත බද්දක්, සියයට 7.5 ක වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දක් සහ සියයට 2.0 ක ජාතිය ගොඩනැගීමේ බද්දක් වශයෙන් බදු වර්ග කිහිපයකින් සමන්විත නව බදු ආකෘතියක් හඳුන්වා දෙන ලදී. මෙම කාලපරිච්ඡේදය තුළ සිදු වූ බදු වැඩිවීම්වල ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ දී ආනයනය කරන ලද සහල් ප්‍රමාණය, 2015 වසරේ දී ආනයනය කරන ලද මෙට්‍රික් ටොන් 285,604 සිට මෙට්‍රික් ටොන් 29,524 ක් දක්වා සියයට 89.7 කින් තියුණු ලෙස පහත වැටුණි. කෙසේ වුවත්, 2016 වසර අවසාන වන විට වී සැපයුමෙහි ඇති වූ හිඟය සහල්වල සිල්ලර මිල ඉහළ යෑමට හේතු වූ අතර, රජය විසින් ආනයනය කරන ලද සහල් වෙළඳපොළට සැපයීම මගින් සහල් සැපයුම වැඩි කර සහල් මිල ස්ථායීව පවත්වා ගෙන යෑමට පියවර ගන්නා ලදී. රජය විසින් 2016 වසරේ නොවැම්බර් මස සහල් ආනයනය සඳහා පනවන ලද බදු 2017 ජනවාරි මස 09 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කොට, ඒ වෙනුවට ආනයනය කරන සහල් ප්‍රභේද වන සම්බා, නාඩු සහ රතු සහල් වර්ග මත කිලෝග්‍රෑමයකට රුපියල් 15.00 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙන ලදී. රජය විසින් 2017 ජනවාරි මස 27 වැනි දින සිට සහල් ආනයනය මත වූ මෙම විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 15.00 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 5.00 දක්වා තවදුරටත් අඩු කරන ලදී. සහල් වෙළඳුන් විසින් වෙළඳපොළෙහි කෘත්‍රිම සහල් හිඟයක් මවා පෑම අධෛර්යමත් කිරීම සඳහා මෙම පියවර හඳුන්වා දෙනු ලැබිණි.

### තේ

**ඉල්ලුම් සහ සැපයුම් යන සාධක දෙකෙහිම බලපෑම් හේතුකොටගෙන 2016 වසරේ තේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ ගියේය.** 2015 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 328.8 ක් වූ සමස්ත තේ නිෂ්පාදනය 2016 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 292.6 ක් දක්වා සියයට 11.0 කින් පහත වැටුණි. 2016 වසරේ සමස්ත තේ නිෂ්පාදනය සඳහා සියයට 63.0 ක දායකත්වයක් ලබා දුන් පහතරට තේ නිෂ්පාදනය, කිලෝග්‍රෑම් මිලියන 183.6 දක්වා සියයට 9.3 කින් පහළ වැටුණු අතර, උඩරට සහ මැදරට තේ නිෂ්පාදනය පිළිවෙළින් කිලෝග්‍රෑම් මිලියන 64.4 ක් සහ කිලෝග්‍රෑම් මිලියන 44.5 ක් දක්වා සියයට 14.6 කින් සහ සියයට 12.7 කින් අඩු විය. ඉල්ලුම් සහ සැපයුම් යන සාධක දෙකෙහිම බලපෑම මෙම අඩු වීමට හේතු විය. තේ වගා කරන ප්‍රදේශවල 2016 වසර මුල් කාලයේ පැවති නියං තත්ත්වය, 2016 වසර මැද භාගයේ දී කාලගුණික රටාවෙහි ඇති වූ වෙනස්වීම් සමඟ ඇති වූ අධික වර්ෂාපතනය සහ 2016 වසරේ තුන්වැනි කාර්තුවේ සිට නැවත ඇති වූ දැඩි නියං තත්ත්වය, 2016 වසරේ තේ නිෂ්පාදනයට බලපෑ සැපයුම් අංශයේ සාධක විය. ජාත්‍යන්තර වෙළඳපොළේ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් අඩු වීම සහ ඛනිජ තෙල් හා ස්වාභාවික වායු හා සම්බන්ධ ආදායම අඩු වීම නිසා තේ අපනයනය කරන ප්‍රධාන රටවල ආදායම අඩු වීම ඉල්ලුම් අංශයෙන් තේ නිෂ්පාදනය සඳහා අහිතකර ලෙස බලපෑ කරුණු විය. මේ අතර, සමස්ත නිෂ්පාදනයෙන් සියයට 74.5 ක ඉහළ දායකත්වයක් ලබා දෙමින් කුඩා තේ වතු අංශය 2016 වසරේ දී ද තේ කර්මාන්තයේ ප්‍රධාන අංශය ලෙස අඛණ්ඩව පැවතුණි.

**2016 වසර පුරා කොළඹ තේ වෙන්දේසියේ උඩරට, මැදරට හා පහතරට තේ මිල ගණන් 2015 වසරේ පැවති මිල ගණන්වලට වඩා ඉහළ මට්ටමක පැවතුණි.** ඒ අනුව, කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල, පෙර වසරේ වාර්තා වූ රුපියල් 401.46 හා සැසඳීමේ දී 2016 වසරේ දී රුපියල් 473.15 දක්වා සියයට 17.8 කින් ඉහළ ගියේය. කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිලෙහි ඉහළම වැඩි වීම මැද රට තේ (සියයට 17.6 කින්) වාර්තා කළ අතර, පහත රට තේ මිල (සියයට 17.4 කින්) හා උඩ රට තේ මිල (සියයට 16.5 කින්) ද 2016 වසර තුළ දී ඉහළ ගියේය. 2015 වසරේ දී කිලෝග්‍රෑමයකට එ.ජ.ඩොලර් 4.37 ක් වූ සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) ද 2016 වසරේ දී කිලෝග්‍රෑමයකට එ.ජ.ඩොලර් 4.39 ක් ලෙස සියයට 0.6 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2016 වසරේ දී එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 3.8 කින් අවප්‍රමාණය වීම හේතුවෙන්

2

2015 වසරේ දී රුපියල් 593.08 ක් වූ තේ කිලෝග්‍රෑමයක අපනයන මිලෙහි රුපියල් අගය 2016 වසරේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 639.88 ක් දක්වා සියයට 7.9 කින් ඉහළ යෑම තුළින් දේශීය තේ අපනයනකරුවන්ට වාසිදායක තත්ත්වයක් හිමි විය. කුඩා තේවතු හිමියන්ට තේ දළු කිලෝග්‍රෑමයක් සඳහා ලැබුණු සාමාන්‍ය මිල, 2015 වසරේ දී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 58.80 සිට 2016 වසරේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 68.53 දක්වා ඉහළ ගියේය. විදේශීය වෙළඳපොළ තත්ත්වයන් යහපත් අතට හැරුණ ද, දේශීය තේ සැපයුමෙහි පවතින අනම්‍යතාවය සහ ඉහළ යන නිෂ්පාදන වියදම යනාදිය දේශීය තේ කර්මාන්තයට පූර්ණ ප්‍රතිලාභ අත් කර ගැනීම සම්බන්ධයෙන් 2017 වසරේදී අභියෝගයක් විය හැකිය.

### රබර්

**ප්‍රධාන වශයෙන් කුඩා වතු අංශය වෙත ලැබුණු අඩු මිල ගණන් සඳහා ප්‍රතිචාර දක්වමින් රබර් කිරි කපන බිම් ප්‍රමාණය මෙන්ම කිරි කපන දින ගණන අඩුවීම හේතුවෙන් 2016 වසරේදී රබර් නිෂ්පාදන අඩු විය.** කිලෝග්‍රෑම් මිලියන 79.1 ක් දක්වා සියයට 10.7 කින් පහත වැටුණු 2016 වසරේ රබර් නිෂ්පාදනය, පසුගිය වසර 50 ඇතුළත වාර්තා වූ අවම නිෂ්පාදන ධාරිතාව විය. සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 50.0 කට පමණ දායක වන ෂීට් රබර් නිෂ්පාදනය 2016 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 39.8 ක් දක්වා සියයට 10.4 කින් පහත වැටුණු අතර, ක්‍රේප් රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 15.0 ක් දක්වා සියයට 35.1 ක ඉහළ යෑමක් ද, අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 24.6 ක් දක්වා සියයට 25.6 ක පහළ යෑමක් ද වාර්තා කළේය. පසුගිය වසර ගණනාවක් මුළුල්ලේ ම කිරි කපන බිම් ප්‍රමාණයෙහි අඩු වීමක් දක්නට ලැබුනු අතර, කටු පොල් (Oil Palm) වැනි වාසිදායක කෘෂිකාර්මික භෝග වගා කිරීම සඳහා සහ දේපළ වෙළඳාම් අංශයේ සංවර්ධනය කර විකිණීම සඳහා රබර් වගා කර ඇති බිම් යොදා ගැනීම නිසා එම ඉඩම්වලට ඇති තරගකාරී ඉල්ලුම මේ සඳහා හේතු වී ඇත. සැලකිය යුතු කාලපරිච්ඡේදයක් තුළ රබර් මිල ගණන් අඛණ්ඩව පහත වැටීම හේතුවෙන් උපයා ගැනෙන ආදායම කිරි කැපීමේ පිරිවැය ආවරණය කර ගැනීමට පවා ප්‍රමාණවත් නොවන බැවින් ඵලදායීතාවය අඩු ඉඩම්වල රබර් වගා කිරීම අතහැර දැමීමක් ද සිදුව ඇත. වසර අග භාගයේ දී දේශීය වෙළඳපොළේ රබර් මිලෙහි ඉහළ යෑමක් සිදු වුව ද, රබර් වගා බිම්වල තත්ත්වය පහත වැටීම හේතුවෙන් ඊට ප්‍රතිචාර ලෙස රබර් නිෂ්පාදනයෙහි ක්ෂණික වර්ධනයක් සිදු නොවිණි. කෙසේ වෙතත්, කුඩා ඉඩම්වල රබර් කිරි කැපීම අඩු වීම නිසා 2016 වසරේ රබර් ඵලදාව හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 851 ක් දක්වා සියයට 3.9 කින් ඉහළ ගියේය. පසුගිය වසර කිහිපය තුළ දේශීය කර්මාන්ත අංශයේ නිෂ්පාදනයන් සඳහා යොදා ගැනුණු රබර් ප්‍රමාණයෙහි වර්ධනයක් දැකිය නොහැකි වූ නමුත් 2016 වසරේ දී ඒ සඳහා යොදා ගත් ප්‍රමාණය දේශීය රබර් නිෂ්පාදනයෙන් සියයට 87.2 ක් ලෙස කිලෝග්‍රෑම් මිලියන 69 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2016 වසරේ දී ස්වාභාවික රබර් අපනයනය කිලෝග්‍රෑම් මිලියන 16.2 ක් දක්වා සියයට 55.8 කින් පහත වැටුණු අතර, රබර් නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 180.00 ක් දක්වා සියයට 5.9 කින් ඉහළ ගියේය. චීනය සහ ජපානය වැනි විශාල වශයෙන් රබර් උපයෝගී කර ගන්නා රටවල්වල පැවති විශාල රබර් තොග ප්‍රමාණ හේතුකොටගෙන ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම සහ ඛනිජතෙල් මිල පහළ යෑම හේතුවෙන් ලෝක වෙළඳපොළෙහි මිල ගණන් අඩු වීම නිසා කොළඹ රබර් වෙන්දේසියේ මිල ගණන් පහත වැටුණි. 2016 වසර තුළදී කොළඹ රබර් වෙන්දේසියේ නොම්බර 1 දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) සඳහා වූ සාමාන්‍ය මිල 2015 වසරේ වාර්තා වූ සාමාන්‍ය මිලට වඩා සියයට 3.6 කින් පහළ ගිය අතර එය කිලෝග්‍රෑමයට රුපියල් 239.28 ක් විය. මේ අතර, වසර තුළ දී ලේටෙක්ස් රබර් මිල ද කිලෝග්‍රෑමයකට රුපියල් 262.31 දක්වා සියයට 13.0 කින් පහත වැටුණි. 2015 වසරේ එ.ජ.ඩොලර් 2.2 ක් වූ ස්වභාවික රබර් කිලෝග්‍රෑමයක මිල 2016 වසරේ දී එ.ජ.ඩොලර් 1.6 ක් දක්වා සියයට 30.1 කින් පහත වැටුණි. රබර් මිල ගණන් පහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදකයන්ට උපයා ගත හැකි ලාභය අඩු වීම රබර් වගා කිරීම එතරම් ආකර්ෂණය නොවීමට හේතු වේ.

### පොල්

**පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන සැපයුම වසර තුළ දී සැලකිය යුතු පසුබෑමක් පෙන්නුම් කළේය.** පසුගිය වසරේ වාර්තා කළ නිෂ්පාදනයට සාපේක්ෂව 2016 වසරේ ඇස්තමේන්තුගත පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 3,011 ක් දක්වා සියයට 1.5 කින් පහළ ගියේය. 2016 වසරේ දී ප්‍රධාන පොල් වගා ප්‍රදේශයන්ට ලැබුණු අඩු වර්ෂාපතනය මෙම නිෂ්පාදනයේ පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. පොල් ආශ්‍රිත කර්මාන්තයන්ගෙන් ඇති වූ ඉල්ලුමට අනුකූලව දිසිදි පොල් නිෂ්පාදනය 2015 වසරේ දී වාර්තා කළ සියයට 17.1 ක පහළ යෑමට සාපේක්ෂව පසුගිය දශකයේ ඉහළම දිසිදි පොල් නිෂ්පාදනය වාර්තා කරමින් 2016 වසරේ දී සියයට 22.3 කින් වර්ධනය විය. මේ අතර, ඉහළ ගිය පොල් මිල හේතුවෙන් පොල් තෙල් නිෂ්පාදනය සියයට 7.5 කින් පහළ ගියේය. පෙර වසර හා සැසඳීමේ දී දිසිදි පොල් අපනයනය මෙට්‍රික් ටොන් 72,000 ක් දක්වා සියයට 56.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී.

**පොල් ආශ්‍රිත කර්මාන්තයන්හි අඩු නිෂ්පාදන තත්ත්වයන් හමුවේ ඉල්ලුම හා අපනයන මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම ද, දේශීය පොල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීමට යම් තරමකට දායක විය.** 2016 වසරේ දී පොල් ගෙඩියක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 45.82 ක් දක්වා සියයට 8.3 කින් ඉහළ ගියේය. වසර තුළ දී දිසිඳි පොල් සඳහා වූ දේශීය මිල පෙර වසරේ පැවැති කිලෝග්‍රෑමයකට රුපියල් 290.65 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 265.27 ක් දක්වා සියයට 8.7 කින් අඩු විය. 2015 වසරේ දී පොල් මද ආශ්‍රිත

2

**2.5 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන කෘෂි භෝගවල උපනති**

| අයිතමය | ඒකකය | 2015 (අ) | 2016 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|---|
| | | | | 2014/15 (අ) | 2015/16 (ආ) |
| 1. තේ | | | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 328.8 | 292.6 | -2.7 | -11.0 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 203 | 203 | - | - |
| 1.3 දලු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 195 | 195 | - | - |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 458.84 | 469.24 | -3.4 | 2.3 |
| 1.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 401.46 | 473.15 | -12.5 | 17.9 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 593.08 | 639.88 | -8.7 | 7.9 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,226 | 1,044 | 2.6 | -14.8 |
| 1.7 අලුතින් වගා කිරීම | හෙක්ටයාර | 495 | 115 | 23.4 | -76.8 |
| 1.8 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.8 | 0.7 | -11.1 | -12.5 |
| 2. රබර් | | | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 88.6 | 79.1 | -10.1 | -10.7 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 137 | 136 | 2.2 | -0.7 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 108 | 93 | -2.7 | -13.9 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 170.00 | 180.00 | 6.3 | 5.9 |
| 2.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.1) | රුපියල්/කි.ග්‍රෑ. | 248.17 | 239.28 | -13.2 | -3.6 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 342.03 | 294.33 | -5.7 | -13.9 |
| 2.6 නැවත වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 621 | 591 | -70.4 | -4.9 |
| 2.7 අලුතින් වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 769 | 592 | -46.1 | -23.9 |
| 2.8 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.3 | 0.3 | - | - |
| 3. පොල් | | | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 3,056 | 3,011 | 6.5 | -1.5 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 455 | 466 | 3.2 | 2.4 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 16.39 | 16.70 | 19.9 | 1.9 |
| 3.4 සාමාන්‍ය මිල | | | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 33.88 | 32.13 | 7.5 | -5.2 |
| - අපනයන (නැ.වි.ස.) (උ) | ගෙඩියක් රුපියල් | 54.54 | 41.16 | 39.6 | -24.5 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (ඌ) | හෙක්ටයාර | 4,919 | 5,000 | -15.1 | 1.6 |
| 3.6 අලුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 14,408 | 10,996 | -53.2 | -23.7 |
| 3.7 එකතු කළ අගය, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.8 | 0.7 | - | -12.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දලු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි.
(ඌ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා හරින ලද බීජ පැල සංඛ්‍යාව අනුව අළුතින් වගා කල බිම් ප්‍රමාණය ගණනය කර ඇත. මෙහිදී පොල් බීජ පැල 158 ක් සඳහා හෙක්ටයාර එකක් අනුපාතය යොදා ගෙන ඇත.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2

නිෂ්පාදන සඳහා වූ සාමාන්‍ය අපනයන මිල (නැ.වි.ස.) කිලෝග්‍රෑමයකට රුපියල් 439.94 ක සිට කිලෝග්‍රෑමයකට රුපියල් 328.30 ක් දක්වා සියයට 25.4 කින් පහත වැටුණි. දේශීය වෙළඳපොළේ මිලිලීටර් 750 ක පොල්තෙල් බෝතලයක සාමාන්‍ය සිල්ලර මිල රුපියල් 215.34 ක් දක්වා සියයට 4.3 කින් ඉහළ ගියේය. දිසිඳි පොල්, කොප්පරා හා පොල් තෙල් යන පොල් මද ආශ්‍රිත ප්‍රධාන අපනයන සියයට 38.5 කින් වර්ධනය වූ අතර, මෙම නිෂ්පාදන අපනයනය කිරීමෙන් ලැබෙන ඉපැයීම් සියයට 4.5 කින් වර්ධනය විය. පොල් ගෙඩි අපනයනය සියයට 130.5 කින් ද, පොල් ක්‍රීම් අපනයනය සියයට 27.1 කින් ද, පොල් කිරි අපනයනය සියයට 38.9 කින් ද ඉහළ ගිය අතර, පිටි කළ පොල් කිරි අපනයනය සියයට 32.5 කින් පහළ ගියේය.

### සුළු අපනයන භෝග

**අයහපත් කාලගුණික තත්ත්වයන් හා චක්‍රීය සහ ඍතුමය අස්වනු රටාවන් හේතුවෙන් ඇතැම් සුළු අපනයන භෝග නිෂ්පාදනය පහළ ගියේය.** අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 2015 වසරේ දී සියයට 12.9 ක වර්ධනයක් වාර්තා කළ සුළු අපනයන භෝග නිෂ්පාදනය 2016 වසරේ දී සියයට 9.5 කින් පහත වැටුණි. 2016 වසර තුළ දී කුරුඳු, කරදමුංගු, කෝපි, කොකෝවා සහ සාදික්කා නිෂ්පාදනයේ වර්ධනයක් වාර්තා වූ අතර, ගම්මිරිස්, කරාබු නැටි සහ පුවක් නිෂ්පාදනය පහළ ගියේය. 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 17,707 ක් වූ කුරුඳු නිෂ්පාදනය, 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 18,945 ක් දක්වා සියයට 7.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කොකෝවා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 650 ක් දක්වා සියයට 42.2 කින් ද, සාදික්කා නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 4,155 ක් දක්වා සියයට 51.1 කින් ද, කෝපි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,824 ක් දක්වා සියයට 7.0 කින් ද වර්ධනය විය. මල් සහ එල හටගන්නා කාලවල දී අඛණ්ඩව නියඟය පැවතීම හේතුවෙන් දැඩි බලපෑමකට හසු වූ ගම්මිරිස් නිෂ්පාදනය පසුගිය වසරට සාපේක්ෂව සියයට 34.4 කින් අඩු විය. පැවති ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් ගම්මිරිස්වල ගොවිපළ මිල ගණන් 2016 වසරේ දී සියයට 14.3 කින් ඉහළ ගියේය. මේ අතර, වසරක් හැර වසරක් ඉහළ අස්වැන්නක් ලබා දෙන චක්‍රීය අස්වනු රටාවක් ඇති කරාබු නැටි නිෂ්පාදනය 2016 වසරේ දී සියයට 65.3 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. 2016 වසර තුළ දී කරාබු නැටි හා ගම්මිරිස් අපනයන පරිමා ද පිළිවෙළින් සියයට 71.2 කින් සහ සියයට 52.7 කින් පහළ ගියේය. 2016 වසරේ දී කජු මද නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,192 ක් දක්වා සියයට 4.9 කින් ඉහළ ගිය අතර, කජු වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 20,102 ක් දක්වා සියයට 7.6 කින් ඉහළ ගියේය. කජු වගා කරන ප්‍රදේශවල මල් පිපෙන සමයේ ඇති වූ අනපේක්ෂිත වර්ෂාව මධ්‍යයේ වුව ද කජු මද නිෂ්පාදනයෙහි වර්ධනයක් දක්නට ලැබුණි. නිෂ්පාදනයෙහි ඉහළ යෑමක් සිදුව තිබියදීත් කජුවල ගොවිපළ මිල ගණන් වසර තුළ දී සියයට 5.3 කින් ඉහළ ගියේය.

### වෙනත් ක්ෂේත්‍ර භෝග

**සමස්තයක් වශයෙන් ගත් කළ, වසර තුළ පැවැති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය පහත වැටුණි.** 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 362,452 ක් වූ වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 339,253 ක් දක්වා සියයට 6.4 කින් පහළ ගියේය. ප්‍රධාන වශයෙන්ම, වගා කළ භූමි ප්‍රමාණය අඩු වීම හේතුවෙන් කුරක්කන්, බඩ ඉරිඟු, මුං ඇට, සෝයා බෝංචි, උඳු, මිරිස්, අර්තාපල්, ලොකු ළූණු හා රටකජු නිෂ්පාදනය 2016 වසරේ දී පහළ වැටුණි. මේ අතර, 2015 වසර හා සැසඳීමේ දී යාපනය හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි නිෂ්පාදනය ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී ඉදල් ඉරිඟු, කව්පි, තල හා රතු ළූණු නිෂ්පාදනය ඉහළ ගියේය. වසර තුළ දී ලොකු ළූණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65,223 ක් දක්වා සියයට 26.7 කින් සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙන්ම ජාත්‍යන්තර මිල ගණන් අඩු මට්ටමක පැවතීමේ වාසිදායක තත්වයද හේතුවෙන් ළූණු ආනයනය මෙට්‍රික් ටොන් 215,593 ක් දක්වා සියයට 2.5 කින් වර්ධනය විය. 2016 වසරේ දී අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 95,805 ක් දක්වා සියයට 1.6 කින් පහළ වැටුණු අතර, අර්තාපල් ආනයනය සියයට 4.2 කින් වර්ධනය විය. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගය හේතුවෙන් වගා කරන ලද බිම් ප්‍රමාණය ඉහළ යෑම නිසා අමු ඉඟුරු හා කහ නිෂ්පාදනය ද ඉහළ ගියේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් 2016 වසරේ දී වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර 144,892 ක් දක්වා සියයට 4.6 කින් පහත වැටුණි.

### එළවළු

**2016 වසරේ දී එළවළු සැපයුමෙහි වර්ධනයක් දක්නට ලැබුණි.** 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 1,627,592 ක් වූ එළවළු නිෂ්පාදනය 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 1,648,501 ක් දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2015 ට අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2016 වසරේ යල කන්නයේ එළවළු නිෂ්පාදනය සියයට 10.4 කින් ඉහළ ගිය ද, 2015/16

මහ කන්නයේ එළවළු නිෂ්පාදනය, පැවති නියං සහිත කාලගුණික තත්ත්වය හේතුවෙන් සියයට 4.9 කින් අඩු වීම නිසා වසර තුළ එළවළු නිෂ්පාදනයෙහි මෙම සුළු වර්ධනය දැකිය හැකි විය. 2016 වසර අවසානයේ පැවැති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් යල කන්නයේ වී වගා කටයුතු අසාර්ථක වූ බිම්වල එළවළු වගාව සිදු කිරීම හේතුවෙන් එළවළු වගා කළ මුළු භූමි ප්‍රමාණයේ ඉහළ යෑම, යල කන්නයේ එළවළු නිෂ්පාදනය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. මහ කන්නයේ එළවළු සැපයුම පහළ යෑමට ප්‍රතිචාර දක්වමින් 2016 වසරේ මැයි මාසයේ දී උඩරට හා පහතරට එළවළු දෙවර්ගයේම මිල ගණන් ඉහළ ගියේය. මීට අමතරව, 2016 වසරේ මැයි මාසයේ දී ඇති වූ තද වැසි හා ගංවතුර තත්ත්වයන් හේතුවෙන් සැපයුම් තත්ත්වයන්ට බාධා ඇති වීම හා වගා හානි සිදු වීම එළවළු මිල ගණන් තවදුරටත් ඉහළ යෑමට හේතු විය. මේ අතර, අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් අතරමැදි කන්නයේ එළවළු වගාව ද පහළ ගියේය. එසේ වුව ද, යල කන්නයේ අස්වනු නෙළීම ඇරඹීමත් සමග වෙළඳපොළ එළවළු සැපයුම ඉහළ යෑමෙන් අගෝස්තු මාසයේ සිට එළවළු මිල ගණන් පහත වැටුණි. තව ද, වගා කරන ලද භූමි ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් උතුරු පළාතේ එළවළු සැපයුම සැලකිය යුතු ලෙස වැඩි වූ අතර එය වසර පුරාම එළවළු මිල ගණන් ඉහළ යෑමේ පීඩනය අඩු කිරීමෙහිලා උපකාරී විය. කෙසේ වෙතත්, වසර අවසාන කාලය වන විට සාමාන්‍ය ඍතුමය බලපෑම පෙන්නුම් කරමින් එළවළු මිල ගණන් නැවතත් ඉහළ ගියේය. 2016 වසරේ දී, රුපියල් බිලියන 3.9 ක් වටිනා එළවළු කිලෝග්‍රෑම් මිලියන 21.1 ක් අපනයනය කරන ලදී. ගොවීන් හා පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා, පැළ තවාන්හි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (Good Agricultural Practices - GAP) භාවිතය පිළිබඳ ගොවීන් දැනුම්වත් කිරීම හා භෝග වගාවේ දී හා සැකසීමේ දී වැඩිදියුණු කළ තාක්ෂණය භාවිත කිරීම ප්‍රචලිත කිරීම සඳහා ශක්තිමත් සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම එම අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීම කෙරෙහි උපකාරී වනු ඇත.

### පලතුරු

**අපනයනකරුවන්ගෙන් ඉහළ ඉල්ලුමක් පැවතුණ ද, 2016 වසරේදී පලතුරු නිෂ්පාදනය තවදුරටත් පහළ ගියේය.** පලතුරු නිෂ්පාදනය පෙර වසරේ වාර්තා කළ සියයට 15.6 ක පහළ යෑමෙන් අනතුරුව 2016 වසරේ දී තවදුරටත් සියයට 6.0 කින් පහළ ගියේය. පලතුරු ප්‍රභේද වශයෙන් ගත් කල 2016 වසරේ දී දොඩම්, දෙහි, අඹ, අලිගැටපේර සහ වැල්දොඩම් නිෂ්පාදනය ඉහළ ගිය අතර, කෙසෙල්, ගස්ලබු, අන්නාසි, රඹුටන්, පේර හා කොමඩු නිෂ්පාදනය පහළ ගියේය. ශ්‍රී ලංකාව 2016 වසරේ දී රුපියල් බිලියන 7.3 ක පිරිවැයක් දරමින් පලතුරු මෙට්‍රික් ටොන් 54,107 ක් ආනයනය කළ අතර, එය 2015 වසරේ ආනයනය කළ ප්‍රමාණය හා සැසඳීමේ දී සියයට 19.8 ක ඉහළ යෑමකි. පෙර වසරේ පරිදිම, ඇපල්, දොඩම්, මැන්ඩරීන් හා මිදි මෙම වසරේ දී ප්‍රධාන වශයෙන් ආනයනය කළ පලතුරු වර්ග විය. මේ අතර, 2016 වසරේ දී රුපියල් බිලියන 5.0 ක වටිනාකම ඇති පලතුරු මෙට්‍රික් ටොන් 33,300 ක් අපනයනය කළ අතර, වසර තුළ පලතුරු ආනයනය හා අපනයනය පදනම් කරගත් වෙළඳ හිඟය රුපියල් බිලියන 2.3 ක් විය. දේශීය එළවළු හා පලතුරු සඳහා ඉහළ විදේශ ඉල්ලුමක් පැවතුණ ද, විශාල ප්‍රමාණයන් අඛණ්ඩව සැපයීමට අපොහොසත් වීම එම ඉල්ලුම සපුරාලීම සඳහා ඇති ප්‍රධානතම අභියෝගය වේ. නිෂ්පාදකයන් හා අපනයනකරුවන් අතර සෘජු සම්බන්ධතා ඇති කිරීම සහ වෙළඳ ගිවිසුම් පදනම් කරගත් වගා ක්‍රම තවදුරටත් ශක්තිමත් කිරීම, එළවළු හා පලතුරු අපනයන වෙළඳපොළ වැඩිදියුණු කිරීම සඳහා වැදගත් වේ.

### සීනි

**2016 වසරේ සීනි නිෂ්පාදනය කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය.** 2015 වසරේ දී මෙට්‍රික් ටොන් 55,972 ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වූ සීනි නිෂ්පාදනය, 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 62,048 ක් දක්වා සියයට 10.9 කින් තවදුරටත් වර්ධනය විය. ඉහළ ඵලදාවක් සහිත උක් ප්‍රභේද වගා කිරීම, යෝග්‍ය වාරිමාර්ග පද්ධති සැකසීම හා වගා බිම් නඩත්තු කිරීම සහ බාහිර පාර්ශවයන් විසින් සිදු කරන වගා කටයුතු පුළුල් වීම සීනි නිෂ්පාදනය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් ම දායක විය. ගල්ඔය කර්මාන්තශාලාවේ නිෂ්පාදනය පහළ ගිය ද පැල්වත්ත හා සෙවනගල කර්මාන්තශාලාවන්හි නිෂ්පාදනය ඉහළ යෑම සීනි නිෂ්පාදනයේ ඉහත වර්ධනයට දායක විය. 2016 වසරේ දී පැල්වත්ත කර්මාන්තශාලාවේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 34,188 ක් දක්වා සියයට 23.8 කින් වර්ධනය විය. 2015 වසරේ දී සමස්ත සීනි නිෂ්පාදනයෙන් සියයට 49.3 ක් සඳහා දායක වූ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවේ දායකත්වය 2016 වසරේ දී සියයට 55.1 ක් දක්වා වර්ධනය වෙමින් තවදුරටත් සීනි නිෂ්පාදනයේ ප්‍රමුඛයා විය. සෙවනගල කර්මාන්තශාලාවේ නිෂ්පාදනය 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 17,234 ක් දක්වා සියයට 19.9 කින් වර්ධනය විය. මේ අතර, ගල්ඔය කර්මාන්තශාලාවේ නිෂ්පාදනය 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 10,626 ක් දක්වා සියයට 24.0 කින් අඛණ්ඩව දෙවන වසරටත් පහළ

ගියේය. අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් උක් දඬු ප්‍රමාණවත් නොවීම සහ තත්ත්වයෙන් බාල වීම ගල්ඔය කර්මාන්තශාලාවේ ක්‍රියාකාරිත්වය පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම වර්ධනය සැලකීමේ දී, ඵලදායීතාවය පිළිබඳ දර්ශකයක් වන සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය[1] පෙර වසරේ දී වාර්තා වූ සියයට 7.5 සිට 2016 වසරේ දී සියයට 7.6 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. 2016 වසරේ සීනි නිෂ්පාදනය, රටේ සමස්ත සීනි අවශ්‍යතාවයෙන් සියයට 9.5 ක් සැපිරීමට ප්‍රමාණවත් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඉහළ සීනි ඉල්ලුම හා සීනි ආනයනය මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු මට්ටමක පැවතීම හේතුවෙන් වසර තුළ දී සීනි ආනයනය මෙට්‍රික් ටොන් 651,181 ක් දක්වා සියයට 4.4 කින් ඉහළ ගියේය. බාහිර පාර්ශවයන් උක් වගාව සඳහා යොමු කිරීම තුළින් උක් වගා කිරීම දියුණු කිරීමට ඇති හැකියාව සහ එහි වැදගත්කම හඳුනා ගනිමින්, පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තශාලා විසින් බාහිර පාර්ශවයන් විසින් සිදු කරනු ලබන වගා කටයුතු පුළුල් කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී.

## ධීවර

**2016 වසරේ දී ධීවර කටයුතුවල මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** 2016 වසරේ දී මත්ස්‍ය නිෂ්පාදනය 2015 වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 530,920 ක් දක්වා සියයට 2.1 කින් වර්ධනය විය. වෙරළ හා කළපු ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය යන උප අංශයන්ගෙන් සමන්විත, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 86.0 කට දායකත්වයක් සපයන, මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 456,990 ක් දක්වා සියයට 0.9 කින් සුළු වශයෙන් වර්ධනය විය. වෙරළ ආශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 274,160 ක් දක්වා සියයට 1.9 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 182,830 ක් දක්වා සියයට 0.6 කින් පහළ ගියේය. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයේ ඉතිරි සියයට 14.0 ක් සඳහා දායකත්වය දරන මිරිදිය හා ජලජීවී වගා අංශයේ මත්ස්‍ය නිෂ්පාදනය 2015 වසර හා සැසඳීමේ දී සියයට 9.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මිරිදිය ජලාශවලට මුදාහැරි මත්ස්‍ය පැටවුන් ප්‍රමාණය වැඩි වීම හා ජලජීවී වගා අංශයේ ඇති වූ වැඩිදියුණු වීම, මිරිදිය ධීවර හා ජලජීවී වගා අංශයේ මෙම වර්ධනයට හේතු විය. වසර තුළ දී සමස්ත මත්ස්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 115,693 ක් දක්වා සියයට 3.6 කින් පහළ ගිය අතර, වියලන ලද හෝ

**2.6 සංඛ්‍යා සටහන**

**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙ.ටො.දහස්

| උප අංශය | 2015 | 2016 (අ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|
| | | | 2014/15 | 2015/16 (අ) |
| මුහුදු මත්ස්‍ය | 453 | 457 | -1.4 | 0.9 |
| වෙරළ හා කලපු ආශ්‍රිත | 269 | 274 | -3.5 | 1.9 |
| ගැඹුරු මුහුදු මත්ස්‍ය | 184 | 183 | 1.9 | -0.6 |
| මිරිදිය මත්ස්‍ය | 67 | 74 | -11.2 | 9.9 |
| මිරිදිය ජලාශ | 57 | 58 | -17.1 | 2.4 |
| ජලජීවී වගාව | 3 | 9 | 77.0 | 201.3 |
| ඉස්සන් වගාව | 7 | 6 | 37.7 | -15.0 |
| **එකතුව** | **520** | **531** | **-2.8** | **2.1** |

(අ) තාවකාලික

මූලය: ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ලුණු දමන ලද මත්ස්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 34,978 ක් දක්වා සියයට 5.8 කින් ඉහළ ගියේය. මේ අතර, ටින් මාළු ආනයනය මෙට්‍රික් ටොන් 37,089 ක් දක්වා සියයට 24.3 කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන අපනයන මත යුරෝපා සංගමය විසින් පනවන ලද තහනම 2016 ජුනි මස 21 දා සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ මත්ස්‍ය ප්‍රභේද සඳහා යුරෝපා සංගමයේ රටවලින් වූ ඉල්ලුම පුළුල් විය. ඒ අනුව, 2016 වසරේ දී යුරෝපා සංගමයේ රටවල් වෙත සිදු කරන ලද මත්ස්‍ය අපනයන මෙට්‍රික් ටොන් 2,540 ක් දක්වා සියයට 23.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. නිසි ප්‍රමිතියකින් තොරව ධීවර කටයුතුවල නියැලීම හේතුවෙන් සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 25.0 ක් පමණ අපතේ යන බව ඇස්තමේන්තු කර ඇති අතර, එසේ සිදුවන අපතේ යෑම අවම කිරීමෙහි ලා අවධානය යොමු කිරීම ධීවර කර්මාන්තයේ උපරිම ඵල නෙළා ගැනීම සඳහා ඉතා වැදගත් වේ.

## පශු සම්පත්

**කිරි නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග හේතුවෙන් ජාතික කිරි නිෂ්පාදනය 2016 වසරේ දී ලීටර් මිලියන 384 ක් දක්වා සියයට 2.6 කින් තවදුරටත් ඉහළ ගියේය.** රිදියගම ගොවිපළට ආනයනය කළ ගව දෙනුන්ගෙන් කිරි දෙවීම ආරම්භ වීම, නැවුම් කිරි සඳහා කිරි ගොවීන් වෙත සතුටුදායක මිලක් ලැබීම සහ කිරි නිෂ්පාදන කර්මාන්තශාලාවල ධාරිතාව ඉහළ නැංවීම හේතුවෙන් මහා පරිමාණ කිරි නිෂ්පාදන සමාගම් වෙතින් වූ කිරි ඉල්ලුම ඉහළ යෑම කිරි නිෂ්පාදනය වර්ධනය වීමට ඉවහල් වූ කරුණු ලෙස දැක්විය හැකිය. සමස්ත කිරි නිෂ්පාදනයෙන් සියයට 82.8 ක් වූ එළකිරි නිෂ්පාදනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ලීටර මිලියන 317.9 ක්

---

1 සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය = $\frac{\text{නිෂ්පාදනය කළ සීනි ප්‍රමාණය}}{\text{අඹරන ලද උක් දඬු ප්‍රමාණය}} \times 100$

දක්වා සියයට 4.1 කින් ඉහළ ගිය අතර, මී කිරි නිෂ්පාදනය ලීටර මිලියන 66.1 ක් දක්වා සියයට 4.2 කින් පහළ ගියේය. දේශීය කිරි නිෂ්පාදනය වර්තමාන ජාතික අවශ්‍යතාවයෙන් සියයට 42.0 ක් පමණ සැපයීමට ප්‍රමාණවත් වේ. මේ අතර, කිරි ලබා ගන්නා එළදෙනුන් සංඛ්‍යාව 284,400 ක් දක්වා සියයට 5.6 කින් අඩු වූ අතර, කිරි ලබා ගන්නා මී දෙනුන් සංඛ්‍යාව 83,150 ක් දක්වා සියයට 9.2 කින් අඩු විය. 2015 වසර දක්වා මුළු ගවයින් සංඛ්‍යාව ලබා දී ඇත්තේ ඇස්තමේන්තුගත අගයක් වශයෙනි. නමුත්, 2016 වසරේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පශු සම්පත් සංවර්ධන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මුළු ගව ගහණය පිළිබඳ පුළුල් සමීක්ෂණයක් සිදු කරන ලද අතර, එහිදී රටපුරා කුඩාම සේවා සැපයීමේ ඒකකවලින් ද දත්ත ලබා ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2016 වසරේ ශ්‍රී ලංකාව තුළ සිටින මුළු ගවයින් සංඛ්‍යාවේ සැබෑ අගය පිළිබිඹු කෙරෙන අතර, ගවයන් සංඛ්‍යාවේ වාර්ෂික වෙනස් වීම මගින් පිළිබිඹු කෙරෙනුයේ කලින් පැවති ඇස්තමේන්තුගත සංඛ්‍යාවෙහි සහ වත්මන් ගව ගහණයෙහි සැසඳීමකි. 2016 වසරේ දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි නිෂ්පාදනය ලීටර මිලියන 11.0 සිට ලීටර මිලියන 17.9 ක් දක්වා ඉහළ ගිය අතර, මිල්කෝ (පුද්) සමාගමේ කිරි නිෂ්පාදනය ලීටර මිලියන 70.0 ක් දක්වා සියයට 9.4 කින් වර්ධනය විය. කර්මාන්තශාලාවල නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් ආරම්භ කරන ලද කර්මාන්තශාලා නවීකරණය කිරීමේ කටයුතු අතරින් මිල්කෝ (පුද්) සමාගම සතු පොළොන්නරුව සහ දිගන පිහිටි කර්මාන්තශාලාවල නවීකරණ කටයුතු අවසන් කෙරුණු අතර, අඹේවෙල කර්මාන්තශාලාවේ නවීකරණ කටයුතු 2017 වසරේ පළමු කාර්තුව තුළ දී අවසන් කිරීමට නියමිතය. සත්ත්ව ආහාරවල මිල 2015 වසර හා සැසඳීමේ දී අඩු වීම හේතුවෙන්, ජාතික කිරි නිෂ්පාදනයේ සාමාන්‍ය නිපැයුම් පිරිවැය ලීටරයට රුපියල් 31.99 ක් දක්වා රුපියල් 2.67 කින් පහළ ගිය අතර, සාමාන්‍ය ගොවිපළ මිල ලීටරයකට රුපියල් 64.00 ක් දක්වා රුපියල් 5.00 කින් වැඩි වීම මගින් ගොවීන්ට ඉහළ ආදායමක් ලබා ගත හැකි විය. දේශීය කිරි නිෂ්පාදනය ඉහළ ගොස් තිබියදීත් කිරිපිටි ආනයනය මෙට්‍රික් ටොන් 94,011 ක් දක්වා සියයට 15.0 කින් ඉහළ ගිය අතර, එහි වටිනාකම රුපියල් බිලියන 33.6 ක් විය. කිරි ගව සම්පතෙහි ගුණාත්මකභාවය ඉහළ දැමීම කෙරෙහි රජයේ අවධානය තවදුරටත් යොමු වූ අතර, 2016 වසරේ දී පැටවුන් 16,577 ක් ලියාපදිංචි කරන ලද "වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය" වැනි ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙවැනි ක්‍රියාමාර්ග හරහා ආනයනය කරන කිරිපිටි ප්‍රමාණය අවම කරගත හැකි වන අතර, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට ගැලපෙන පරිදි දේශීය කිරි ගොවිපළවල්වල නිපදවන කිරිවල ගුණාත්මකභාවය වැඩිදියුණු කර ගැනීමට ද හැකි වේ.

**2.7 සංඛ්‍යා සටහන**

**පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යාන**

| උප අංශය | 2015 (අ) | 2016 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|
| | | | 2014/15 (අ) | 2015/16 (ආ) |
| 1. මුළු ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.4 | 1.2 | -8.9 | -14.1 |
| එළගවයන් | 1.1 | 0.9 | -6.9 | -13.1 |
| මීගවයන් | 0.3 | 0.3 | -15.1 | -17.4 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 374.4 | 384.0 | 13.7 | 2.6 |
| එළ කිරි | 305.4 | 317.9 | 15.2 | 4.1 |
| මී කිරි | 69.1 | 66.1 | 7.9 | -4.2 |
| 3. කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) (ඇ) | 33.5 | 36.9 | 14.0 | 10.1 |
| 4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 58.91 | 64.03 | -1.7 | 8.7 |
| 5. බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,899.0 | 2,059.7 | 16.0 | 8.5 |
| 6. කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 164.5 | 173.8 | 13.8 | 5.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සහ මිල්කෝ (පුද්) සමාගමේ නිෂ්පාදිත පමණක් ඇතුළත් වේ.

මූලයන්: ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
මිල්කෝ (පුද්) සමාගම

**කුකුළු මස් සහ බිත්තර නිෂ්පාදනය 2016 වසර තුළ දී වර්ධන ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය.** සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව කුකුළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 173,830 ක් දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. මස් පිණිස බ්‍රොයිලර් සතුන් නිපදවීම සඳහා අවශ්‍ය මාපිය සතුන් (Broiler Parents) ආනයනය සහ බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබා ගැනීමට අවශ්‍ය මාපිය සතුන් (Layer Parents) ආනයනය පිළිවෙළින් සියයට 88.7 කින් සහ 107.7 කින් ඉහළ යෑම, කුකුළු මස් නිෂ්පාදනයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, හම නොගැසූ කුකුළු මස් කිලෝග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය 2015 වසරේ දී වූ රුපියල් 291.16 ක සිට 2016 වසරේ දී රුපියල් 306.74 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2016 වසරේ දී කුකුළු මස් නිෂ්පාදනය ඉහළ ගොස් තිබිය දී වුව ද, කුකුළු මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල පෙර වසරේ පැවැති රුපියල් 507.90 සිට 2016 වසරේ දී රුපියල් 538.56 ක් දක්වා ඉහළ ගියේය. බ්‍රොයිලර් කුකුළු මස් කිලෝග්‍රෑමයක් සඳහා පනවා තිබූ රුපියල් 420.00 ක උපරිම සිල්ලර මිල 2017 මාර්තු 14 දින සිට ඉවත් කරන ලදී. මේ අතර, බිත්තර නිෂ්පාදනය බිලියන 2.0 ක් දක්වා සියයට 8.5 කින් ඉහළ ගිය අතර,

බිත්තර නිෂ්පාදනයේ සාමාන්‍ය පිරිවැය රුපියල් 10.07 සිට රුපියල් 12.41 ක් දක්වා ඉහළ ගියේය. බිත්තරයක සාමාන්‍ය මිල 2015 වසරේ වාර්තා වූ රුපියල් 14.80 ට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් 16.10 ක් දක්වා ඉහළ ගියේය. ඌරු මස් සහ එළු මස් නිෂ්පාදනය පිළිවෙළින් සියයට 1.4 කින් සහ සියයට 3.7 කින්, මෙට්‍රික් ටොන් 7,280 ක් සහ මෙට්‍රික් ටොන් 1,400 ක් දක්වා ඉහළ ගිය අතර, හරක් මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,540 ක් දක්වා සියයට 2.0 කින් අඩු විය. ඌරු මස් කිලෝග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය රුපියල් 264.58 ක් වූ අතර, එළු මස් සහ හරක් මස් සඳහා එම පිරිවැය පිළිවෙළින් රුපියල් 281.15 ක් සහ රුපියල් 357.37 ක් විය. ඌරු මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල සියයට 8.2 කින් ද, එළු මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල සියයට 12.2 කින් ද, හරක් මස් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල සියයට 18.5 කින් ද ඉහළ ගියේය.

## වන සම්පත්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වන ආවරණ ඇස්තමේන්තු සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ වන ආවරණය හෙක්ටයාර 1,951,472 කි.** කෙසේ වුවද, මෙම සමීක්ෂණය සෑම වසර 10 කට ම වරක් පවත්වනු ලබන්නක් වන අතර, වන ආවරණය පිළිබඳව නවතම තොරතුරු ලබා දෙන එම සමීක්ෂණය අවසන් වරට සිදු කර ඇත්තේ 2010 වසරේ දී ය. නීති විරෝධී දැව කැපීම, ජනාවාස ඉදිකිරීම සහ හේන් වගාව හේතුවෙන් ස්වභාවික වන ආවරණ ප්‍රමාණය කාලයත් සමඟ අඩු වී ඇත. එබැවින්, පවතින දියුණුම තාක්ෂණය යොදා ගනිමින් රටෙහි වන ආවරණයේ සිදු වන වෙනස්වීම් තක්සේරු කිරීම සඳහා විධිමත් සමීක්ෂණයක් කෙටි කාලපරිච්ඡේදයන් ඇතුළත දී සිදු කළ යුතුව ඇත. දැව ලබා ගැනීම සඳහා 2015 වසරේ දී හෙළි කළ හෙක්ටයාර 423 ක වන ආවරණය හා සැසඳීමේ දී 2016 වසරේ දී හෙක්ටයාර 781 ක වන ආවරණයක් ඒ සඳහා හෙළි කර ඇති අතර කඳු මුදුන් වගාව, සාරවත් වගාව සහ ස්වාරක්ෂක කලාප වගාව යටතේ හෙක්ටයාර 100 ක් නැවත වගා කර ඇත. “වනහරණය සහ වනහායනය මගින් සිදු වන කාබන් විමෝචනය අඩු කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ වැඩසටහන” (UN-REDD) 2016 වසරේදී ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ අතර, REDD++[2] වැඩසටහන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වූ උපායමාර්ගික වැඩසැලැස්ම සකස් කිරීමට ද, ශ්‍රී ලංකාව සඳහා වන ආවරණ සංගණන තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට ද, ජාතික වන අධීක්ෂණ පද්ධතිය නිර්මාණයට හා එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ වූ සම්මුති රාමුව සඳහා ඉදිරිපත් කිරීමට ජාතික වන සංරක්ෂණ විමර්ශන පරිමාණය නිර්මාණය කිරීමට ද එමගින් සහයෝගය ලබා දෙයි. 2012 වසරේ සිට ක්‍රියාත්මක වන ප්‍රජා සහභාගිත්ව වන වගා වැඩසටහන 2016 වසරේ දී ද ක්‍රියාත්මක වූ අතර, නිපුණතා සංවර්ධනය සඳහා පුහුණුව ලබා දීම හා සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය උපකරණ ලබා දීම ඒ යටතේ සිදු කෙරුණි. 2016 වසරේ දී මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 29.7 ක් වූ ශ්‍රී ලංකාවේ වන ආවරණය 2019 වන විට සියයට 32.0 ක් දක්වා වැඩි කිරීමේ දැක්මක් සහිතව 2014 දී ආරම්භ කරන ලද වන ආවරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හානි වූ වනගහණය ප්‍රතිසංස්කරණය කිරීම හා වන ආවරණය රැක ගැනීම ඉලක්ක කරගත් කටයුතු සිදු කරන ලදී. මේ අතර, පෞද්ගලික අංශය විසින් සිදු කරන වනාන්තර නැවත වගා කිරීමේ වැඩසටහන යටතේ 2016 වසරේ දී පෞද්ගලික අංශය විසින් සිදු කරන ලද වාණිජ මට්ටමින් වන රෝපණය හෙක්ටයාර 413 ක් විය.

## කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**2016-2018 කාලපරිච්ඡේදය සඳහා වන රජයේ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන විවිධ ඉලක්ක රැසක් කෙරෙහි අවධානය යොමු කරයි.** මේ සඳහා භෝග විවිධාංගීකරණය හා ඵලදායීතාවය වැඩිදියුණු කිරීම තුළින් වසර 2018 වන විට ශ්‍රී ලංකාව බඩ ඉරිඟු, සෝයා බෝංචි, මිරිස්, ළූණු හා අර්තාපල් යන භෝගයන්ගෙන් ස්වයංපෝෂිත කිරීමත්, සහනාධාර මත පදනම් වූ ගොවිතැන් කටයුතු වසර 2020 වන විට කෘෂි ව්‍යාපාර බවට ක්‍රමිකව පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීමත් ඇතුළත් වේ. තවද, ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන මගින් ආහාර සුරක්ෂිතතාවය සාක්ෂාත් කර ගැනීම, ගොවීන් සඳහා තිරසාර හා ඉහළ ආදායම් හා වේතන මට්ටමක් තහවුරු කිරීම සඳහා කෘෂි නිෂ්පාදන සඳහා ඉහළ මිලක් ලබා දීම සහ දේශීය හා විදේශීය තරගකාරී වෙළඳපොළ සඳහා අඛණ්ඩ ප්‍රවේශයක් ලබා දීම කෙරෙහි ද අවධානය යොමු කරයි. මීට අමතරව, මෙම වැඩසටහන යටතේ ගොවිපළ යාන්ත්‍රීකරණය, වගා කරන භූමි ප්‍රමාණය වැඩි කිරීම, නිෂ්පාදන හුවමාරුවේ දී සිදුවන නාස්තිය අවම කිරීම හා පරිසර සංරක්ෂණය තහවුරු කිරීම, කාර්යක්ෂම ගොවිපළ කළමනාකරණ ශිල්පක්‍රම හඳුන්වා දීම හා ඉහළ අස්වැන්නක් ලබා දෙන බීජ භාවිතය සහ වැඩිදියුණු කරන ලද ජල කළමනාකරණය කෙරෙහි යොමු වීම ද ඉලක්ක කෙරෙයි. ඒ අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගෙවතු

2 වන ගහනය සහ වන හායනය මගින් සිදු වන කාබන් විමෝචනය අඩු කිරීම හා කාබන් සංචිත, ජෛව කොටස් අඩංගු පස හෝ ඛනිජ පස, වනාන්තරයන්ගෙන් පිටත පිහිටි වෘක්ෂලතා, කෘෂි වනාන්තර, වගාවන් හෝ ස්වභාවික වනාන්තර කෙරෙහි බලපාන්නා වූ සියලුම භූමි වෙනස්වීම් අඩු කිරීම පිළිබඳ වැඩසටහන.

**2.8 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආහාර ද්‍රව්‍යන්ගේ ආහාර ශේෂ පත්‍රය**

| | අයිතමය | ඒකකය | 2010 | | | 2015 | | | 2016 (අ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒකපුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ.) |
| 1. | සහල් (ආ) | මෙ.ටො.දහස් | 3,011 | 126 | 152 | 3,373 | 286 | 175 | 3,094 | 30 | 147 |
| 2. | ඉරිඟු | මෙ.ටො.දහස් | 162 | 16 | 9 | 261 | 79 | 16 | 244 | 51 | 14 |
| 3. | තිරිඟු | මෙ.ටො.දහස් | - | 1,051 | 51 | - | 1,208 | 58 | - | 948 | 46 |
| 4. | ලොකු ළූණු | මෙ.ටො.දහස් | 59 | 158 | 10 | 89 | 210 | 14 | 65 | 216 | 13 |
| 5. | සීනි | මෙ.ටො.දහස් | 31 | 548 | 28 | 56 | 624 | 32 | 62 | 651 | 34 |
| 6. | අර්තාපල් | මෙ.ටො.දහස් | 52 | 130 | 9 | 97 | 142 | 11 | 96 | 148 | 12 |
| 7. | මාළු | මෙ.ටො.දහස් | 385 | 14 | 19 | 520 | 34 | 26 | 531 | 39 | 27 |
| 8. | එළකිරි | ලීටර් මිලියන | 192 | - | 9 | 305 | - | 15 | 318 | - | 15 |
| 9. | පොල්තෙල් | මෙ.ටො.දහස් | 65 | 3 | 3 | 53 | 6 | 3 | 49 | 3 | 2 |

(අ) තාවකාලික
(ආ) වී මෙට්‍රික් ටොන් 1 ක්, සහල් මෙට්‍රික් ටොන් 0.7 කට සමාන වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

500,000 ක් සංවර්ධනය කිරීමේ ඉලක්කය ඇතිව ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහනක් 2016 වසරේ දී ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන ගෘහ ඒකකයන්ගේ ආහාර හා පෝෂණ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා පමණක් නොව රටේ සමස්ත ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට ද උපකාරී වනු ඇත. රජය විසින් කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් ආහාර සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම හා පාරිසරික තිරසාර බව තහවුරු කිරීම සඳහා පියවර රැසක් ගෙන ඇති අතර, හුදෙක් ආහාර සුරක්ෂිතතාවය සාක්ෂාත් කර ගැනීම කෙරෙහි පමණක් අවධානය යොමු කිරීම වෙනුවට සියලුම ආහාර කාණ්ඩයන් හි ඵලදායීතාවය ඉහළ නැංවීමෙහි ලා පුළුල් ප්‍රවේශයක් අනුගමනය කිරීම අවශ්‍ය වේ.

**රජය විසින් වී නිෂ්පාදනය ඉහළ නැංවීම සහ වී මිල ගණන් ස්ථාවර කිරීම සඳහා පියවර රැසක් හඳුන්වා දෙන ලදී.** අධික පොහොර භාවිතය හේතුවෙන් ඇති වන සෞඛ්‍ය සහ ජල දූෂණය වැනි පාරිසරික ගැටලු අවම කිරීම සඳහා අතිශයින් විෂ සහිත කෘෂි රසායන කෘෂිකාර්මික අංශය තුළ භාවිත කිරීම වැළැක්වීමේ අරමුණින් රජය විසින් "යහපත් කෘෂිකර්මාන්තයක් - සෞඛ්‍ය සම්පන්න ජනතාවක් - වස විස නැති රටක්" නමින් ජාතික වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම තුන් අවුරුදු වැඩසටහන මගින් සාම්ප්‍රදායික වී ප්‍රභේද භාවිතය ඉහළ නැංවීම (2016-2019 කාලපරිච්ඡේදය තුළ දී සියයට 30.0 ක් දක්වා), රසායනික පොහොර හා පලිබෝධ නාශක භාවිතය ක්‍රමයෙන් ඉවත් කිරීම සහ කාබනික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම පිළිබඳව අවධානය යොමු කරනු ඇත. වී අලෙවි මණ්ඩලය 2014/15 මහ කන්නයේ දී මිලදී ගත් වී මෙට්‍රික් ටොන් 160,000 හා සසඳන විට 2015/16 මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 131,981 ක් මිලදී ගත් අතර, 2015 යල කන්නයේ දී මිලදී ගත් මෙට්‍රික් ටොන් 175,270 ට සාපේක්ෂව 2016 වසරේ යල කන්නයේ දී වෙළඳපොළෙන් මිලදී ගත හැකි වූයේ වී මෙට්‍රික් ටොන් 25,447 ක් පමණි. එය 2016 වසරේ යල කන්නයේ දී මිලදී ගත් ප්‍රමාණය, මිලදී ගැනීමට ඉලක්ක කළ පරිමාවෙන් සියයට 21.2 ක් විය. වී අස්වනු අඩු වීමට අමතරව, පෞද්ගලික අංශයේ වී මෝල් හිමියන් විසින් ඉදිරියේ දී වී මිල ඉහළ යනු ඇතැයි වන අපේක්ෂාවෙන් ගොවීන්ගෙන් වැඩි මිලට වී තොග මිලදී ගැනීම මෙයට හේතු විය. නිසි අවස්ථාවේ දී වී මිලදී ගැනීමට හා නිදහස් කිරීමට කටයුතු කිරීම මගින් වී මිලදී ගැනීමේ වැඩසටහන සංශෝධනය කිරීම අවශ්‍ය වේ. එමගින් ගොවීන්, පාරිභෝගිකයන් හා වී අලෙවි මණ්ඩලය යන සියලු පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට හැකි වනු ඇත. මේ අතර, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් නියං තත්ත්වයන්ට හා ගංවතුරට ඔරොත්තු දෙන ආකාරයේ වැඩිදියුණු කළ සහ සියයට 20.0 කින් පමණ වැඩි ඵලදාවක් ලබා දෙන නව කෙටිකාලීන දෙමුහුන් සහල් විශේෂ කිහිපයක් හඳුන්වා දෙන ලදී. තවද, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් වී වැපිරීමේ දී ශ්‍රම පිරිවැය හා බිත්තර වී අවශ්‍යතාවය සැලකිය යුතු ලෙස අඩු කරන වැඩිදියුණු කරන ලද ක්‍රමයක් (පැරෂුට් ක්‍රමය) හඳුන්වා දෙන ලදී.

**තේ කර්මාන්තයේ ඵලදායීතාව, තරගකාරීත්වය හා තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහ ප්‍රශස්ථ භාවිතයන් වැනි සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි 2016 වසරේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ පර්යේෂණ ආයතනයේ සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ අවධානය**

2

තවදුරටත් යොමු කරන ලදී. “ශ්‍රී ලංකාව තුළ අසුරන ලද සුපිරිසිදු සිලෝන් තේ” යන වෙළඳ නාමය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ජාත්‍යන්තර තේ වෙළඳපොළවල ශ්‍රී ලංකා තේ ප්‍රචලිත කිරීමට උපායමාර්ගික අලෙවිකරණ කටයුතු සිදු කරන ලද අතර, ජාත්‍යන්තර වෙළඳ සල්පිල් සහ අලෙවි ප්‍රදර්ශනවලට ද සහභාගි විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්තශාලා සහ ගබඩා සඳහා යහපත් නිෂ්පාදන ක්‍රමවේද (Good Manufacturing Practices - GMP) පිළිබඳ තත්ත්ව සහතික ලබා දීම සඳහා ඇගයීමේ කටයුතු ක්‍රියාවට නංවන ලද අතර, තේ කර්මාන්තශාලා උසස් තත්ත්වයකට පත් කිරීම සඳහා යහපත් නිෂ්පාදන ක්‍රමවේද පිළිබඳ තක්සේරුවක් ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන්, නියාමන කටයුතු හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම ආදිය ක්‍රියාත්මක කිරීම හරහා පසු අස්වනු හානිය අවම කර ගනිමින් ඉහළ තත්ත්වයෙන් යුතු තේ දලු සාමාන්‍යය සියයට 33.0 ක මට්ටමේ සිට සියයට 60.0 ක මට්ටම දක්වා නැංවීම අරමුණු කර ගත් "B Leaf 60" වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. ආහාර නිෂ්පාදනයේ දී ඇති විය හැකි සෞඛ්‍යයට අහිතකර තත්ත්වය සූක්ෂමව හඳුනා ගෙන එවන් තත්ත්ව අවම කර ගැනීම සඳහා ක්‍රමවේද අනුගමනය කිරීමට අදාළ උපද්‍රව විශ්ලේෂණය හා අවදානම් පාලනය කිරීමේ සහතික (HACCP) ලබා ගැනීම කර්මාන්තශාලා විසින් අඛණ්ඩව සිදු කරන ලද අතර, 2016 වර්ෂයේ දී කර්මාන්තශාලා 40 ක් මෙම සහතිකය ලබා ගෙන ඇත. තේ කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා සහනාධාර ලබා දීමේ වැඩසටහන යටතේ කර්මාන්තශාලා 21 ක් නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 26.1 ක් ලබා දෙන ලදී. තේ වගාව සහ නිෂ්පාදනය පිළිබඳ නව තාක්ෂණය හඳුන්වා දෙන සහ ව්‍යාප්ත කරන ජාතික ආයතනය වන ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් එහි 2013-2017 උපායමාර්ගික සැලැස්මට අනුව තේ වගාවේ උන්නතිය සඳහා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ද, ව්‍යාප්ති සේවා ලබා දීමේ කටයුතු ද සිදු කරන ලදී. තේ වගා සංවර්ධනය යටතේ දේශගුණික විපර්යාස හා කොළ කොඩවීමේ රෝගය වැනි අහිතකර තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඇති සහ තේ වගා කරන ප්‍රදේශ සියල්ලටම පාහේ අනුවර්තනය වීමේ හැකියාව ඇති TRI 5000, නමින් නව තේ රිකිලි ප්‍රභේදයක් හඳුන්වා දෙන ලදී. තේ නැවත වගා කිරීමේ දී පසෙහි තත්ත්වය පිළිබඳ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා පසෙහි ගුණාත්මකභාවය පිළිබඳ දර්ශකය මගින් තක්සේරුවක් ලබා ගැනීමට පසෙහි සාරවත් බව කළමනාකරණය යටතේ පියවර ගැනුණි. වගාවට සිදු වන හානි මෙන්ම, සෞඛ්‍ය, ආරක්ෂක සහ පාරිසරික ගැටලු අවම කර ගැනීම සඳහා භෝග කළමනාකරණ සහ ආරක්ෂණ ප්‍රවේශයන් හඳුන්වා දෙන ලදී. ශ්‍රම ඵලදායීතාව ඉහළ නැංවීමට ද, තේ කර්මාන්තයෙහි තිරසාර බව සහතික කිරීමට ද පියවරක් වශයෙන් කුඩා තේ වතු හිමියන් වෙත තේ දලු නෙලීමේ යාන්ත්‍රික උපකරණ හඳුන්වා දෙන ලදී. පර්යේෂණ මට්ටමින් කාබනිකව වගාවන් සිදු කළ ඉඩම් කට්ටි හරහා තිරසාර වගා ක්‍රමවලට යොමු කරවීම ද තවදුරටත් සිදු කෙරුණි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ ඒකාබද්ධව නැවත වගාව හා නව වගාව සහ භෝග යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ සහනාධාර ක්‍රමය ක්‍රියාවට නැංවීය. මෙම සහනාධාර ක්‍රමය යටතේ 2016 වසර තුළ රුපියල් මිලියන 48.3 ක වියදමින් හෙක්ටයාර 108 ක් අලුතින් වගා කෙරුණු අතර, රුපියල් මිලියන 484 ක වියදමින් හෙක්ටයාර 741 ක් පමණ නැවත වගා කරන ලදී. ජාතික පොහොර සහනාධාර ක්‍රමය යටතේ පර්චස් 20 ට වැඩි සහ හෙක්ටයාරයකට අඩු බිම්වල තේ වගා කර ඇති කුඩා තේ වතු හිමියන්ට හෙක්ටයාරයකට රුපියල් 15,000.00 බැගින් ලබා දීම කුඩා තේ වතු සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ, 2016 වර්ෂය වෙනුවෙන් තේ වගා කරන ලද හෙක්ටයාර 83,864 ක් සඳහා රුපියල් බිලියන 1.3 ක මුදලක් ප්‍රතිලාභීන් 204,554 ක් අතරේ බෙදා දෙන ලදී.

**රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ රබර් පර්යේෂණ ආයතනය මගින් රබර් ක්ෂේත්‍රයෙහි ඵලදායීතාව ඉහළ නංවා, දේශීය රබර් නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය නව ව්‍යාපාර අවස්ථා වැඩිදියුණු කර ගනිමින්, ලෝක වෙළඳපොළෙහි රබර් මිල වෙනස් වීම නිසා ඇතිවන බලපෑම අවම කරගනිමින් ඉදිරියට යෑම සඳහා සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කරන ලදී.** මේ වන විට මෙට්‍රික් ටොන් 79,100 ක් වන දේශීය රබර් නිෂ්පාදනය 2020 වසර වන විට මෙට්‍රික් ටොන් 200,000 දක්වා වැඩි කර ගැනීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රමෝපාය සැලැස්ම තුළින් අවධානය යොමු කෙරුණි. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීම සහ ඵලදායිතාවය ඉහළ නැංවීම, එම ඉලක්කය කරා ළඟාවීම සඳහා 2016 වසරේ දී ගත් ප්‍රධාන උපායමාර්ගය විය. කුඩා වතු හිමියන්ට රබර් නැවත වගාව සහ අලුතින් වගා කිරීම සඳහා ලබාදෙන සහනාධාර ක්‍රමය 2016 වසරේ දී ද ක්‍රියාත්මක වූ අතර, ඒ හරහා හෙක්ටයාර 538 ක් නැවත වගා කිරීම සඳහා රුපියල් මිලියන 193.0 ක් ද, හෙක්ටයාර 592.5 ක් අලුතින් වගා කිරීම සඳහා රුපියල් මිලියන 179.9 ක් ද වසර තුළ දී වැය කරන ලදී. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ අරමුණින් අම්පාර, මුලතිව් සහ වවුනියාව යන

දිස්ත්‍රික්ක හඳුනා ගෙන ඇත. ඒ අනුව, වසර තුළ දී අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 212.6 ක අලුතින් රබර් වගා කෙරුණි. 2016 වසරේ මැයි මස සිට රබර් වගාව සඳහා පොහොර සහනාධාර ලබා දීමේ වැඩපිළිවෙලක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලද අතර, එමගින් රුපියල් මිලියන 91.1 ක මුදලක් ප්‍රතිලාභීන් 38,472 කට ලබා දී ඇත. ලෝක වෙළඳපොළෙහි රබර් මිල ස්ථායි මට්ටමක පවත්වාගෙන යෑමට අවශ්‍ය නිර්දේශ ලබාදීමට ස්වාභාවික රබර් නිපදවන රටවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් සංවිධානය මගින් විශේෂඥ කමිටුවක් පිහිටුවා ඇත. රබර් කර්මාන්තයේ සංවර්ධනය සඳහා රබර් පර්යේෂණ ආයතනය මගින් ද 2016 වසරේ දී පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කෙරුණි. අමු රබර් සඳහා අගය එකතු කිරීම ප්‍රවර්ධනය සහ අඩු තීව්‍රතාවයක් යටතේ කිරි කැපීම, අතුරු භෝග වගාව මගින් ආදායම වැඩි කර ගැනීම වැනි ක්‍රම තුළින් අමු රබර් නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම හා ප්‍රජා සහභාගිත්ව වන වගා වැඩසටහන සඳහා රබර් වගාව ද ඇතුළත් කිරීම, පහත වැටෙන රබර් මිල හමුවේ රබර් ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා රබර් පර්යේෂණ ආයතනය විසින් ගන්නා ලද ප්‍රධාන තීරණ අතර විය. වසර තුළ දී සිදු කරන ලද පර්යේෂණ අතර තවාන් රබර් පැළ සඳහා සමස්ත පොහොර භාවිතය අවම කිරීම සඳහා මන්දගාමී ලෙස පසට මුදා හැරෙන පොහොර වර්ග හඳුනා ගැනීම, කාබනික හා කාබනික නොවන පොහොර මිශ්‍රණයක් භාවිත කරමින් තිරසාර ඵලදාවක් සඳහා රබර් වගා කළ බිම්වල පසේ සාරවත් බව ප්‍රවර්ධනය කිරීම, කුඩා වතුහිමියන් අතර ඉහළ ඵලදාවක් ලබාදෙන ක්ලෝන ප්‍රචලිත කිරීම, රෝග ප්‍රතිරෝධී රබර් ක්ලෝන හඳුනා ගැනීම සහ පරිසර හිතකාමී කෘෂි කළමනාකරණ භාවිතයන් හඳුන්වා දීම ප්‍රධාන විය. "තුරු සවිය" සමිති හා සම්බන්ධ කුඩා රබර් වතු හිමියන් උසස් තත්ත්වයේ ෂීට් රබර් නිෂ්පාදනය පිළිබඳ පුහුණු කිරීම සිදු කෙරුණු අතර, රබර් පර්යේෂණ ආයතනය මගින් දක්වා ඇති ප්‍රමිතීන්ට අනුව උසස් තත්ත්වයේ ෂීට් රබර් ලබාගැනීමේ අපේක්ෂාවෙන් යන්ත්‍ර හා උපකරණ බෙදා දෙන ලදි.

**පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් පර්යේෂණ ආයතනය සහ පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් ගසෙහි සහ පොල් වගා කළ ඉඩම්වල ඵලදායීතාවය නැංවීමටත්, පොල් වගාව ව්‍යාප්ත කිරීම හා රෝග ප්‍රතිරෝධී බීජ පැළ නිපදවීමට අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීමටත්, විවිධ ආකාරවලින් පොල් අපනයනය ප්‍රවර්ධනය කිරීමටත් අවධානය යොමු කරන ලදී.** 2016 වසර තුළ දී පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පොල් නිෂ්පාදනය වැඩි කිරීමට හා පොල් ඉඩම්වල ඵලදායීතාව වැඩි කිරීමට උපායමාර්ගික සැලසුම් දියත් කරන ලදී. පොල් වගා සඳහා පොහොර සැපයීම තුළින් පොල් ගසෙහි ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සහනාධාර වැඩසටහන් ආරම්භ කෙරුණු අතර, පොල් ලෙලි වළවල් ස්ථාපිත කිරීම හා පාංශු සංරක්ෂණ වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කිරීම, අඩු වියදම් නළ මගින් ජල සම්පාදනය ක්‍රියාවට නැංවීම, පසෙහි තෙතමනය පාලනය සහ අතුරු භෝග වගා කිරීම ආදිය ද ක්‍රියාත්මක කෙරිණි. පොල් පර්යේෂණ ආයතනය, පොල් සංවර්ධන අධිකාරිය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය එක්ව ක්ෂේත්‍රයේ වර්ධනය නිරීක්ෂණය කළ අතර, පොල් ගෙඩි අපනයන ප්‍රවර්ධනය, පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසිය ක්‍රමානුකූලත්වයට පත් කිරීම සහ ආනයනය කරන ආහාරයට ගන්නා තෙල් වර්ගවලට පනවන තීරු බදු ඉහළ නැංවීම ඇතුළු ප්‍රතිපත්තිමය නිර්දේශ ද ලබා දෙන ලදී. පොල් පර්යේෂණ ආයතනය විසින් ආරක්ෂිත කලාප පවත්වාගෙන යෑම මගින් සහ පොල් වගා කිරීමේ මණ්ඩලයෙන් වැලිගම ප්‍රදේශයේ ඉඩම් ලබා ගෙන වැලිගම කොළ මැලවීමේ හා අතු හැකිළීමේ රෝගයට ඔරොත්තු දෙන බීජ පැළ නිපදවීම ආරම්භ කරන ලදී. ප්‍රජාමූලික සංවිධාන ලෙස කුඩා පොල්වතු හිමියන් ඒකරාශී කිරීමට "කප්රුක" වැඩසටහන ශක්තිමත් කරන ලද අතර, එමගින් ඔවුන් ව්‍යාප්ති සේවා වැඩසටහන් හා සම්බන්ධ කර ගැනීමටත්, භූමියෙහි ඵලදායීතාව ඉහළ නංවා ගැනීමටත්, රෝග හා පළිබෝධ පාලන වැඩසටහන් සහ අතුරු භෝග වගාවන් හා සත්ත්ව පාලනය තුළින් ආදර්ශ පොල් වගාවන් ස්ථාපිත කිරීමටත් පියවර ගැනුණි. දිසිදි පොල් නිෂ්පාදනය සඳහා නව කර්මාන්තශාලා දෙකක් ස්ථාපනය කිරීමට ද අනුමැතිය ලබා දී තිබේ. කොහු මෝල් හිමියන් GMP ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබා ගැනීම සඳහා දිරිමත් කෙරුණු අතර, පොල් කර්මාන්තය වඩාත් ලාභදායී සහ ආකර්ෂණීය මට්ටමකට පත් කිරීමට, 2016 වසරේ දී නව වෙළඳපොළ අවස්ථා පිළිබඳව ද සොයා බලන ලදී.

**ශ්‍රී ලංකාව වාණිජ මට්ටමින් සීනි නිෂ්පාදනය කිරීම දශක කිහිපයකට පෙර ආරම්භ කළ ද, එම කර්මාන්තය මේ වන විට ද ව්‍යුහාත්මක ගැටලු රැසක් හමුවේ පීඩාවට පත්ව ඇත.** ශ්‍රී ලංකාව සීනි කර්මාන්තය සඳහා යෝග්‍ය වටපිටාවක් නිර්මාණය කිරීමට තවමත් සමත්ව නොමැති අතර, එම කර්මාන්තයේ සංවර්ධනය සඳහා හිතකර නෛතික, ආයතනික හා නියාමන රාමුවක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය වේ. අඩු උක් අස්වැන්න හා උක් දඬු හිඟතාවය, ඉහළ නිෂ්පාදන පිරිවැය, කාලගුණික බාධා, සීනි ලබා ගැනීමේ අනුපාතය අඩු වීම හා කම්කරු ගැටලු මෙම කර්මාන්තය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි. රජය විසින් මෙම ගැටලු සැලකිල්ලට ගනිමින් උක් වගා කිරීමේ හා සැකසීමේ කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා

2

උක් පර්යේෂණ ආයතනය හා ඉන්දියාවේ වසංදදා සීනි ආයතනය (Vasantdada Sugar Institute) අතර විද්‍යාත්මක සහයෝගීතා වැඩසටහනක් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. මේ අතර, උක් පර්යේෂණ ආයතනය 2016 වසරේ දී නව උක් ප්‍රභේද පහක් වාණිජ මට්ටමේ පරීක්ෂා කිරීම් සඳහා හඳුනා ගන්නා ලදී. රජය විසින් කන්තලේ සීනි කර්මාන්ත ශාලාව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) යටතේ නැවත ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලදී. දේශීය ගොවීන් උක් වගාව සඳහා දිරිමත් කිරීම සඳහා 2017 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි උක් මෙට්‍රික් ටොන් එකක් සඳහා රුපියල් 5,000.00 ක අවම ගැනුම් මිලක් පැනවීමට 2017 අයවැයෙන් යෝජනා වූ අතර මිල උච්චාවචනය වීම, පලිබෝධක හා වන අලි මගින් සිදු වන වගා හානි පදනම් කර ගනිමින් පැන නැගිය හැකි අහිතකර බලපෑම්වලින් උක් ගොවීන් ආරක්ෂා කර ගැනීමට අරමුදලක් පිහිටුවීමට ද ඉන් යෝජනා කරන ලදී.

**වසර තුළ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන රාජ්‍ය ප්‍රතිපත්ති අනුව යමින් දේශීය කෘෂිකර්මාන්තය නැංවීමෙහිලා වැඩසටහන් රැසක් තවදුරටත් ක්‍රියාවට නංවන ලදී.** සහල් පර්යේෂණ ආයතනය හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 4.5-5.0 ක් අතර ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි පලිබෝධ හා රෝග සඳහා ඉහළ ප්‍රතිරෝධීතාවයක් දක්වන BG 252, LD 253 හා BG 374 යන සහල් ප්‍රභේද හඳුන්වා දෙන ලදී. රසායනික ද්‍රව්‍ය මගින් පළිබෝධ පාලනය වියදම් අධික මෙන්ම පරිසර දූෂණයට හේතු වන බැවින් පළිබෝධ හා රෝග සඳහා ප්‍රතිරෝධී ප්‍රභේද නිපදවීම පරිසර හිතකාමී හා පිරිවැය අවම වන සුදුසුම විකල්පයක් ලෙස සැලකිය හැකිය. වෙනත් ක්ෂේත්‍ර භෝග අංශයේ, හෙක්ටයාරයකින් මෙට්‍රික් ටොන් 5.5-6.5 ත් අතර අස්වැන්නක් ලබා දෙන MI Maize Hybrid 02 නව බඩ ඉරිඟු ප්‍රභේදය සහ පළමු අස්වනු නෙළීමේ දී සියයට 80.0 ක පමණ අස්වැන්නක් ලබා දෙන MI 7 නව මුං ප්‍රභේදය වසර තුළ වාර්තා වූ සුවිශේෂී නව හඳුන්වා දීම් ලෙස දැක්විය හැකිය. තව ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක බීජ වී නිෂ්පාදන වැඩසටහන ද 2016 වසරේ දී සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ වන රජයේ බීජ ගොවිපළවලින් සහ ගිවිසුම්ගත ගිවිසුම්වලට එළඹ ඇති ගොවිපළවලින් ක්‍රමය යටතේ ලියාපදිංචි හා සහතික කළ බීජ වී මෙට්‍රික් ටොන් 3,863 ක් ද, ලියාපදිංචි හා සහතික කළ සහ වාණිජමය වශයෙන් වූ වෙනත් ක්ෂේත්‍ර භෝග බීජ මෙට්‍රික් ටොන් 855.6 ක් ද, සම්මත එළවළු බීජ මෙට්‍රික් ටොන් 9.8 ක් ද නිපදවන ලදී.

**පසුගිය කාලපරිච්ඡේදය තුළ දී රජය විසින් වාරිමාර්ග පහසුකම් පුළුල් කිරීමෙහිලා විශාල ලෙස ප්‍රාග්ධන ආයෝජන සිදු කරන ලදී.** 2016 වසරේ දී, ශ්‍රී ලංකාවේ විශාලතම බහුකාර්ය ජල යෝජනා ක්‍රමය මෙන්ම මහවැලි මහ සැලැස්මේ ඇතුළත් විශාල ජලාශ පහෙන් අවසන් ජලාශය වන මොරගහකන්ද ජලාශයේ වැඩකටයුතු සම්පූර්ණ කරන ලදී. අක්කර 460,000 ක් පුරා පැතිර ඇති මොරගහකන්ද ජලාශය, ශ්‍රී ලංකාවේ සිව්වැනි විශාලතම ජලාශය වේ. 2017 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රථම වරට වාන් දොරටු වසා දමමින් ජලාශයට ජලය පිරවීමේ කටයුතු ආරම්භ කරන ලදී. මේ අතර, මොරගහකන්ද ජලාශයේ නිවුන් ව්‍යාපෘතිය ලෙස කළු ගඟ ජලාශය ඉදි කළ අතර එහි සිට කිලෝමීටර් නවයක් දිගැති ඇළ මාර්ගයක් ඔස්සේ මොරගහකන්ද ජලාශයට ජලය ගෙන එනු ලබයි. අඹන් ගඟ ද්‍රෝණියෙන් රැස්කර ගන්නා ජලය කෘෂිකාර්මික කටයුතු සඳහා මාතලේ, අනුරාධපුරය, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන්ට බෙදා දීම මෙම සමස්ත ව්‍යාපෘතියේ අරමුණ වේ. මීට අමතරව, මෙම ව්‍යාපෘතිය ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් 25 ක ධාරිතාවක් එක් කෙරෙයි. මේ අතර, 2017 අයවැය මගින් වාරිමාර්ග යෝජනා ක්‍රම කිහිපයක් සංවර්ධනය කිරීමට යෝජනා කරන ලදී. ඒ අනුව, මඩකලපුව දිස්ත්‍රික්කයේ වාරිමාර්ග කටයුතු හා ගංවතුර ප්‍රශ්නය විසඳීම සඳහා දැනට පවතින "කිතුල්" හා "රුගම්" ජලාශ ද්විත්වය ඒකාබද්ධ කර විශාල ජලාශයක් නිර්මාණය කිරීම සඳහා ද, මොනරාගල දිස්ත්‍රික්කයේ කුඹුක්කන් ඔය ජලාශ බහුකාර්ය ව්‍යාපෘතියට හා මන්නාරම් දිස්ත්‍රික්කයේ "තරපුරම්" වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 600 ක් ද වෙන් කරන ලදී. තවද, යාන් ඔය ව්‍යාපෘතිය සඳහා රුපියල් බිලියනයක් ද, පහළ මල්වතු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 300 ක් ද වසර තුළ දී වෙන් කරන ලදී. බාහිර බලපෑම් හමුවේ කෘෂි රසායන මගින් ජලය මත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඇති කරනු ලබන බලපෑම නිරීක්ෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා කෘෂි ක්ෂේත්‍රයේ තත්කාලීන දත්ත එක්රැස් කිරීම ස්වයංක්‍රීයව අධීක්ෂණය කිරීමේ පද්ධතියක් දිස්ත්‍රික්ක අටක් ආවරණය වන පරිදි ස්ථාපිත කිරීමටත්, වෙරළ ආරක්ෂණ හා ජල සැලසුම්කරණ ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරීමටත් රුපියල් මිලියන 200 ක් වෙන් කරන ලදී.

**පශු සම්පත් අංශයේ ප්‍රමුඛතා හඳුනාගෙන සකස් කරන ලද ප්‍රධාන සැලැස්මට අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී.** දේශීය කිරි නිෂ්පාදනය සමස්ත දේශීය ඉල්ලුම සපුරාලීමට තවමත් නොහැකි

තත්ත්වයක පැවතුණ ද, කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම මගින් එළ ගව, මී ගව සහ එළු ගහණය වැඩි කිරීම, ස්වාභාවික අභිජනන වැඩසටහන් සඳහා වසු පැටවුන් තෝරා ගැනීම සහ තෘණ වගා සංවර්ධනය මගින් දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගන්නා ලදී. කෘත්‍රිම සිංචන මගින් බිහි කර ගන්නා ලද ගැහැණු පැටවුන් පෝෂණය හා පාලනය කිරීම සඳහා ගොවීන්ට සහාය ලබා දෙන "වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතිය" 2016 තුළ දී ද ක්‍රියාත්මක විය. පශු සම්පත් සංවර්ධනය සඳහා වන ආයතනික සහාය ශක්තිමත් කරමින්, "ක්ෂේත්‍ර පශු වෛද්‍ය සේවා සංවර්ධන වැඩසටහන" යටතේ පශු වෛද්‍ය පරීක්ෂණ මධ්‍යස්ථාන හතරක් පුත්තලම දිස්ත්‍රික්කයේ ආරච්චිකට්ටුව ප්‍රදේශයේ ද, මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රදේශයේ ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නාච්චාදූව ප්‍රදේශයේ ද, බදුල්ල දිස්ත්‍රික්කයේ සොරනාතොට ප්‍රදේශයේ ද ස්ථාපිත කෙරුණි. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ තෝරාගත් දිස්ත්‍රික්කවල ජාතික පශු සම්පත් මණ්ඩලය සතු ප්‍රයෝජනයට නොගත් හෝ ඌන උපයෝගීතාවයක් සහිත ඉඩම් උපයෝගී කරගෙන කිරි නිෂ්පාදන සංවර්ධන කලාප පිහිටුවීමට දිරිමත් කරන ලදී. රටෙහි දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ආනයනය කරන ලද කිරි දෙනුන් දසදෙනෙකු බැගින් කිරි ගොවීන් වෙත ලබා දීමට ද, එම ගවයින් මිලදී ගැනීමට ගොවීන්ට දැරිය හැකි මුදල හා ආනයනික මිල අතර පරතරය රජය විසින් මූල්‍යනය කිරීම පිණිස අවශ්‍ය සහාය ලබා දීමට ද නියමිතය. කිරි පිටි සඳහා වන ජාත්‍යන්තර වෙළඳපොළ මිල ඉහළ යෑම හමුවේ ද ග්‍රෑම් 400 ක කිරිපිටි පැකට්ටුවක් රුපියල් 295.00 කට අලෙවි කිරීම නියාමනය කිරීමට තීරණය කිරීම දේශීය කිරි නිෂ්පාදකයින්ට මෙන්ම පාරිභෝගිකයන්ට ද තවදුරටත් හිතකර විය. සත්ත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය වන බඩ ඉරිඟු දේශීය වෙළඳපොළේ හිඟ වන අවස්ථාවල දී, සත්ත්ව ආහාර නිෂ්පාදකයින්ට අවශ්‍ය බඩ ඉරිඟු ප්‍රමාණය සෙස් බද්දක් මත ආනයනය කිරීමට අවස්ථාවක් ලබා දී, මෙම සෙස් බදු කුකුළු මස් අපනයනය කරනු ලබන අවස්ථාවේ දී අපනයනය කරනු ලබන කුකුළු මස් ප්‍රමාණයට සාපේක්ෂව අපනයන බදු ප්‍රතිදානයක් ලෙස ලබා දීමට රජය විසින් අයවැය යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන ලදී. බාහිර පාර්ශවයන් මගින් සිදු කරනු ලබන සත්ත්ව පාලන කටයුතු සඳහා ආයෝජනය කිරීමට පෞද්ගලික අංශය දිරිමත් කෙරුණු අතර, ඵලදායීතාව ඉහළ නැංවීමට අවශ්‍ය සේවා ලබා දීමට ද කටයුතු සලසන ලදී.


**නීති විරෝධී, වාර්තා නොවන සහ අවිධිමත් ධීවර කටයුතු සීමා කිරීම සඳහා රජය මගින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන්, යුරෝපා සංගමය විසින් 2015 ජනවාරි මස සිට වසර එකහමාරක කාලයක් පුරා ශ්‍රී ලංකාවට එරෙහිව පනවා තිබූ යුරෝපා සංගමයේ රටවල් සඳහා වූ මත්ස්‍ය අපනයන තහනම 2016 ජුනි මස 17 සිට ඉවත් කරන ලදී.** නීති විරෝධී, වාර්තා නොවන හා අවිධිමත් ධීවර කටයුතු පාලනය සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීම, ගැඹුරු මුහුදේ යාත්‍රා පිළිබඳ නිසි පාලනයක් නොමැති වීම සහ ජාත්‍යන්තර හා කලාපීය ධීවර නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වීම යනාදිය මත්ස්‍ය නිෂ්පාදන අපනයන මත මෙම තහනම පැනවීමට හේතු විය. ධීවර කර්මාන්තය ඉතා ප්‍රාග්ධන සූක්ෂම වන නමුත් ප්‍රාග්ධන ලැබීම් අපේක්ෂිත මට්ටමින් සිදු නොවීම සැලකිල්ලට ගනිමින් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් ධීවර බෝට්ටු හා ආම්පන්න නවීකරණය සඳහා වූ විවිධ සහනාධාර වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. නිෂ්පාදකයන් වෙත සහනාධාර සැපයීමේ යෝජනා ක්‍රමය යටතේ 2015 වසරේ දී නිකුත් කරන ලද ධීවර ආම්පන්න ඒකක 990 හා සාම්ප්‍රදායික යාත්‍රා 253 ට සාපේක්ෂව 2016 වසරේ දී ධීවර ආම්පන්න ඒකක 13,150 ක් සහ සාම්ප්‍රදායික යාත්‍රා 664 ක් නිකුත් කරන ලදී. විශාල පරිමාණයේ ධීවර යාත්‍රාවන්හි හිඟතාවය පිළිබඳව අවධානය යොමු කළ රජය, ජාත්‍යන්තර වෙළඳපොළේ ඉහළ මිල ගණන් ලැබෙන උසස් තත්ත්වයේ මසුන් අල්ලා ගැනීමට ධීවර ප්‍රජාවට ඉඩප්‍රස්ථා ලබා දෙමින්, අඩි 55 ට වඩා වැඩි දිගින් යුත් බෝට්ටු නිෂ්පාදනයේ දී සියයට 50.0 ක ප්‍රදානයක් ලබා දීමට තීරණය කරන ලදී. 2017 අයවැය මගින් ද ධීවර කර්මාන්තය නගාසිටුවීම සඳහා පියවර රැසක් යෝජනා කරන ලදී. ඒ අනුව, මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ පසු අස්වනු හානිය අවම කිරීමේ අරමුණ ඇතිව බහුදින ධීවර යාත්‍රා සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම දිරිමත් කිරීමට ගන්දර ධීවර වරාය හා නැංගුරම්පළ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කරන ලදී. තව ද, හම්බන්තොට, මඩකලපුව හා යාපනය ඇතුළු වෙරළාශ්‍රිත දිස්ත්‍රික්ක 10 ක සහ කලපු ආශ්‍රිත ප්‍රදේශයන්හි ධීවර නිවාස හා ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 1,200 ක් වෙන් කරන ලදී. අගය එකතු කළ නිෂ්පාදන ලෙස අපනයනය කිරීම මගින් අපනයන ආදායම් ඉහළ නැංවීමේ හැකියාව හඳුනා ගෙන මන්නාරම දිස්ත්‍රික්කයේ ජලජීවී වගා කර්මාන්ත කලාප පිහිටුවීමට රුපියල් මිලියන 500 ක් වෙන් කරන ලදී. මිරිදිය ධීවර කර්මාන්තයේ සංවර්ධනය මගින් පෝෂණ ඌනතා අවම කිරීම, රැකියා අවස්ථා ඇති කිරීම, කර්මාන්ත වැඩිදියුණු කිරීම වැනි බහුවිධ ප්‍රතිලාභ

2

ලබා දීමේ අරමුණින් "වැවක් සහිත ගමක්" වැඩසටහන යටතේ ඒකාබද්ධ මිරිදිය ගම්මාන 100 ක් ඇති කිරීම සඳහා රුපියල් මිලියන 300 ක් වෙන් කරන ලදී. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් ලංකා බැංකුව හා එක්ව මෙහෙයවනු ලබන "දියවර දිරිය" ණය යෝජනා ක්‍රමයේ II අදියර යටතේ 2016 වසරේ දී අයදුම්කරුවන් 62 ක් සඳහා රුපියල් මිලියන 42.2 ක් ලබා දෙන ලදී. මිරිදිය ධීවර සහ ජලජීවී වගා අංශයේ සංවර්ධනය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා හඳුනා ගනිමින් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ හා පෞද්ගලික අභිජනනාගාර තුළ 2016 වසරේ දී මිරිදිය ඉස්සන් පැටවුන් මිලියන 39.6 ක් නිපදවන ලදී. මේ අතර, මිරිදිය ඉස්සන් පැටවුන් මිලියන 38.0 ක් හා මත්ස්‍ය පැටවුන් මිලියන 64.3 ක් ජලාශවලට නිදහස් කිරීමට කටයුතු කරන ලදී. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය දේශීය මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීමේ අරමුණින් ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන (2016-2018) යටතේ වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී. සුදු පුල්ලි රෝගය හේතුවෙන් දැඩි පසුබෑමකට ලක් වූ ඉස්සන් වගා කර්මාන්තය යළි නගාසිටුවීම සඳහා පසුගිය වසර කිහිපය පුරා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ඉස්සන් අභිජනන මධ්‍යස්ථාන නියාමනය හා ඉස්සන් පැටවුන් තොග පරීක්ෂාව අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, බත්තුළුඔය පිහිටි ඉස්සන් ගොවිපළ අධීක්ෂණ කිරීමේ හා බෙදා හැරීමේ ඒකකය මගින් ගොවීන්ට ඉස්සන් වගාව ආශ්‍රිතව ඇති වන රෝග හඳුනා ගැනීමට අදාළ සේවාවන් සපයන ලදී. නැගෙනහිර පළාතේ ඉස්සන් වගා කටයුතු ප්‍රචලිත කිරීම සඳහා සහාය වීමට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ කළමනාකරණය කරනු ලබන ඉස්සන් අභිජනනාගාරයක් මඩකලපුවේ පිහිටුවන ලදී. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් යාපනය, කිලිනොච්චිය හා මන්නාරම ප්‍රදේශයන්හි මුහුදු පැලෑටි (Sea Weed) වගාව සඳහා ද තෙවන්පිට්ටි, මන්නාරම දකුණු වරාය, අම්බුපුරම්, වලෙයිපාඩු හා නාච්චිකුඩා ප්‍රදේශයන්හි මුහුදු කුඩැල්ලන් (Sea Cucumber) වගාව සඳහා ද පෞද්ගලික අංශය වෙත පහසුකම් සලසන ලදී. ප්‍රමුඛ පෞද්ගලික සමාගමක් විසින් උතුරු පළාතේ ගොවීන් 1,000 ක පමණ සහභාගිත්වයෙන් වාණිජ මට්ටමේ මුහුදු පැළෑටි වගා කටයුතු ආරම්භ කරන ලදී. වියට්නාමය හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අතර ඇති කර ගන්නා ලද අවබෝධතා ගිවිසුම යටතේ පෞද්ගලික අභිජනනාගාරයක් තුළ මුහුදු කුඩැල්ලන් අභිජනනයට අදාළ විශේෂඥ දැනුම ලබා දෙන ලද අතර, 2016 වසරේ දී මුහුදු කුඩැල්ලන් පැටව් 435,000 ක වගාවෙන් මෙට්‍රික් ටොන් 61.4 ක අස්වැන්නක් ලබා ගන්නා ලදී.

**2.3 රූප සටහන**

**කර්මාන්තවල දළ එකතුකල අගය (2010 ස්ථාවර මිල)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## කර්මාන්ත

**2016 වසරේ දී කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 2.1 ක වර්ධනයට සාපේක්ෂව සියයට 6.7 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී.** ඉදිකිරීම් කර්මාන්ත, පතල් හා කැණීම් කර්මාන්ත, නිෂ්පාදන කර්මාන්ත, විදුලිය, ජලය සහ කසල කළමනාකරණ කටයුතු යන සියලුම කර්මාන්ත කටයුතු මෙම වර්ධනය සඳහා හිතකර ලෙස දායක විය. ඒ අනුව, 2015 වසරේ දී පහත වැටුණු ඉදිකිරීම් කටයුතු මෙන්ම පතල් හා කැණීම් කටයුතු ද මෙම වසර තුළ දී ඉතා යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, නිෂ්පාදන කර්මාන්ත කටයුතු ද 2016 වසරේ දී ධනාත්මක ලෙස වර්ධනය විය. තවද, විදුලිය, ජලය සහ කසල කළමනාකරණ කටයුතුවල වර්ධනයෙහි දක්නට ලැබුණු යහපත් ප්‍රවණතාව තවදුරටත් අඛණ්ඩව පැවැතුණි. මෙහිදී, ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි කර්මාන්ත අංශයට අදාළ උප දර්ශක ද වසර තුළ දී සමස්තයක් වශයෙන් ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

## පතල් හා කැණීම්

**2016 වසරේ දී පතල් හා කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක පහත වැටීමට සාපේක්ෂව සියයට 14.4 කින් වර්ධනය විය.** ඉදිකිරීම් කටයුතුවල ඉහළ වර්ධනය පතල් සහ කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යහපත් වර්ධනය සඳහා බෙහෙවින් දායක විය. තවද, 2015 වසරේ දී සියයට 48.1 ක පහත වැටීමක් වාර්තා කළ ඛණිජ ද්‍රව්‍ය අපනයන පරිමා දර්ශකය, 2016 වසරේ දී සියයට 7.9 ක වර්ධනයක් වාර්තා කිරීම තුළින් ද පතල් හා කැණීම් කටයුතුවල ඇති වූ යහපත් ප්‍රවණතාව


පිළිබිඹු විය. තවද, 2016 වසරේ දී මැණික් අපනයනය ප්‍රමාණාත්මකව ගත් කළ, 2015 වසරේ දී වාර්තා කළ සියයට 17.1 ක පහළ යෑමට සාපේක්ෂව සියයට 8.4 ක වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, රූටයිල් සහ සර්කෝන් නිෂ්පාදනය මෙම වසරේ දී වර්ධනය වූ අතර, ඉල්මනයිට් නිෂ්පාදනය පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් පොහොර නිෂ්පාදනය සඳහා වූ අඩු ඉල්ලුම හේතුවෙන් මෙම වසරේ දී පොස්පේට් නිෂ්පාදනය පහත වැටුණි.

## නිෂ්පාදන කර්මාන්ත

**2016 වසරේ දී නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 1.7 ක අඩු වේගයකින් වර්ධනය විය.** මෙම සාපේක්ෂ අඩු වර්ධනය කෙරෙහි නිෂ්පාදන කර්මාන්තයෙහි විශාලතම කාණ්ඩය වන ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 3.7 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේදී සියයට 2.5 කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2016 වසරේදී ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගය සියයට 13.1 කින් ද රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම්භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගය සියයට 0.2 කින් ද පහත වැටුණි. කෙසේ වුවද, නිෂ්පාදන කටයුතුවල සමස්ත වර්ධනය සඳහා හිතකර ලෙස දායක වෙමින් අනෙකුත් සියලුම නිෂ්පාදන කාණ්ඩවල එකතු කළ අගය ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලද අතර මෙහි දී ප්‍රධාන වශයෙන් රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සියයට 17.9 කින් ද ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සියයට 28.7 කින් මෙන්ම යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය සියයට 14.1 කින් ද වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව ගණනය කරනු ලබන නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි හැසිරීම සලකා බැලීමේ දී, අප්‍රේල් සහ මැයි යන මාස හැර වසරේ සෙසු මාස වල දී දර්ශක අගය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙහිදී, නිෂ්පාදන, නව ඇණවුම්, ගැනුම් තොග, සේවා නියුක්තිය සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන මෙම දර්ශකයෙහි සියලුම උප දර්ශකවල වාර්ෂික සාමාන්‍යය ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මේ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100) 2016 වසර තුළ දී සියයට 3.3 කින් වර්ධනය විය.

**2.4 රූප සටහන**

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදුවූ වර්ධනීය තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය[3]

**විදේශ ඉල්ලුම අඩු වීම සහ ලෝක වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් පහත වැටීම මෙන්ම, අයහපත් කාලගුණික තත්ත්වයන්වල බලපෑමෙන් සැපයුම් අංශයේ ඇති වූ අවහිරතා හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත උප අංශයට ඉහළ දායකත්වයක් සපයන කර්මාන්තශාලා නිෂ්පාදනය 2016 වසරේ දී සියයට 2.7 ක පහළ යෑමක් වාර්තා කළේය.** නිෂ්පාදන කර්මාන්ත උප අංශයේ ප්‍රවණතා පිළිබිඹු කරන කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය, 2016 වසර තුළ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ආහාර නිෂ්පාදිත, ඇඟලුම්, පාන වර්ග, දුම්කොළ නිෂ්පාදිත, රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ විදුලි උපකරණ යන ප්‍රධාන උප අංශවල ක්‍රියාකාරිත්වය කෙරෙහි 2016 වසර තුළ දී අහිතකර බලපෑම් ඇති විය. එසේ වුව ද, රෙදිපිළි, අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, පිරිපහදු කළ

3 එක් එක් කර්මාන්ත අංශය සඳහා කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය තුළ බර තැබීම් 2010 වසර පදනම් වර්ෂය ලෙස සලකමින් සිදු කර ඇත. ඒ අතර ම, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කාර්මික නිෂ්පාදන දර්ශකයක් සම්පාදනය කරන අතර, එය 2015 පදනම් වර්ෂය වශයෙන් සලකා තෝරා ගත් කාර්මික භාණ්ඩ නියැඳියක් පදනම් කර ගනිමින් සකසනු ලැබේ. මෙම සංයුක්ත දර්ශකය මගින් කර්මාන්ත අංශයේ නිෂ්පාදන ධාරිතාවෙහි කෙටිකාලීන වෙනස්වීම් හඳුනා ගත හැකිවේ. 2017 වසරේ සිට ජාතික ගිණුම් සැකසීමේ කාර්යයන් සඳහා කාර්මික නිෂ්පාදන දර්ශකය යොදා ගැනීමට නියමිතව ඇත. ඒ අනුව, 2017 වාර්ෂික වාර්තාව තුළ අඩංගු කර්මාන්ත අංශයේ විශ්ලේෂණය කාර්මික නිෂ්පාදන දර්ශකය යොදා ගෙන සිදු කිරීමට නියමිතය.

2

ඛනිජතෙල් නිෂ්පාදිත, සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදිත මෙන්ම මූලික ලෝහ නිෂ්පාදිත 2016 වසර තුළ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කළේය.

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයෙහි ප්‍රධාන උප අංශය වන ආහාර නිෂ්පාදිත උප අංශය, 2015 වසරේ දී වාර්තා කරන ලද ධනාත්මක වර්ධනය හා සැසඳීමේ දී 2016 වසර තුළ දී සියයට 3.2 කින් සංකෝචනය විය.** කිරි නිෂ්පාදිත, එළවළු, සත්ත්ව තෙල්, සකස් කළ හා කල්තබා ගත හැකි ලෙස සකස් කරන ලද මස් ආශ්‍රිත නිෂ්පාදිත සහ අගය එකතු කළ තේ නිෂ්පාදිත යනාදියෙහි නිමැවුම වසර තුළ දී පහත වැටුණි. කෙසේ වෙතත්, බේකරි නිෂ්පාදිත, සීනි, මැකරෝනි හා නූඩ්ල්ස්, සකස් කළ ආහාර යනාදියෙහි නිමැවුම වසර තුළ දී ඉහළ ගියේය. වඩාත් සෞඛ්‍ය සම්පන්න විකල්ප ආහාර වර්ග වෙත පාරිභෝගිකයන් යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය සම්පන්න ආහාර සඳහා වන ලෝක වෙළඳපොළ පිරිවැටුම 2017 වසරේ දී එ.ජ.ඩොලර් ට්‍රිලියනය දක්වා ඉහළ යැමක් අපේක්ෂා කෙරේ. එබැවින්, ශ්‍රී ලංකාවේ බහුල ලෙස පවතින ධීවර සම්පත්, පලතුරු සහ එළවළු ඇසුරුම් කර ජාත්‍යන්තර වෙළඳපොළ වෙත අපනයනය කිරීමට ඇති අවස්ථා හඳුනා ගැනීම මෙම උප අංශයේ ඉදිරි වර්ධනයට හේතු වනු ඇත.

**වසර තුළ දී පාන වර්ග උප අංශය, එහි ප්‍රධානතම කාණ්ඩය වන මත්පැන් නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් සියයට 13.4 ක අඩු වීමක් වාර්තා කළේය.** වසර මැද ඇති වූ ගංවතුර තත්ත්වය, මෙරට බීර නිෂ්පාදනය කරන විශාලතම කර්මාන්ත ශාලාවෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර ලෙස බලපෑම, මත්පැන් නිෂ්පාදනය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තව ද, මෝල්ට් අඩංගු කිරි නිෂ්පාදිත ද පෙර වසරට වඩා පසුබෑමක් පිළිබිඹු කළේය. එසේ වුවත්, වසර අවසාන කාලයේ දී පැවැති වියළි කාලගුණික තත්ත්වයේ බලපෑම නිසා සිසිල් බීම හා බෝතල් කළ පානීය ජලය යනාදියෙහි ඉල්ලුම ඉහළ යැම හේතුවෙන් නිෂ්පාදනය වර්ධනය විය.

**දුම්කොළ නිෂ්පාදිත උප අංශය 2016 වසරේ දී සියයට 3.2 ක වාර්ෂික පසුබෑමක් වාර්තා කළේය.** 2015 අග භාගයේ දී සහ 2016 වසර තුළ දී දුම්වැටි මිල තවදුරටත් ඉහළ යැම හේතුවෙන් පාරිභෝගික ඉල්ලුමෙහි සිදු වූ පහළ යැම මේ සඳහා මූලික වශයෙන් බලපාන ලදී. සමස්තයක් ලෙස, 2016 වසර තුළ දී වෙළඳපොළෙහි ඇති සියලුම දුම්වැටි වර්ගවල මිල සියයට 45.0 සිට 100.0 දක්වා වූ ප්‍රතිශතයකින් ඉහළ ගියේය. 2016 වසර තුළ දී දුම්වැටි මිල ඉහළ යැම සඳහා දුම්කොළ නිෂ්පාදිත මත නොවැම්බර් මාසයේ දී පනවන ලද සියයට 15.0 ක එකතු කළ අගය මත බද්ද හේතු විය. මෙලෙස දුම්වැටි මිල ඉහළ යැම හේතුවෙන් වෙළඳපොළ තුළ නීති විරෝධී දුම්වැටි හෝ මිලෙන් අඩු බීඩි වැනි සෞඛ්‍යයට ඉතා අහිතකර ආදේශක සඳහා වන ඉල්ලුම ඉහළ යැමට හැකිය. ශ්‍රී ලංකා රේගුවෙහි දත්තවලට අනුව, 2016 වසරේ දී වැටලීම් මගින් රාජසන්තක කරන ලද නීති විරෝධී දුම්වැටි මිලියන 4 ක ප්‍රමාණයට සාපේක්ෂව, 2017 වසරේ මුල් මාස දෙක තුළ දී පමණක් නීති විරෝධී දුම්වැටි මිලියන 10 කට වඩා වැඩි ප්‍රමාණයක් රාජසන්තක කරන ලදී. තවද, බීඩි නිෂ්පාදනය අධෛර්යවත් කිරීමේ අරමුණින් තෙන්දු කොළ (Tendu Leaves) මත ආනයන බදු ඉහළ දැමීම සිදු වුවත්, ඒ සඳහා දේශීය ආදේශක යොදා ගැනීමට දේශීය නිෂ්පාදකයන් පෙළඹී ඇත.

**2.9 සංඛ්‍යා සටහන**

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය**
**2010 = 100**

| කාණ්ඩය | 2015 (අ) | 2016 (ආ) | වාර්ෂික වෙනස්වීම % | |
|---|---|---|---|---|
| | | | 2014/15 (අ) | 2015/16 (ආ) |
| 1. ආහාර නිෂ්පාදිත (23.7%) | 107.3 | 103.9 | 4.9 | -3.2 |
| 2. පාන වර්ග (8.1%) | 123.1 | 106.6 | 10.1 | -13.4 |
| 3. දුම්කොළ නිෂ්පාදිත (8.4%) | 95.4 | 92.4 | 8.9 | -3.2 |
| 4. රෙදිපිළි (1.6%) | 131.0 | 134.4 | -1.4 | 2.6 |
| 5. ඇඟලුම් (23.1%) | 173.4 | 169.2 | 16.0 | -2.4 |
| 6. සම් සහ ආශ්‍රිත නිෂ්පාදිත (0.8%) | 86.4 | 107.0 | -10.9 | 23.8 |
| 7. ගෘහ භාණ්ඩ හැර, දැව සහ දැව නිෂ්පාදිත (0.1%) | 121.7 | 129.0 | 11.7 | 6.0 |
| 8. කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත (0.1%) | 126.6 | 126.6 | 0.0 | 0.0 |
| 9. මුද්‍රණය සහ තැටි පිටපත් කිරීම (0.7%) | 112.4 | 112.4 | 0.0 | 0.0 |
| 10. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත (2.2%) | 82.6 | 84.3 | -3.9 | 2.1 |
| 11. රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත (6.3%) | 88.3 | 77.4 | 7.5 | -12.4 |
| 12. ඖෂධ, ඖෂධීය සහ උද්භිද විද්‍යාත්මක නිෂ්පාදිත (0.1%) | 142.2 | 145.4 | -0.4 | 2.3 |
| 13. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත (10.5%) | 131.3 | 138.5 | -2.2 | 5.4 |
| 14. අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (7.2%) | 118.8 | 132.0 | 15.4 | 11.1 |
| 15. මූලික ලෝහ නිෂ්පාදිත (1.0%) | 115.0 | 148.0 | 1.8 | 28.7 |
| 16. යන්ත්‍රෝපකරණ සහ උපකරණ හැර, සකස් කළ ලෝහ නිෂ්පාදිත (3.8%) | 109.8 | 72.9 | 13.0 | -33.6 |
| 17. විදුලි උපකරණ (2.3%) | 130.6 | 118.4 | 31.3 | -9.3 |
| **කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය** | **125.4** | **122.0** | **9.2** | **-2.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන : 1 කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ (2010=100) බර තැබීම වරහන් තුළ දක්වා ඇත.
2 කාර්මික නිෂ්පාදන දර්ශකය, කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය ලෙස 2013 වසරේ දී නැවත නම් කරන ලදී.

රට තුළ අනවසර හා නීතිවිරෝධී දුම්කොළ නිෂ්පාදිතවල ව්‍යාප්තිය සීමා කිරීමට දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුව ඇති බව මෙයින් පෙන්නුම් කෙරේ.


**2016 වසරේ දී, රෙදිපිළි උප අංශය සියයට 2.6 ක වර්ධනයක් වාර්තා කළේය.** දේශීය වෙළඳපොළෙහි රෙදිපිළි සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම මෙම උප අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. ශ්‍රී ලංකාව 2016 වසරේ දී රෙදිපිළි සහ රෙදිපිළි අයිතම ආනයන සඳහා එ.ජ.ඩොලර් බිලියන 2.7 ක් පමණ වැය කර ඇත. මෙමගින් දේශීය අත්‍යන්ත්‍ර රෙදිපිළි සහ රෙදිපිළි කර්මාන්තශාලාවල නිෂ්පාදන හැකියාව ඉහළ නැංවීමේ අවස්ථා පිළිබඳ සොයා බැලීමේ අවශ්‍යතාව අවධාරණය කරනු ලබයි. ඇතැම් ඇඟලුම් අපනයනකරුවන් සඳහා විශේෂිත වූ රෙදිපිළි අවශ්‍ය වන බැවින් ඉහළ එකතු කළ අගයක් සහිත රෙදිපිළි නිෂ්පාදනය කෙරෙහි රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය යොමු විය යුතු අතර, එමගින් කාර්මික අංශය තුළ පසු නිෂ්පාදන ක්‍රියාවලීන් (Backward Linkages) සම්බන්ධීකරණය තුළින් ඇඟලුම් කර්මාන්තයට ද ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව ඇත. මෙවැනි කටයුතු කෙරෙහි අවධානය යොමු කිරීම දේශීය කාර්මික කටයුතු වැඩිදියුණු කිරීමට මෙන්ම, රටේ විදේශ විනිමය සම්පත් ඉතිරි කර ගැනීමට ද හේතු වනු ඇත.

**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ දෙවන විශාලතම උප අංශය වන ඇඟලුම් උප අංශය 2016 වසරේ දී සියයට 2.4 ක පසුබෑමක් වාර්තා කරමින් මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය සංගමය වැනි සාම්ප්‍රදායික වෙළඳපොළ වෙතින් අපනයන සඳහා වූ ඉල්ලුම පහත වැටීම මෙයට මූලික වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, සාම්ප්‍රදායික නොවන වෙළඳපොළවල් වන කැනඩාව, චීනය, ඕස්ට්‍රේලියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල් වෙත වූ ඇඟලුම් අපනයනවල ඉහළ යෑමක් මෙම කාලය තුළ දක්නට ලැබුණි. විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) නැවත ස්ථාපිත වීමේ හැකියාව සමඟ ම යුරෝපා සංගමය වෙත සිදු කරන අපනයනවල ඉහළ යෑම ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයෙහි සංවර්ධනය කෙරෙහි සුවිශේෂී දායකත්වයක් දක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, රටක් ඉහළ මැදි ආදායම් රටවල් අතරට ඇතුළු වී වසර 3 ක කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය අවසන් වේ. දැනට පුරෝකථනය කොට ඇති වර්ධන අනුපාතිකවලට අනුව, ශ්‍රී ලංකාව ද මෙම තත්ත්වයට මැදි කාලීනව ළඟා වනු ඇත. එබැවින්, මෙම කෙටි කාලසීමාව තුළ දී විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයේ සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා දේශීය ඇඟලුම් කර්මාන්තකරුවන් නොපමාව ක්‍රියා කළ යුතු වේ. ඒ සමඟම, දේශීය ඇඟලුම් නිෂ්පාදිත සඳහා වන අපනයන වෙළඳපොළ විවිධාංගීකරණය කිරීමට සහාය වීම සඳහා සුදුසු හවුල්කාර රටවල් සමඟ වෙළඳ ගිවිසුම් පුළුල් කිරීම පිළිබඳව අපනයනකරුවන් විසින් සලකා බැලිය යුතු වේ. තවද, කර්මාන්තය මුහුණ දී ඇති ශ්‍රම හිඟයට පිළියමක් ලෙස විශේෂයෙන්ම, උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළුව අගනුවරින් බැහැර ප්‍රදේශවල කර්මාන්ත නැවත ස්ථාපිත කිරීම තවදුරටත් වර්ධනය කළ යුතුය. තවද, ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු සැපයුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකාව හිමි කරගෙන ඇති වෙළඳපොළ ස්ථාවරත්වය සමඟ සැපයුම් යටිතල පහසුකම්, භූගෝලීය පිහිටීම සහ පුහුණු ශ්‍රම බලකාය යනාදියෙහි වාසි උපයෝගී කර ගනිමින් කලාපීය ඇඟලුම් වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ස්ථාවර වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සලකා බැලිය යුතු වේ.

2.5 රූප සටහන

කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකය

(2010=100)




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සම් හා සම් ආශ්‍රිත නිෂ්පාදිත 2016 වසරේ දී සියයට 23.8 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය.** මෙම උප අංශය 2014 වසරේ සිට වාර්තා කළ මන්දගාමී ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් වීම සඳහා දේශීය වෙළඳපොළෙහි පාවහන් සහ නිම කළ සම් නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම නැවත ඉහළ යෑම හේතු විය.

**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් පිරිපහදු කරනු ලබන ඛනිජතෙල් නිෂ්පාදිතවලින් මුළුමනින්ම පාහේ සමන්විත වන පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදිත උප අංශය 2016 වසර තුළ දී සියයට 2.1 කින් වර්ධනය විය.** 2015 වසරේ දී අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා ඛනිජතෙල් පිරිපහදුව සති කිහිපයක්

2

### විශේෂ සටහන 3
## නිෂ්පාදන කර්මාන්ත අංශය සංවර්ධන කිරීමේ උපායමාර්ගයක් කරා

**ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා නිෂ්පාදන කර්මාන්තවල වැදගත්කම**

ශ්‍රී ලංකාව, 1978 වසරේ දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් පසු, ජාතික ධනය ඉහළයෑම හා ජීවන තත්ත්වය යහපත් වීම තුළින් සැලකිය යුතු ආර්ථික හා සාමාජීය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. එනමුත්, පසුගිය වසර කිහිපයෙහි ආර්ථික වර්ධන වේගය සියයට 3.0 සිට 5.0 දක්වා මට්ටමකට සීමා වී ඇති අතර, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස අපනයන, අඛණ්ඩව අඩු වී ඇත. නිෂ්පාදන කර්මාන්ත අංශයෙන් ආර්ථික වර්ධනය සඳහා ඇති දායකත්වය පහළ මට්ටමක පැවති අතර විශේෂයෙන්ම, පසුගිය දශක දෙක තුළ එම අංශයේ ප්‍රගතිය ඉතා මන්දගාමී විය. එකතු කළ අගය වැඩි භාණ්ඩ නිෂ්පාදනය කිරීමට හා ඵලදායීතාව ඉහළ නැංවීමට නොහැකි වීම සහ දේශීය හා විදේශීය වෙළඳපොළවල තරගකාරිත්වය පවත්වා ගෙන යෑමට නිෂ්පාදන අංශයට නොහැකි වීම මෙයට හේතු විය. රටක ආර්ථික හා සාමාජීය පරිවර්තන ක්‍රියාවලියෙහිලා ප්‍රධාන ගාමක බලවේගයක් වශයෙන් ක්‍රියා කිරීමට නිෂ්පාදන අංශයට ඇති හැකියාව, ශක්තිමත් කාර්මීකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් වෙනත් රටවල් ගණනාවක්ම සාක්ෂාත් කර ගනු ලැබූ වේගවත් සංවර්ධනය මගින් පිළිබිඹු වේ. නිෂ්පාදන කර්මාන්ත අංශයේ සංවර්ධනය, දිළිඳුකම හා ප්‍රාදේශීය විෂමතාව නැති කිරීම, ගුණාත්මක බවෙන් වැඩි රැකියා අවස්ථා ඇති කිරීම, අපනයන ආදායම වැඩි කිරීම, රටේ තාක්ෂණික හැකියාව වැඩිදියුණු කර ආර්ථිකයේ ඉදිරි වර්ධනයට අවශ්‍ය ඵලදායීතා ශක්‍යතාව ඉහළ නැංවීම ආදී ඉලක්ක බොහොමයක් සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල වශයෙන් උපකාරී වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රයත්නය සඳහා විදේශ ආධාර, සුභසාධන හා සංක්‍රාම මත යැපීම තවදුරටත් පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක් ඇති වී ඇති නිසා ඉතා කඩිනමින් නිෂ්පාදන කර්මාන්ත අංශය යළි නඟාසිටුවීම, තිරසාර සංවර්ධනයක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ගත යුතු අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ගයක් වී ඇත.

කාර්මීකරණය තුළින් සංවර්ධනය වූ රටවල් මෙන් නොව, ශ්‍රී ලංකාව, නිදහස ලබා ගැනීමෙන් පසු වාර්තා කළ ආර්ථික වර්ධනය සාක්ෂාත් කර ගෙන ඇත්තේ, යැපුම් කෘෂිකර්මය මත පදනම් වූ ගොවි සමාජයක සිට සේවා පදනම් කරගත් ආර්ථිකයක් දක්වා එකවර පරිවර්තනය වීම තුළිනි. මෙරට ද.දේ.නි.යෙහි ආංශික ව්‍යුහයේ පරිවර්තනය සිදු වූයේ කෘෂිකර්මාන්ත අංශය ක්‍රමයෙන් කුඩා වෙමින්, සේවා අංශයේ හා නිෂ්පාදන නොවන කර්මාන්ත අංශ (ගොඩනැගිලි ඉදිකිරීම, කැණීම් කටයුතු, විදුලිය, ජලය හා අපද්‍රව්‍ය බැහැර කිරීම) විශාල වශයෙන් වර්ධනය වීමෙනි (සංඛ්‍යා සටහන වි.ස. 3.1). ද.දේ.නි.යේ වර්ධනය සඳහා නිෂ්පාදන අංශයේ දායකත්වය 1978 සිට අඩු මට්ටමක පැවතුණ අතර (සංඛ්‍යා සටහන වි.ස. 3.1), නිෂ්පාදන අංශයේ වාර්ෂික වර්ධන වේගය පසුගිය වසර 15 තුළ දී බොහෝවිට ද.දේ.නි.යේ වර්ධන වේගයට වඩා පහළ මට්ටමක පැවතිණ (රූප සටහන වි.ස. 3.1). ඒ හේතුවෙන්, ශ්‍රී ලංකාව පසුගිය වසර කිහිපය තුළ වාර්තා කළ ද.දේ.නි.යෙහි වර්ධනය, ප්‍රධාන වශයෙන් ජනිත වූයේ සේවා හා ගොඩනැගිලි ඉදිකිරීම වැනි අන්තර්ජාතික වෙළඳාමට භාජනය නොවන අංශ තුළිනි. එහි ප්‍රතිඵල හා දේශීය ආර්ථිකයේ ප්‍රමාණයෙහි සීමාසහිත බවද හේතු කර ගෙන, පසුගිය වසර කිහිපය තුළ වාර්තා වූ ආර්ථික වර්ධන වේගය සියයට 3.0 සිට 5.0 දක්වා අඩු මට්ටමකට සීමා විය.

**සංඛ්‍යා සටහන වි.ස. 3.1**
**දළ දේශීය නිෂ්පාදිතයෙහි ආංශික වර්ගීකරණය**


| වසර | කෘෂිකර්මාන්තය | කර්මාන්ත | සේවා | නිෂ්පාදන (කර්මාන්ත අංශයේ කොටසක් වන) |
|---|---|---|---|---|
| 1978 | 26 | 24 | 50 | 19 |
| 1980 | 24 | 24 | 52 | 18 |
| 1985 | 26 | 26 | 49 | 18 |
| 1990 | 23 | 27 | 50 | 17 |
| 1995 | 20 | 30 | 50 | 14 |
| 2000 | 19 | 28 | 53 | 16 |
| 2005 | 17 | 27 | 56 | 16 |
| 2010 | 12 | 29 | 29 | 17 |
| 2015[1] | 8 | 26 | 57 | 16 |
| 2016[1] | 7 | 27 | 56 | 15 |

මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1978 දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් පසු නිෂ්පාදන අංශය දියුණු කිරීමට විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් හඳුන්වා දී ඇත. එසේ දියත් කළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට, 1978 දී අපනයන සංවර්ධන මණ්ඩලය පිහිටුවීම, අපනයන සැකසුම් කලාප පිහිටුවීම, රජය සතු කර්මාන්ත ආයතන පෞද්ගලීකරණය කිරීම, 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ 1991 දී කාර්මීකරණ කොමිසමක් ස්ථාපනය කිරීම, 1990 දශකය තුළ දී ඇඟලුම් කම්හල් 200 ක් පිහිටුවීමේ ව්‍යාපාරයක් දියත් කිරීම, 1995 දී කාර්මීකරණ ප්‍රතිපත්ති ලේඛනයක් නිවේදනය කිරීම, "1997 - 2006 ඵලදායීතා දශකය" යන වැඩසටහන දියත් කිරීම, 2015 දී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සැකසීම යනාදිය ඇතුළත් වේ. නමුත් එම ප්‍රතිපත්ති

1 මෙම වසරවලට අදාළ ප්‍රතිශත ගණනය කර ඇත්තේ 2008 ජාතික ගිණුම් ක්‍රමය (System of National Accounts 2008) අනුව සකසන ලද "මූලික මිල ගණන් අනුව එකතු කළ අගය" ආශ්‍රයෙනි. කෘෂිකර්මාන්තය, කර්මාන්ත හා සේවා අංශවල මූලික මිල ගණන්වල එකතු කළ අගයට භාණ්ඩ හා සේවා මත අය කරන බදු අඩු කිරීම සහනාධාර එකතු කළ විට වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. ලැබේ.

### රූප සටහන වි.ස. 3.1
### දළ දේශීය නිෂ්පාදිතය හා එහි අංශවල වර්ධන වේගය




මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

තුළින් මෑත කාලයේ දී මෙරට කර්මාන්තවලට දේශීය හා විදේශීය වෙළඳපොළ තුළ තරගකාරිත්වය පවත්වා ගෙන යෑමට සුවිශේෂී දායකත්වයක් නොලැබුණු අතර, කාර්මික නිෂ්පාදන කටයුතු, ඇඟලුම්, ආහාර ආශ්‍රිත නිෂ්පාදන, රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ අනෙකුත් ශ්‍රමය අධික සහ තාක්ෂණ උපයෝජනය අඩු නිෂ්පාදනවලට බොහෝ දුරට සීමා විය. විශේෂයෙන්ම, 2000 වසරෙන් පසුව ද.දේ.නි.යේ වර්ධනය සඳහා නිෂ්පාදන අංශයේ දායකත්වය අඩු වූයේ ඇඟලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් අඩු ශ්‍රම පිරිවැය තුළින් ශ්‍රී ලංකාවට ඇති සාපේක්ෂ වාසිය, ඊටත් වඩා අඩු ශ්‍රම පිරිවැය ඇති රටවල්වලට විතැන් වූ බැවිනි. මෙම අභියෝග, බහු කෙඳි ගිවිසුම (Multifibre Agreement) හා විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) අහිමි වීමත් සමග වඩා තීව්‍ර විය. ඇඟලුම් කර්මාන්තයේ විශාල පිබිදීමක් ඇති වූ වකවානුවේ දී නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම කෙරෙහි ද තාක්ෂණික බවින් උසස්, එකතු කළ අගය වැඩි සංකීර්ණ භාණ්ඩ නිපදවීම කෙරෙහි ද යොමු වීමට ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශය අසමත් විය. ශ්‍රී ලංකාවේ මෙම සංවර්ධන රටාව, ශාස්ත්‍රීය අධ්‍යයනයෙහි "අපරිණත වියේ දී කාර්මීකරණයෙන් බැහැර වීම" (Premature Deindustrialisation)[2] ලෙස හැඳින්වෙන සංකල්පයට අනුකූල වේ. මෙයට හේතුව වශයෙන් සැලකෙන්නේ, ආර්ථිකය විවෘත කර, ඉන් පසුව කාර්මීකරණය සඳහා අඩු ප්‍රයත්න දැරූ රටවල පසුකාලීන ආර්ථික වර්ධනය, ප්‍රාග්ධන ගලාඒම්, විදේශ ආධාර හා ප්‍රාථමික වෙළඳ ද්‍රව්‍යවල මිල වැඩි වීම යනාදිය මත පදනම් වීමට ගෝලීයකරණ බලවේගවල බලපෑම හේතු වන බවයි. එමගින් ඇති වන සේවා පදනම් කරගත් ආර්ථිකවලට සාක්ෂාත් කර ගත හැක්කේ මධ්‍යස්ථ වර්ධන වේගයක් පමණක් බව ඉහත සංකල්පය මගින් කියැවේ. මෙයින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව විසින් ඉතා ඉක්මනින්ම නිෂ්පාදන කර්මාන්ත අංශය සංවර්ධනය කර, නිෂ්පාදිත වෙළඳ භාණ්ඩ අපනයනය වැඩි කිරීම සඳහා කැප විය යුතු බවත්, ඒ සඳහා ප්‍රමාද වූ රටක් ලෙස හෝ ගෝලීය අගයදාමවලට එකතු විය යුතු බවත්ය.

### ජාත්‍යන්තර අත්දැකීම්

1950 ගණන්වල දී ශ්‍රී ලංකාවට සමාන ආර්ථික පසුබිමක් තිබූ රටවල් රැසක්, විසිවන ශත වර්ෂය මැද භාගයේ දී, කාර්මික නිෂ්පාදන අංශවල ඵලදායීතා හැකියාව වැඩිදියුණු කිරීම තුළින් නිෂ්පාදිත භාණ්ඩ අපනයනය වැඩි කිරීම පිණිස රජයේ ප්‍රධානත්වයෙන් ප්‍රතිපත්ති රැසක් දියත් කළේය. ආසියාතික රටවල් රැසක්ම රජය ප්‍රධාන කාර්මීකරණ ප්‍රතිපත්ති දියත් කිරීමේ දී නැගෙනහිර ආසියාතික සංස්කෘතික සංකේතයක් වන පියාඹන පාත්තයින්ගේ රටාව ගත් (Flying Geese - ඇලවූ "V" අකුරක හැඩය ඇති) ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ බව බොහෝ අවස්ථාවල සඳහන් වී ඇත. මෙහි දී ජපානය ඉදිරියෙන්ම ද, ඉන්පසු දකුණු කොරියාව, සිංගප්පූරුව, හොංකොං හා තායිවානය යන රටවල් ද, ඊටත් පසු චීනය, ඉන්දුනීසියාව, මලයාසියාව හා තායිලන්තය ඇතුළු රටවල් රාශියක් ද එසේ කාර්මීකරණ ප්‍රතිපත්ති අනුගමනය කළහ. මෙම රටවල සේවා අංශ, සංවර්ධන ක්‍රියාවලියේ පශ්චාත් කාලයේ දී දියුණු තත්ත්වයකට පත් විය. දකුණු ඇමරිකානු රටවල් වන බ්‍රසීලය, චිලී, පේරූ හා මෙක්සිකෝව වැනි රටවල් ද මෙවන් ක්‍රියාවලියක් අනුගමනය කළේය. මෙම රටවල් සියල්ලක්ම වර්තමානයේ දී ද.දේ.නි. අතින් ද සමාජ සංවර්ධනය අතින් ද ශ්‍රී ලංකාව පසු කර ගෙන ගොස් ඇත.

ඉහත රටවල් ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාවලිය ආරම්භයේ දී ඉතා පැහැදිලි කාර්මීකරණ ප්‍රතිපත්ති ස්ථාපනය කර තිබුණි. යැපුම් ගොවිතැන පැවති රටවල් බොහොමයක් කෘෂිකර්මාන්තයේ ඵලදායීතාවය වැඩි කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ ඇති කිරීම හා සඵලදායී ගොවිතැන් ක්‍රම හඳුන්වා දීම සඳහා, කාර්මීකරණ ප්‍රතිපත්තිවලට සමගාමීව තවත් උපායමාර්ග දියත් කළහ. ඒ තුළින් ඌන සේවා නියුක්තියක් පැවති කෘෂිකර්මාන්ත අංශයෙන්, නිෂ්පාදන අංශයට ශ්‍රමය ගලා ආ අතර මහා පරිමාණ කෘෂි නිෂ්පාදනය කෙරෙහි ආර්ථිකය යොමු විය. මෙම ක්‍රියාදාමය "ලුවිස් හැරුම් ලක්ෂ්‍යය" (Lewisian Turning Point)[3] නමින් හැඳින්වෙන, සාම්ප්‍රදායික අංශවල අතිරික්ත ශ්‍රමය, නූතන නිෂ්පාදන අංශයට සම්පූර්ණයෙන් අවශෝෂණය වන අවස්ථාව තෙක් සිදු විය. මෙම රටවල් බහුතරයක් සංවර්ධනයේ මුල් අවස්ථාවේ දී ඇඟලුම් වැනි එකතු කළ අගය අඩු පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කළ අතර, එයින් ලබාගත් තාක්ෂණික හැකියාවන් උපයෝගී කරගෙන පසු අවස්ථාවල දී සංකීර්ණ භාණ්ඩ නිපදවීමට යොමු විය. ජපානය හැර අනෙක් රටවල්, සිය රටවල ස්ථාපනය කළ විශේෂ ආර්ථික කලාප තුළ කර්මාන්තශාලා

2 Rodrik, Dani. "Premature deindustrialization." Journal of Economic Growth 21.1 (2016): 1-33

3 Lewis, W. Arthur. "Economic development with unlimited supplies of labour." The Manchester School of Economics and Social Studies 22.2 (1954): 139-191.

පිහිටුවීම සඳහා විදේශ ඍජු ආයෝජන ලබා ගැනීමට ක්‍රියා කළේය. මේ අතර, දේශීය සුළු පරිමාණ කර්මාන්ත, මහා පරිමාණ කර්මාන්ත බවට පරිවර්තනය වන තෙක් ලාභදායී ආනයනවලින් ඇති වන තරගකාරීත්වයෙන් ආරක්ෂාවක් ලබා දීමට එම රජයන් විසින් කටයුතු කරන ලදී. කාර්මික නිෂ්පාදන අංශය තුළ ඇති වූ තාක්ෂණික දියුණුව, සේවා හා කෘෂි නිපැයුම් අංශවල තාක්ෂණික දියුණුව සඳහා උත්ප්‍රේරකයක් විය. කාර්මීකරණයත් සමග මෙම රටවල නිෂ්පාදන අංශයෙන් ද.දේ.නි. ට ඇති දායකත්වය, විශාල වශයෙන් වැඩි වූ අතර, දැනට ද එය ශ්‍රී ලංකාව සඳහා වාර්තාවන එම අගයට වඩා වැඩි අගයක් ගනී (සංඛ්‍යා සටහන වි.ස. 3.2). වර්තමානයේ දීත්, එම රටවල අපනයන භාණ්ඩවලින් වඩා විශාල ප්‍රතිශතයක් කාර්මික නිෂ්පාදිත භාණ්ඩ වේ. මේ වන විට, වියට්නාමය හා පිලිපීනය වැනි පහළ මධ්‍යම ආදායම් රටවල් ද කාර්මීකරණය තුළින් මෙවන් ආර්ථික වර්ධන රටාවක් අනුගමනය කිරීමට තැත් කරයි. කෘෂිකර්මාන්තය පදනම් කරගෙන පැවති ඉන්දියාව ද, සේවා අංශය පදනම් ආර්ථිකයකට හැරෙමින් පවතින අතර "Make in India" යන තේමාව යටතේ 2014 වසරේ දී ආරම්භ කළ වැඩසටහනක් මගින් නිෂ්පාදන අංශය කඩිනමින් සංවර්ධනය කිරීමට ප්‍රතිඥා දී ඇත.

**සංඛ්‍යා සටහන වි.ස. 3.2**

**තෝරා ගත් රටවල කාර්මික නිපැයුම් අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ඇති දායකත්වය**

(%)

| රට | 1975 | 1980 | 1985 | 1990 | 1995 | 2000 | 2005 | 2010 | 2013 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 13.1 | 18.3 | 18.2 | 17.4 | 20.4 | 15.8 | 16.3 | 17.3 | 15.7[1] | 15.4[1] |
| ජපානය | - | 27.2 | 27.5 | 25.9 | 21.5 | 20.4 | 19.1 | 18.9 | 17.7 | - |
| දකුණු කොරියාව | 20.3 | 22.8 | 25.2 | 25.0 | 25.3 | 29.0 | 28.3 | 30.7 | 31.0 | 29.5 |
| තායිවානය | - | - | 35.1 | 31.2 | 25.6 | 25.7 | 27.9 | 29.0 | 28.6 | 29.9 |
| චීනය | 37.6 | 39.9 | 34.4 | 32.3 | 33.4 | 31.8 | 32.1 | 31.5 | 29.7 | - |
| තායිලන්තය | 18.7 | 21.5 | 21.9 | 27.2 | 26.5 | 28.6 | 29.8 | 31.1 | 27.7 | 26.9 |
| ඉන්දුනීසියාව | 10.3 | 14.0 | 16.4 | 22.3 | 24.1 | 27.7 | 27.4 | 22.0 | 21.0 | 20.8 |
| මලයාසියාව | 18.7 | 21.9 | 19.7 | 24.2 | 26.6 | 30.9 | 27.5 | 23.4 | 22.8 | 22.8 |
| වියට්නාමය | - | - | 20.5 | 12.3 | 15.0 | 17.1 | 18.8 | 12.9 | 13.3 | 13.7 |
| පිලිපීනය | 25.7 | 25.7 | 25.2 | 24.8 | 23.0 | 24.5 | 24.1 | 21.4 | 20.4 | 20.1 |
| ඉන්දියාව | 15.2 | 16.2 | 16.0 | 16.2 | 17.3 | 15.3 | 15.4 | 17.5 | 16.5 | 16.2 |

මූලාශ්‍ර: ලෝක බැංකුවේ ලෝක සංවර්ධන දර්ශක
තායිවානයෙහි ජාතික සංඛ්‍යාලේඛන
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහත සඳහන් ඇතැම් රටවල් සිය කාර්මික ප්‍රතිපත්ති පවත්වාගෙන යෑමේ දී, තෝරාගත් කර්මාන්තවල අසාර්ථක වීම්, පාරිභෝගික භාණ්ඩ සම්බන්ධ මිල ඉහළයෑම, ගෝලීය ඉල්ලුම අඩු වීම තුළින් ඇති වන සාර්ව ආර්ථික අසමතුලිතතා වැනි නොයෙක් බාධකවලට මුහුණ දීමට සිදු විය. නමුත් එම රටවල නොකඩවා හැඩගැසෙමින් වර්ධනය වූ නිෂ්පාදන කර්මාන්ත අංශ පැවති හෙයින් වේගවත් ආර්ථික හා සමාජයීය සංවර්ධනයක්, දිගු කාලයේ දී අත්කර ගත හැකි විය. මෙයින් පැහැදිලි වන්නේ රජය විසින් සමස්ත නිෂ්පාදන අංශයට ම සැපයූ පුළුල් අනුග්‍රාහකත්වය නිසා නිෂ්පාදන අංශයේ මුළු නිමැවුම වර්ධනය වූ බවය. ඉලක්ක කරගත් යටිතල පහසුකම් සංවර්ධනය, පර්යේෂණ හා සංවර්ධන කටයුතු, මානව සම්පත්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා රජයෙන් ලැබුණු දිරිදීම් යනාදිය එවන් රාජ්‍ය අනුග්‍රහවලට ඇතුළත් විය. මෙකී අන්තර්ජාතික අත්දැකීම්වලින් ශ්‍රී ලංකාවට ලබා ගත හැකි ආදර්ශය වන්නේ සංවර්ධනය සඳහා නිෂ්පාදන කර්මාන්ත අංශයට විශාල දායකත්වයක් කළ හැකි බවත්, එම අංශය වර්ධනය කිරීමට රජය විසින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් මැදිහත්වීම අවශ්‍ය වන බවත්ය.

**නිසි උපායමාර්ග දියත් කිරීම**

ශ්‍රී ලංකාවේ සෑම රජයක් විසින්ම කර්මාන්තශාලා නිපැයුම් වැඩි කිරීම සඳහා විවිධ ක්‍රමෝපායයන් දියත් කොට ඇත. මෑතක දී, කාර්මික කලාප රැසක් විවිධ පළාත්වල ද, නව අධිවේගී මාර්ග ආශ්‍රිතව ද, හම්බන්තොට හා ත්‍රිකුණාමල වරායන් ආශ්‍රිතව ද ස්ථාපනය කිරීමට සැලසුම් සකසා ඇත. මෙම සැලසුම්, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, පර්යේෂණ හැකියා වැඩිදියුණු කිරීම, ශ්‍රම බලකායේ හැකියා වර්ධනය කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම ආදිය සඳහා පිහිටුවා ඇති විවිධ රාජ්‍ය ආයතන මගින් සකසා ඇති අනෙකුත් සැලසුම් ද සමග එක් වී, විදේශීය ඍජු ආයෝජන ලබාගෙන, කර්මාන්තශාලා නිපැයුම් වැඩි කිරීමට හැකි වෙයැයි බලාපොරොත්තු විය හැකිය. ඒ අතරම, සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති උපායමාර්ගවල වැදගත්කම වටහා ගෙන, රජය විසින් සමස්ත සංවර්ධන උපායමාර්ගයක් සකස් කොට, වෙළඳ කටයුතු සහ අපනයන ප්‍රතිපත්ති සකස් කිරීමෙහි ද නියුක්ත වී සිටී. එනමුත්, නිෂ්පාදන කටයුතු වර්ධනය කිරීම සඳහා විවිධ රාජ්‍ය ආයතන දරන විවිධ ප්‍රයත්න ඒකාරාශී කොට රටේ සංවර්ධන ප්‍රතිපත්තියට ගළපා, නිෂ්පාදන අංශයට නිසි මූලිකත්වයක් ලබා දෙමින් එම අංශයේ ව්‍යුහාත්මක ගැටලුවලට විසඳුම් සපයන පුළුල් නිෂ්පාදන අංශ සංවර්ධන උපායමාර්ගයක් සඳහා තවමත් අවධානය යොමු වී නොමැත. එම නිසා එවන් උපායමාර්ගයක් සකස් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.

ශ්‍රී ලංකාවේ සමස්ත කාර්මික නිෂ්පාදන අංශය යළි නඟාසිටුවීම සඳහා නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීමේ එක් ප්‍රායෝගික උපායමාර්ගයක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. අදාළ සියලු පාර්ශවවල සහභාගිත්වය ඇතිව සකස් කළ හා පැහැදිලිව කෙටුම්පත් කළ නිෂ්පාදන අංශ සංවර්ධන ප්‍රතිපත්තියක්, දේශීය හා විදේශීය ආයෝජකයන්ට දිගුකාලීන දැක්මක් ලබා දීම සඳහා රජයට උපයෝගී කර ගත හැකි උපායමාර්ගයක් වනු ඇත. එම නිෂ්පාදන අංශ සංවර්ධන උපායමාර්ගය රටේ සංවර්ධන සමස්ත ප්‍රතිපත්තියේ කොටසක් විය යුතුය. අන්තර්ජාතික වෙළඳාම් හා අපනයන උපායමාර්ග, එම නිෂ්පාදන අංශ සංවර්ධන උපායමාර්ගයේ උපාංග විය යුතු අතර, එම සංවර්ධන

ක්‍රියාදාමය අන්තර්ජාතික වෙළඳාම ශක්තිමත් කරනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා සංවර්ධනය වේගවත් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. කාර්මික නිෂ්පාදන අංශ සංවර්ධන උපායමාර්ගය තුළ කර්මාන්ත අංශයට කෘෂිකාර්මික හා සේවා අංශ සමඟ ඇති සහසම්බන්ධතාවය ද අවධානයට ලක් කළ යුතුව ඇත. විශේෂයෙන්ම, කෘෂි අංශයේ ඵලදායීතා වර්ධනය, එම අංශයේ ඌන උපයෝජනයට ලක්ව ඇති ශ්‍රමය කර්මාන්ත අංශයට විතැන් කිරීම තුළින් පමණක් නොව ජනතාවගේ සමස්ත ආදායමෙන් ආහාර සඳහා වන වියදම අඩු කොට, අනෙකුත් භාණ්ඩ සඳහා වැය කිරීමට හැකි මූර්ත ආදායම වැඩි කර, නිෂ්පාදන භාණ්ඩ සඳහා දේශීය ඉල්ලුම වැඩි කිරීම තුළින් ද, කර්මාන්ත අංශයේ වර්ධනය මත බලපෑමක් ඇති කරයි.

නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීමේ උපායමාර්ගය තුළින් දේශීය මෙන්ම විදේශීය ආයෝජකයින්ගේ අවශ්‍යතා වෙන් වශයෙන් හඳුනා ගෙන කටයුතු කළ යුතුය. ඒ සමඟම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ආයතනවල එකිනෙකට වෙනස් අවශ්‍යතා වෙන් වශයෙන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග දියත් කළ යුතුය. දේශීය ඉතුරුම් අඩු මට්ටමක පැවතීමත්, අයවැය හිඟය නිසා රජයේ මැදිහත්වීම අවම මට්ටමක පවත්වා ගැනීමත් නිසා කර්මාන්ත අංශය නංවාලීමට විදේශීය ආයෝජන ලබා ගැනීම ඉතා වැදගත් වේ. විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකාවට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා ගැනීමට ද රුකුලක් වේ. ශ්‍රී ලංකාවට නිෂ්පාදන හැකියාව දියුණු කර ගැනීමට උත්සාහ දරන, තාක්ෂණයෙන් අධික, ඉහළ එකතු කළ අගයක් සහිත භාණ්ඩ වැඩි වශයෙන් නිෂ්පාදනය වන්නේ විවිධ රටවල ස්ථාපනය වන ගෝලීය අගය දාම තුළින් ය. එවන් භාණ්ඩවල නිපැයුම්කරුවන් විසින් නිෂ්පාදන අගය දාමයේ විවිධ පියවර, ඒවා එකිනෙක සඳහා හොඳම හැකියාවක් ඇති රටවල ස්ථාපනය කරනු ලැබේ. මෙවන් ප්‍රවණතාවක් ගෝලීය ආර්ථිකයේ දැකිය හැකි වුව ද, ශ්‍රී ලංකාවට පසුගිය දශකය තුළ ගලා ආ විදේශීය සෘජු ආයෝජන බොහොමයක් අපනයනය සඳහා භාණ්ඩ හෝ භාණ්ඩ කොටස් නිෂ්පාදනය සඳහා වන විදේශීය සෘජු ආයෝජන නොව රට තුළ ගොඩනැගිලි ඉදිකිරීමට සංචාරක ව්‍යාපාරය හා ලාංකික වෙළඳපොළ සඳහා භාණ්ඩ හා සේවා සැපයීම පරමාර්ථ කරගත් විදේශීය සෘජු ආයෝජන විය. එම නිසා, අනාගත නිෂ්පාදන අංශ සංවර්ධන උපායමාර්ගය තුළින් ශ්‍රී ලංකාව වෙත අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා වන විදේශීය සෘජු ආයෝජන ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා කාර්මික නිෂ්පාදන අංශ සංවර්ධන උපායමාර්ග මගින් විදේශීය ආයෝජන ප්‍රවාහ සඳහා බලපාන සාධක හඳුනාගෙන, ඒ සඳහා සුදුසු පරිසරයක් ලංකාව තුළ ගොඩනැංවීම වැදගත් වේ. විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහ, ඒවා ජනිත වන රටවල් ද ලබා ගන්නා රටවල් ද ආශ්‍රිත සාධක මත තීරණය වේ. සාමාන්‍යයෙන්, විදේශීය සෘජු ආයෝජන ලබා ගන්නා රටවල්වලට අදාළ සාධක වන්නේ අඩු ශ්‍රම වියදම්, අමුද්‍රව්‍ය සුලභ වීම, වෙළඳපොළවල් වෙත ප්‍රවේශ වීමට ඇති පහසුකම්, තරගකාරී විදේශ විනිමය අනුපාතික මත, බදු බර අඩු වීම, කර්මාන්තශාලා සඳහා ඉඩකඩම් පැවතීම යනාදියයි. දේශපාලන ස්ථාවරත්වය, රාජ්‍ය ආයතනවලින් ලැබෙන අනුග්‍රහය නොකඩවා පැවතීම, භාණ්ඩ ප්‍රවාහනය හා ගබඩා කිරීම සම්බන්ධ යටිතල පහසුකම් හා පහසුකම් සේවාවල කාර්යක්ෂමතාව, යහපත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් පැවතීම, වෙළඳ සම්බාධක අවම වීම, ශ්‍රම කාර්යක්ෂමතාව සහ කර්මාන්තශාලා සමූහගතව පිහිටුවා තිබීමෙන් ලැබෙන පිරිමැසුම් (Agglomeration Economies) යනාදිය විදේශීය සෘජු ආයෝජන සඳහා හිතකර පරිසරයකට බලපාන සාධක වේ. ගෝලීය අගයදාම මගින් භාණ්ඩ නිෂ්පාදනය කරන සැපයුම්කරුවන් හට, භාණ්ඩ කොටස් එක් ස්ථානයක සිට තවත් ස්ථානයක් දක්වා ඉක්මනින් හා කාර්යක්ෂමව ප්‍රවාහනය කළ යුතු නිසා, එවන් සැපයුම්කරුවන් හට මහාමාර්ග හා නාවික ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවය, තොටුපළවල්වලට කඩිනමින් ළඟා වීමට හැකි වීම, රේගුවේ භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය, සුදුසු ගබඩා පහසුකම් පැවතීම සහ තීරුබදු හා බදු නොවන වෙළඳ සම්බාධක අවම වීම හා සරල වීම ඉතා වැදගත් වේ. මීට පෙර, දියුණු රටවල්වලින්, සංවර්ධනය වන රටවල් වෙතට අඩු ශ්‍රම වියදම් හා අමුද්‍රව්‍ය සොයා ගෙන ආයෝජන ගලා ආවේය (උතුරු-දකුණු විදේශීය සෘජු ආයෝජන). එනමුත්, පසුගිය දශකයේ දී නැගී එමින් පවතින රටවල් අතර එනම් දකුණු-දකුණු විදේශීය සෘජු ආයෝජන, චීනය, මලයාසියාව, ඉන්දියාව හා රුසියාව වැනි රටවල සිට වෙනත් ආර්ථික දක්වා ගලා ඒම වැඩි වී ඇත. එවැනි රටවල් සඳහා වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව හා අමුද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීම මූලික අවශ්‍යතා වන අතර, දියුණු වූ රටවල්වල ආයෝජකයන්ට වඩා වෙනස් ආකල්ප ආයෝජන ලබන රටවල පොදු හා සාමාජීය ආයතන සම්බන්ධයෙන් දරන බව පෙනේ. එම නිසා, ශ්‍රී ලංකාව විසින් විදේශීය සෘජු ආයෝජන ගලා එන විවිධ රටවල ආයෝජකයන්ගේ විශේෂිත අවශ්‍යතාවලට අනුකූලව පහසුකම් සම්පාදනය කළ යුතුව ඇත.

විදේශීය ආයෝජනවලින් පමණක් ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදන අංශය, දිගුකාලීන සංවර්ධන මාර්ගයකට යොමු කළ නොහැකිය. ඒ සඳහා දේශීය නිෂ්පාදිකයන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. දේශීය නිෂ්පාදකයන් කෙටිකාලයේ දී විදේශ ආයෝජකයන්ට අවශ්‍ය සේවා සැපයීම කළ යුතු අතර, දිගු කාලයේ දී විදේශ නිෂ්පාදකයන්ගෙන් විතැන් වන තාක්ෂණය අවශෝෂණය කර ගත යුතුය. ශ්‍රී ලාංකික සමාගම් සමහරක් (විශේෂයෙන් තේ හා ඇඟලුම් අපනයනය සම්බන්ධ) අන්තර්ජාතික විශිෂ්ටත්වයක් ලබා ඇති වුවත්, ලාංකික නිෂ්පාදන ආයතන බොහොමයක් අඩු ඵලදායිතාවයෙන් ද, අඩු වර්ධනයෙන් ද පීඩාවට ලක්ව සිටී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සකස් කරනු ලබන, කර්මාන්තශාලා සතු ධාරිතා උපයෝජන දර්ශකයට අනුව, 2011 සිට 2016

දක්වා, කර්මාන්තශාලා සතු ධාරිතාවයෙන් සියයට 83.0 කට වඩා උපයෝජනය කර නොමැත. ඒ අතර, කර්මාන්ත අංශයේ ද, කෘෂිකාර්මික අංශයේ ද එකතු කළ අගයන්ගේ ප්‍රතිශත, එම අංශවල සේවයේ නියුතු ශ්‍රම බලකායන්ගේ ප්‍රතිශත වලට සමානුපාතිකව සලකන විට, 1981 සිට 2016 දක්වා ක්‍රමයෙන් අඩු වී ඇත. එයින් පෙන්නුම් කරනුයේ ශ්‍රම බලකායෙන් වඩා විශාල ප්‍රතිශතයක්, කුඩා එකතු කළ අගයක් ජනිත කිරීමට යොදවා ඇති බවයි. එම නිසා කර්මාන්ත අංශයේ ද, කෘෂිකර්මාන්ත අංශයේ ද ශ්‍රම ඵලදායීතාවය ක්‍රමයෙන් අඩු වී ඇත. තවද, 1990 සිට 2010 දක්වා කර්මාන්තශාලා රාශියක් අධ්‍යයනය කළ ආර්ථික පර්යේෂණයක්[4] තුළින් පෙන්වා දී ඇත්තේ කරර්මාන්තශාලා "මුළු සාධක ඵලදායීතාවය" ද (Total Factor Productivity) අඩු වී ඇති බවයි. එමනිසා, අඩු ඵලදායීතාවයකින් යුත් කෘෂි කර්මාන්තයෙන්ද, සේවා අංශවල (සුළු වෙළඳාම, පෞද්ගලික සේවා හා රාජ්‍ය සේවා වැනි), ඌන සේවා නියුක්තියට ලක්ව ඇති සේවකයින් කර්මාන්ත නිෂ්පාදන අංශයට යොමු කිරීමට අවශ්‍ය ක්‍රමවේද නිෂ්පාදන කර්මාන්ත ප්‍රතිපත්තිය තුළ අඩංගු විය යුතුය. මේ සඳහා සුළු පරිමාණ ගොවිතැන් කටයුතු, මහා පරිමාණ කෘෂිකාර්මික කටයුතු බවට පරිවර්තනය කිරීම සඳහා ප්‍රතිපත්ති සැකසීම වැදගත් වේ. කර්මාන්තශාලාවල මුළු සාධක ඵලදායීතාව වැඩි කිරීම සඳහා සේවක හැකියා වර්ධනය, කළමනාකරණ ක්‍රම වැඩිදියුණු කිරීම හා ව්‍යාපාර ප්‍රතිසංවිධානය වීමට ඇති බාධක ඉවත් කිරීම ආදිය සඳහා ද ප්‍රතිපත්ති සකස් විය යුතුය.

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කර්මාන්ත අංශය වර්ධනය නොවන නමුත්, ව්‍යාපාරවලින් ඉවත් නොවන සුළු පරිමාණ කර්මාන්තායතන අතිවිශාල සංඛ්‍යාවකින් සෑදී තිබීම, ශ්‍රමය හා අනෙකුත් සම්පත් ඵලදායීතාවයෙන් අඩු ක්‍රියාකාරකම්වල රඳවා තැබීමට හේතු වන බව ලෝක බැංකුව විසින් කර ඇති අධ්‍යයනයකින්[5] පෙන්වා දී ඇත. වර්ධනය නොවන කුඩා ව්‍යවසායයන්, වඩා විශාල කර්මාන්ත මෙන් භාණ්ඩ හා ක්‍රියාකාරකම් සම්බන්ධ නවෝත්පාදනයක නිරත නොවන නිසා හා ගුණාත්මක බවින් වැඩි රැකියා අවස්ථා ඇති නොකරන නිසා, රටේ දිගුකාලීන ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා දායක නොවේ. මෙම අධ්‍යයනය මගින්, ශ්‍රී ලංකාවේ ව්‍යවසායයන්ගෙන් සියයට 76.0 ක් ම සේවකයින් 19 දෙනෙකුට වඩා අඩු පිරිසකගෙන් සැදුම්ලත් ව්‍යවසායයන් බවට ඇස්තමේන්තු කර ඇති අතර මෙම අගය ඉන්දියාව, චීනය, බංග්ලාදේශය, පාකිස්ථානය, පිලිපීනය හා වියට්නාමය වැනි රටවල්වලට වඩා විශාල වන බව පෙන්වා දෙයි. තවද, ශ්‍රී ලංකාවේ අවුරුදු 25 කට වඩා පැරණි ව්‍යවසායවල පරිණතවීම හා වර්ධනය, අවුරුදු 5 කට පෙර ආරම්භ කළ ව්‍යවසාය (එනම්, පැරණි නොවන) සමඟ සසඳන විට, එම පැරණි ව්‍යවසායවල, නව ව්‍යවසායවලට වඩා සියයට 50.0 ත් 90.0 ත් අතර තරම් සුළු ප්‍රමාණයකින් විශාල බවද මෙම අධ්‍යයනය මගින් ඇස්තමේන්තු කරන අතර, සංවර්ධිත රටවල් හා සසඳන විට, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ආයතන, කාලයක් සමඟ පරිණත/විශාල වීම ඉතා අවම බව සඳහන් කරයි. සාමාන්‍යයෙන් විශාල ආයතන, පරිමාණානුකූල පිරිමැසුම්, අරමුදල් ලබාගැනීමට ඇති හැකියාව වැඩිවීම, වඩා හොඳ කළමනාකරුවන් සොයා ගැනීමට ඇති හැකියාව, වෙළඳපොළ සොයා ගැනීමට වඩා විශාල සම්බන්ධතා ජාල පවත්වා ගෙන යෑම, විස්තරාත්මක වාර්තා හා ගිණුම් තබා ගැනීම නිසා වඩා සාර්ථක උපායමාර්ග සැකසීමට හැකිවීම වැනි හේතු නිසා කුඩා ආයතනවලට වඩා ඵලදායී වෙයි.[6] එමනිසා, ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ආයතනවලට වර්ධනය වීමට ඇති බාධක, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ඉවත් කිරීම වැදගත්ය. ඒ සඳහා, ප්‍රාග්ධන අරමුදල් ලබාගැනීමට ඇති බාධක ඉවත් කිරීම භෞතික ඇපකර වෙනුවට ව්‍යාපෘති ශක්‍යතාව අනුව ණය දීම සඳහා මූල්‍ය ආයතන දිරිගැන්වීම, සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට එරෙහිව ඇති රෙගුලාසි වෙනස් කිරීම, ව්‍යාපාරවල ගිණුම් හා වාර්තා තබාගැනීමේ හැකියාවන් වර්ධනය කිරීම, ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම අධෛර්ය කරවන බදු තාර්කීකරණය කිරීම ආදී ක්‍රියාමාර්ග වැදගත් වෙයි. පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අතර ශක්තිමත් සහයෝගීතාවයක් පවත්වා ගෙන යෑම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල පර්යේෂණ අවශ්‍යතා මෙම ආයතනවලට දැනුම් දී, පර්යේෂණ සොයා ගැනීම් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල වැඩිදියුණුව සඳහා භාවිතා කිරීමේ සඵලදායී හා කාර්යක්ෂම ක්‍රමවේද දියත් කිරීම ද වැදගත්ය. තවද, ශ්‍රී ලංකාව සතු ස්වාභාවික සම්පත් බොහොමයක් අමුද්‍රව්‍ය ලෙස හෝ අවම අගයක් එකතු කළ භාණ්ඩ ලෙස දැනට අපනයනය කෙරෙන බැවින්, ඖෂධ පැළෑටි, ඛනිජ සම්පත්, ඇතුළු ස්වාභාවික සම්පත් යොදා ගෙන ඉහළ එකතු කළ අගයක් ඇති භාණ්ඩ නිපදවීම පිළිබඳව පර්යේෂණ හා සංවර්ධන ආයතන උත්සුක විය යුතුය. කුඩා පරිමාණ ව්‍යාපාර ආයතන, විශාල කර්මාන්තවලට පරිවර්තනය වන තෙක් අඩු මිලකින් යුත් ආනයනවලින් ඇති වන තරගකාරිත්වයෙන් ආරක්ෂා කිරීම ද අවශ්‍ය වේ. එම නිසා මේ සම්බන්ධයෙන් සකසා ඇති ප්‍රපාතන විරෝධී කෙටුම්පත (Anti - dumping Bill) කඩිනමින් නීතිගත කිරීම වැදගත්ය. තව ද, ව්‍යාපාර අතර යහපත් මට්ටමක තරගකාරීත්වයක් පවත්වා ගැනීමට ඉඩ සලස්වා ඒ තුළින් ව්‍යාපාරවලට අවශ්‍ය විට දී

4 Chandrasiri, Sunil, and Nuwan Indika. "Industrial Productivity for Sustained Growth: The Case of Sri Lankan Manufacturing Industries". *Way Forward For Sustained Growth*. A D V de S Indrarathna, S Widanagama and A Wijesinghe. Colombo: Sri Lanka Economic Association, 2014. 139-164. Print.

5 Varela, Gonzalo, Antonio Martuscelli, and Apoorva Gupta. "Improving competitiveness is about raising productivity rather than keeping costs low". *South Asia's Turn: Policies to Boost Competitiveness and Create the Next Export Powerhouse*. Gladys Lopez-Acedevo, Denis Medvedev and Vincent Palmade. The World Bank, 2017. 17-35. Web. 28 Mar. 2017.

6 Altenburg, Tilman, and Wilfried Lütkenhorst. *Industrial policy in developing countries: Failing markets, weak states*. Edward Elgar Publishing, 2015.

ප්‍රතිසංවිධානය වීමට, සේවකයන් සේවයෙන් ඉවත් කිරීමට, හෝ බුන්වත්භාවය ප්‍රකාශ කර කර්මාන්තයෙන් ඉවත් වීමට, රෙගුලාසි තුළින් ඉඩ සලසා දී, ඒවායේ යොදවා තිබූ සම්පත් වඩා ඵලදායී කාර්යයන්ට ගලා යෑමට අවශ්‍ය පරිසරය සැකසිය යුතුය. දැනට සාකච්ඡා මට්ටමේ පවතින ආර්ථික සහයෝගීතා ගිවිසුම් සඳහා සහයෝගී ප්‍රතිපත්තියක් ලෙස ඉදිරිපත් වී ඇති වෙළඳ ගැලපුම් යෝජනාවලිය ද දේශීය කර්මාන්ත සම්බන්ධයෙන් වැදගත්කමක් උසුළයි. මෙය දේශීය කර්මාන්තවල තරගකාරීත්වය වැඩිදියුණු වන ලෙස මනාව සැකසීම තුළින්, ජාත්‍යන්තර වෙළඳාම තවත් විවෘත/ලිහිල් වීම නිසා දුෂ්කරතාවට ලක්වන සේවකයන්ට රැකියා පුහුණු අවස්ථා ලබා දීමට මඟ පෑදිය හැකිය.

නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීමේ උපායමාර්ගය යටතේ පොකුරු ලෙස ව්‍යාපාර ස්ථානගත කිරීම ආශ්‍රිත කාර්මීකරණ ප්‍රතිපත්ති (Cluster-based Industrial Development) ක්‍රියාත්මක කර එසේ සමූහගත වීමෙන් ලැබෙන පිරිමැසුම් (Agglomeration Economies) ලබා ගැනීමට අවස්ථාව සලසා දිය යුතුය. එක හා සමාන නිෂ්පාදකයන්ට සමූහගතව කර්මාතශාලා පිහිටුවා ගෙන, සේවා සපයන්නන්ට ද ඒ අවට රැස්ව ව්‍යාපාර ආයතන පිහිටුවා ගෙන, එසේ පොකුරු ලෙස සමූහගත වීමට අවස්ථාව සලසා දීම මගින් මෙම පිරිමැසුම් ලබා ගත යුතුව ඇත. එසේ වූ විට රජයට ද කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම (ඉලක්කගත යටිතල පහසුකම්, රාජ්‍ය මූල්‍ය දිරි දීමනා හා සේවකයන් සඳහා පහසුකම්), වඩා ඵලදායීව සිදු කළ හැකිය. අමුද්‍රව්‍ය සඳහා පරිමාණානුකූල පිරිමැසුම් ලැබීම, එක හා සමාන කර්මාන්ත සමඟ එක්ව කටයුතු කිරීම, සේවකයන් රාශියක් කර්මාන්තශාලා අවට එක්රැස්ව සිටීම, ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීමේ පහසුකම් යනාදිය, කර්මාන්තවලට සමූහගත වීමෙන් අත්වන වාසි වේ. කර්මාන්තශාලා හා පහසුකම් සේවා සපයන්නන්ට පොකුරු ලෙස සංවිධානය වීම පිණිස විශාල ඉඩම් ලබා දීම විදේශීය ඍජු ආයෝජන ලබා ගැනීමට අත්‍යවශ්‍ය මූලික අංගයක් වී ඇත. නාගරික ප්‍රදේශවලින් බැහැරව කර්මාන්තපුර ගොඩනැගීම මගින්, රජයට, කාර්මීකරණයේ ප්‍රතිඵල ඌන සංවර්ධනයක් ඇති දුරස්ථ ප්‍රදේශවලට ලබාදීමට හැකි වෙයි.

ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව හා කර්මාන්තශාලා සේවකයකුගේ සාමාන්‍ය අධ්‍යාපන මට්ටම, ශ්‍රී ලංකාව සමඟ තරග කරන අනෙකුත් රටවල්වලට වඩා සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක පැවතිය ද, සංකීර්ණ භාණ්ඩ නිපදවීමට අවශ්‍ය ශිල්පීය හැකියාවන් හා නවෝත්පාදන හැකියාවන් මෙරට සේවකයන් තුළ සාපේක්ෂව අඩුය. එමනිසා, තාක්ෂණික හා වෘත්තීයමය පුහුණුවීම් පාඨමාලා ද, විද්‍යා හා ඉංජිනේරු සුදුසුකම් ද ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන මට්ටම්වල දී, සිසුන් බහුතර සංඛ්‍යාවකට සැපයිය යුතු අතර, ඔවුන්ට කර්මාන්තශාලාවල පුහුණුවීම් අවස්ථා ද ලබාදිය යුතුය. තවද, කර්මාන්තශාලා සේවකයින් සම්බන්ධයෙන් සමාජයේ පවත්නා අයහපත් ආකල්ප නිවැරදි කළ යුතුය. එමෙන්ම, සේවකයන්ට කර්මාන්තශාලාවල සේවයට යොමු නොවීමට වඩා රාජ්‍ය අංශයේ සේවා අවස්ථා සෙවීමට ඇති පෙළඹීම ද නිවැරදි කළ යුතුය.


නිෂ්පාදන අංශයේ සංවර්ධන උපායමාර්ගය යනු, නිෂ්පාදන උප අංශ කිහිපයකින් කර්මාන්ත කිහිපයක් පමණක් හුදෙක් අපනයනය ඉලක්ක කරගෙන දිරිගැන්වීමේ ක්‍රමයක් නොවන බව අවධාරණය කළ යුතු වෙයි. දකුණු කොරියාව කර්මාන්ත කිහිපයක් පමණක් තෝරා ගෙන ඒවා දියුණු කිරීමෙහිලා සාර්ථක ප්‍රතිඵල අත්කර ගනු ලැබුවද එසේ කළ තවත් රටවල් රාශිකට සිදු වූයේ නොකඩවා දිගින් දිගටම එම කර්මාන්තවලට රාජ්‍ය අනුග්‍රහය ලබාදී ඒවා රැක ගැනීමටය. රජයකට මධ්‍ය හා දිගුකාලීන දේශීය හා අන්තර්ජාතික වෙළඳපොළ ප්‍රවණතා පුරෝකථනය කිරීමට නොහැකි නිසාත් පෞද්ගලික අංශය රජයෙන් අනවශ්‍ය ප්‍රතිලාභ ලබා ගැනීමට පෙළඹීම වැළැක්විය යුතු නිසාත් එවන් කර්මාන්ත කිහිපයක් තෝරා අනුග්‍රහය දැක්වීමක් නොකළ යුතුය. රජයේ අවධානය යොමු විය යුත්තේ සමස්ත නිෂ්පාදන අංශයටම හා සියලු වර්තමාන මෙන්ම අනාගත පාර්ශවවලට, පැහැදිලි හා නොවෙනස් වන ප්‍රතිපත්තියක් තුළින් පුළුල් අනුග්‍රහයක් ලබාදීමටත්, පෞද්ගලික අංශය සඳහා සුදුසු යහපත් වාතාවරණයක් රට තුළ ගොඩනැගීමත් උදෙසා ය. කාර්මික නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීමේ උපායමාර්ගය අනිවාර්යයෙන්ම සාකල්‍ය විය යුතු අතර සෑම අදාළ අංගයක්ම එයට ඇතුළත් විය යුතුය. සැලසුම් කළ ක්‍රියාමාර්ග, කඩිනමින් ක්‍රියාවට නැංවීම මත, මෙම උපායමාර්ගයේ සාර්ථකත්වය තීරණය වනු ඇත.

වසා තිබුණු අතර, 2016 වසර තුළ දී කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව පිරිපහදු ක්‍රියාවලිය පවත්වාගෙන යෑම මෙම වර්ධනයට හේතු විය. 2016 වසරේ ජනවාරි මස තුළ දී ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරානය මත පනවන ලද වෙළඳ සම්බාධක ඉවත් කිරීමත් සමඟ ඉරානයෙන් ආනයනය කරන ලද සැහැල්ලු බොර තෙල් පිරිපහදු කිරීම සඳහා වඩා උචිත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව, 2017 වසරේ දී වඩා කාර්යක්ෂමව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ප්‍රධාන වශයෙන්ම, පොහොර නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් රසායන ද්‍රව්‍ය සහ රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදිත උප අංශයෙහි නිමැවුම 2016 වසර තුළ දී සියයට 12.4 කින් පහත වැටුණි.** වසරේ දෙවන භාගය තුළ දී කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා අයහපත් බලපෑමක් ඇති කරන ලද නියඟ තත්ත්වය සහ 2016 වසර මුල් කාලයේ දී පොහොර සහනාධාර ලබා දීමේ ක්‍රමය සංශෝධනය කිරීම හේතුවෙන් ඉල්ලුම අඩු වීම පොහොර නිෂ්පාදනය පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, වසර තුළ දී ඉදිකිරීම්

2

**2.6 රූප සටහන**
**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ සංයුතිය - 2016**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කටයුතුවලින් ඇති වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් තීන්ත සහ වාර්නිෂ් නිමැවුම ඉහළ යෑම මෙම උප අංශයෙහි වර්ධනයට ධනාත්මකව දායක විය.


**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයෙහි තෙවන විශාලතම උප අංශය වන රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත උප අංශය පසුගිය වසර හා සැසඳීමේ දී 2016 වසර මුළුල්ලේම හිතකර ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කළේය.** 2015 වසරේ මෙම උප අංශය වාර්තා කළ සියයට 2.2 ක පසුබෑම හා සාපේක්ෂව 2016 වසරේ දී සියයට 5.4 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. ඝන ටයර් සහ වායු ටයර් සඳහා ප්‍රධාන වශයෙන්ම ඇමරිකා එක්සත් ජනපදය, ජර්මනිය, බ්‍රසීලය වැනි රටවලින් ඇති වූ ඉහළ අපනයන ඉල්ලුම මෙම වර්ධනයට හේතු විය. දැනට පවත්නා ලාභාන්තික ජාත්‍යන්තර වෙළඳ තරගකාරිත්වය පවත්වා ගැනීමට ප්‍රමාණවත් වන හෙයින් 2016 වසරේ දී ශ්‍රී ලංකාවේ රබර් අපනයන මත ඇමරිකා එක්සත් ජනපදය මගින් පනවනු ලැබූ ප්‍රතිතෝලන බදු අපනයන ධාරිතාව මත දැඩි බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. ඉන්ධන කාර්යක්ෂමතාව කෙරෙහි වැඩි අවධානයක් ඇති වීම හේතුවෙන් අධි ඉන්ධන පිරිමැසුම් ටයර් සඳහා වන ඉල්ලුම ඉහළ යනු ඇතැයි ද එමගින් එවැනි වර්ගයේ ටයර් සඳහා වන ගෝලීය ඉල්ලුම ඉහළ යෑමට හේතු වනු ඇතැයි ද අපේක්ෂිතය. එහි ප්‍රතිඵලයක් ලෙස ටයර් නිෂ්පාදන තාක්ෂණයේ පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන මත සිදු කරන ආයෝජනවල ඉහළ යෑමක් අවශ්‍ය වනු ඇත. එසේ වුවත්, ප්‍රතිතෝලන බදු, ශ්‍රී ලංකාව තුළ නව ටයර් කර්මාන්තශාලා ආරම්භ කිරීමට අපේක්ෂා කරන ආයෝජකයන් අධෛර්යවත් කිරීමට හේතු වනු ඇත. එබැවින්, දේශීය රබර් කර්මාන්තකරුවන් මෙම නැඟී එන වෙළඳපොළ අවස්ථා අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුව ඇත. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත උප අංශයේ වර්ධනයට උපකාරී වෙමින්, ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය වෙළඳපොළ සඳහා වූ අපනයන ඉහළ යෑම හමුවේ රබර් අත්වැසුම් කර්මාන්තය ද ප්‍රසාරණය විය.

**අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත උප අංශය සියයට 11.1 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කරමින් එහි වර්ධන ප්‍රවණතාව 2016 වසර තුළ දී ද අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබීය.** ඉදිකිරීම් අංශයෙන් සිමෙන්ති සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම නිසා සිමෙන්ති නිෂ්පාදනයෙහි සිදු වූ වර්ධනය මෙම ක්‍රියාකාරිත්වය සඳහා බලපෑ ප්‍රධානතම සාධකය විය. තවද, සෙවිලි තහඩු සහ උළු කර්මාන්තය ද 2016 වසර තුළ දී සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. විදේශ සහ දේශීය ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් පිඟන් මැටි සහ පෝසිලේන් නිෂ්පාදිතවල නිමැවුම් ද අදාළ කාලපරිච්ඡේදය තුළ දී සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව තුළ වීදුරු නිෂ්පාදනය කරනු ලබන එකම කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදන ධාරිතාව යන්ත්‍ර නවීකරණය කිරීමේ දී තාවකාලිකව අඩු වීම හේතුවෙන් වීදුරු නිෂ්පාදිත නිමැවුම පහළ ගියේය. විශේෂයෙන්ම, ආහාර, පාන වර්ග සහ ඖෂධ ආශ්‍රිත වීදුරු ඇසුරුම් කර්මාන්තය මෑත කාලීන වසරවල අත්පත් කරගත් වර්ධන ප්‍රවණතාව ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කරනු ලැබුව ද, මෙම කර්මාන්තයේ බලශක්ති පිරිවැය ඉහළ අගයක් ගැනීම, දේශීය හා ගෝලීය වෙළඳපොළවල වීදුරු ඇසුරුම් සඳහා වර්ධනය වන ඉල්ලුමෙහි ප්‍රතිලාභ ලබා ගැනීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සීමා කරනු ඇත.

**2015 වසරේ වාර්තා කරන ලද වර්ධනය ද ඉක්මවා මූලික ලෝහ නිෂ්පාදිත උප අංශය 2016 වසර තුළ දී සියයට 28.7 ක සතුටුදායක වර්ධනයක් වාර්තා කළේය.** ඉදිකිරීම් අංශයෙන් මූලික ලෝහ සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම මෙම උප අංශයේ නිමැවුම ඉහළ යෑමට හේතු විය. ඉදිකිරීම් කර්මාන්තය එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය මූලික ලෝහ උප අංශයේ කාර්යසාධනය තවදුරටත් වර්ධනය වීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

**ප්‍රධාන වශයෙන් නැව් තැනීම් සහ අලුත්වැඩියා කිරීම්වලින් සමන්විත වන සකස් කළ ලෝහ නිෂ්පාදිත උප අංශය සියයට 33.6 ක පසුබෑමක් වාර්තා කළේය.** බොර තෙල් මිල ගණන් අඩු වීමත් සමඟ අක්වෙරළ තෙල් කැණීම් ක්‍රියාකාරකම් පහත වැටීම අක්වෙරළ කැණීම් යාත්‍රා සඳහා වූ ඉල්ලුම අඩු වීමට හේතු විය.

**2.7 රූප සටහන**
**කර්මාන්තශාලා නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික වර්ධනය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මෙය වසර තුළ දී නැව් තැනීම් කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, භූගෝලීය පිහිටීම, ඉහළ නිපුණතා සහිත ශ්‍රම බලකාය හා ශිල්පීය ගුණාත්මකභාවය හේතුවෙන් ආසියානු කලාපයේ නැව් නිෂ්පාදනය කිරීමේ සන්ධිස්ථානයක් බවට පත් වීමේ විශාල හැකියාවක් ශ්‍රී ලංකාවට පවතී.

**විදුලි උපාංග උප අංශයේ ක්‍රියාකාරිත්වය 2016 වසර තුළ දී සියයට 9.3 කින් පමණ පහත වැටුණි.** මෙම උප අංශයේ පසුබෑමට ප්‍රධාන හේතුව වූයේ විදුලි පරිණාමක (ට්‍රාන්ස්ෆෝමර්) අපනයන සඳහා ඉතියෝපියාව, උගන්ඩාව හා නේපාලය වැනි රටවලින් පැවැති ඉල්ලුම අඩු වීමයි. මෙම කර්මාන්තය විශාල වශයෙන් විවිධාංගීකරණය වී ඇති අතර, තාක්ෂණයෙන් උසස් මෙන්ම, මිල තරගකාරිත්වය ද අත්කර ගෙන සිටී. නමුත්, නිෂ්පාදනය සඳහා වැය වන විදුලිබලය සම්බන්ධ අධික වියදම් නිසා, ශ්‍රී ලාංකික අපනයනවලට විදුලි උපාංග අංශයේ අඩුම වියදමකින් යුතුව නිෂ්පාදනය කිරීමේ අන්තර්ජාතික ප්‍රමුඛයා වන චීනය මෙන්ම, තායිවානය හා වියට්නාමය වැනි රටවලින් එල්ල වන දැඩි තරගයට මුහුණ දීමට සිදු වී ඇත. එසේ වෙතත්, නව අන්තර්ජාතික වෙළඳපොළට අවතීර්ණ වීම සහ නිෂ්පාදන කාණ්ඩ තවදුරටත් විවිධාංගීකරණය කිරීමට ගන්නා ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය අනාගතයේ දී වැඩිදියුණු වෙතැයි අපේක්ෂා කෙරේ.

## කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**ගෝලීය අගය දාමය සමග සම්බන්ධ වීමට තරගකාරිත්වය ඉහළ නැංවීම තුළින්, කලාපයේ අපනයන කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා වන අපනයනාභිමුඛ කාර්මීකරණ උපායමාර්ගය මත පදනම්ව, විවිධ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මගින් කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා රජය සහාය ලබා දුන්නේය.** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය කාර්මීකරණය නංවාලීම පිණිස ආයෝජන දිරිගැන්වීම, යටිතල පහසුකම් සැපයීම, ප්‍රාදේශීය මට්ටමින් තාක්ෂණික සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව, දිස්ත්‍රික්ක 18 ක් තුළ පවතින කාර්මික ජනපද 32 ක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මෙම අමාත්‍යාංශය මගින් අඛණ්ඩව සිදු කරනු ලබයි. මේ අතර 2016 වසර තුළ දී ත්‍රිකුණාමලය (දෙවන අදියර) සහ මඩකළපුව කාර්මික ජනපදවලට අදාළ යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලින් බහුතරයක් අවසන් කරන ලදී. මන්නාරම කාර්මික ජනපදයට අදාළ සංවර්ධන කටයුතු අවසන් කරන ලද අතර, වැලිඔය කාර්මික ජනපදය සඳහා යටිතල පහසුකම් සැපයීම ද වසර තුළ සිදු කරන ලදී.

**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) විසින් ශ්‍රී ලාංකීය ව්‍යවසායයන්ගේ, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල සංවර්ධනය හා තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම සම්බන්ධ කටයුතු 2016 වසරේ දී ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.** ක්‍රමානුකූල ක්‍රමවේදයක් තුළින් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ව්‍යවසායකයන්ට ව්‍යාපාර සංවර්ධන සේවා ලබා දීමේ අරමුණින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ව්‍යවසාය සංසද පිළිබඳ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබීය. තවද, සුපිරි වෙළඳසැල් ජාලවල සැපයුම්කරුවන් ලෙස සම්බන්ධ වීමට අවශ්‍ය තාක්ෂණික පුහුණු පාඨමාලා මෙම අධිකාරිය විසින් තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙනුවෙන් පවත්වන ලදී. එමෙන්ම, ව්‍යවසායකයන්ගේ ශක්‍යතා සංවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සහ "උපාධිධාරී ව්‍යවසායක උදානය" යනාදිය හරහා පුහුණු පාඨමාලා පවත්වන ලදී. තවද, වයඹ විශ්වවිද්‍යාලය සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස මාකඳුර ප්‍රදේශයේ ව්‍යාපාර පෙරවැඩුම් හා තාක්ෂණික පැවරුම් මධ්‍යස්ථානයක් (Incubator and Technology Transfer Centre) ස්ථාපිත කිරීමට නියමිතව ඇත. වයඹ විශ්ව විද්‍යාලය, පර්යේෂණ ආයතන හා ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල පර්යේෂණ සහ සංවර්ධන ඇසුරින් බිහි වූ නව්‍ය ව්‍යාපාර අදහස් තුළින් නව ව්‍යවසායන් ඇති කිරීමට අවශ්‍ය පහසුකම් මෙන්ම යන්ත්‍ර සූත්‍ර ආදිය සැපයීම මෙයින් අපේක්ෂා කෙරේ.

2

2

**අපනයන සංවර්ධන අධිකාරිය විසින් විශේෂයෙන් ඇඟලුම්, ආහාරණ, රබර් ආශ්‍රිත නිෂ්පාදන, පාවහන් හා සම්භාණ්ඩ ආදී ශ්‍රී ලාංකික අපනයනවල තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා වෙළඳ ප්‍රදර්ශන, අපනයනකරුවන්ගේ සම්මේලන, තාක්ෂණික හා මූල්‍යමය සහාය සඳහා වන වැඩපිළිවෙළවල් සහ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ දූත මෙහෙවර කිහිපයක් වසර තුළ දී සංවිධානය කරන ලදී.** ඉදිරියේ දී ශ්‍රී ලාංකීය නිපැයුම් ප්‍රවර්ධනය කිරීම සඳහා නව වෙළඳපොළ වෙත නව නිෂ්පාදන හඳුන්වා දීම සඳහා මෙම මණ්ඩලය දැනට අන්තර්ජාතික පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකු සමඟම කටයුතු කරගෙන යනු ලබයි.

**2016 අයවැය තුළ ඇතුළත් ප්‍රතිපත්ති යෝජනාවලින් ඇතැම් යෝජනා, මෙම වසර තුළ ක්‍රියාත්මක වී ඇත.** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය කාර්මීකරණය වැඩිදියුණු කිරීම වෙනුවෙන් රයිගම කාර්මික ජනපදය පිහිටුවීම සම්බන්ධ මූලික කටයුතු ආරම්භ කරන ලදී. තවද, සුළු හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් දිරිගැන්වීම පිණිස ඉදිකිරීම් කර්මාන්ත ඇපකර අරමුදල් බද්ද, 2016 වසරේ දී ඉවත් කර ඇත. ඊට අමතරව, 2017 වසර තුළ දී විද්‍යා, තාක්ෂණ, නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය, ජාතික නවෝත්පාදන වැඩසටහන, ජාතික තේමාත්මක පර්යේෂණ වැඩසටහන සහ ජාතික විද්‍යා පදනමේ තාක්ෂණික අනුග්‍රහ වැඩපිළිවෙළ යනාදිය ඒකාබද්ධ කොට නවෝත්පාදන කඩිනම් කිරීමේ ක්‍රමවේදයක් (Innovation Accelerator) ඇරඹීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත.

**ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා කාර්මික අංශයේ ආයකත්වය ඉහළ නැංවීමට 2017 අයවැය තුළින් ප්‍රතිපත්තිමය යෝජනා රැසක් ඉදිරිපත් කර ඇත.** සුළු හා මධ්‍ය පරිමාණ ආයතනවල ඵලදායීතාව හා කුසලතා වැඩිදියුණු කිරීම අයවැය යෝජනාවල ප්‍රධාන අරමුණ වී ඇත. කර්මාන්ත රැසක පවත්නා වූ කුසලතා ඌනතාව පියවීමට රජය යටතේ ක්‍රියාත්මක වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන මගින් අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් යෝජනා වී ඇත. ඊට අමතරව, පෞද්ගලික අංශයට අයත් ඇඟලුම්, සෞඛ්‍ය සේවා, ආගන්තුක සත්කාර සේවා සහ ඉදිකිරීම් ආයතනවල පුහුණු වීමෙහි යෙදෙන තරුණ තරුණියන් 10,000 ක් වෙත ත්‍රෛමාසික දීමනාවක් ලබා දීමට ද, මෙම අයවැයෙන් යෝජනා කර ඇත. තෝරා ගත් කර්මාන්ත රැසක නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර පුළුල් කිරීම සඳහා අවශ්‍ය ණය ලබා ගැනීමට ණය සුරැකුම් ක්‍රමයක් ද, සහනදායී පොලී අනුපාතික ක්‍රමයක් ද හඳුන්වා දීමට නියමිතය. ව්‍යාපාර ඵලදායීතාව තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් අධිතාක්ෂණික ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ සඳහා, වරාය හා ගුවන්තොටුපළ බද්ද සියයට 75.0 කින් අඩු කිරීමට ද අයවැයෙන් යෝජනා කර ඇත. තවද, රෙදිපිළි ප්‍රමාණ කිරීම, වර්ණ ගැන්වීම හා නිම් බවට පත් කිරීමේ ඒකක ඇතුළත් වන පරිදි රෙදිපිළි කර්මාන්ත පර්ෂදයක් පිහිටුවා රජය විසින් එහි ආයෝජනය කරනු ලබන ආයතනවලට අවශ්‍ය ඉඩකඩම් හා ආයෝජන සහන ලබා දීමට නියමිතය. මීට අමතරව, පෙරසවි ආකෘති (Pre-fabricated Structures) මත පනවා තිබූ සියයට 25.0 ක සෙස් බද්ද අහෝසි කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තවදුරටත් වර්ධනය කිරීම සඳහා උපකාරී වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**කාර්මික අංශයේ ඵලදායීතාව ඉහළ නැංවීම පිණිස විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනවල දායකත්වය වැඩි කිරීම සඳහා වූ යෝජනා කිහිපයක්ම 2017 වසර සඳහා වූ අයවැය තුළින් යෝජනාවී ඇත.** කාර්මික අංශය සඳහා ඉහළ මට්ටමක තාක්ෂණය යොදා ගැනීම, ඉහළ ආදායම් උත්පාදනය කරන හා වැඩි එකතු කළ අගයක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කරා මඟ පාදයි. මේ අනුව, නව්‍යකරණ ක්‍රියාවලියෙහි අවසන් අදියරට අවශ්‍ය කරනු ලබන මූල්‍ය සම්පත් සම්පාදනය හා ඒවා වාණිජකරණය අරමුණු කර ගනිමින් පිහිටු වූ නවෝත්පාදන කඩිනම් කිරීමේ අරමුදල (Innovation Accelerater Fund) තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අරමුදල් වෙන් කරන ලදී. තවද, රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයෙන් යුතුව ඖෂධ නිෂ්පාදනය, ජාන තාක්ෂණ ආදී කර්මාන්තවල නිරත සමාගම්වලට පහසුකම් සැලසීම සඳහා ජෛව තාක්ෂණ නව්‍යකරණ උද්‍යානයක් (Biotechnology Innovation Park) ආරම්භ කිරීමට යෝජනා විය. විද්‍යුත් නිෂ්පාදන සමාගම් ඇති කිරීමට සහාය වන්නා වූ උසස් විද්‍යුත් නිර්මාණ මධ්‍යස්ථානය (Centre for Advanced Electronic Design), රොබෝ තාක්ෂණය භාවිතය පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානය (Centre of Excellence in Robotics Applications) සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (Sri Lanka Institute of Nanotechnology, SLINTEC) යනාදිය සඳහා අරමුදල් වෙන් කිරීම මගින් එම ආයතන තවදුරටත් ශක්තිමත් කරන ලදී. එසේම, රොබෝ තාක්ෂණය, ජීවීන් සහ යන්ත්‍ර අතර සන්නිවේදන විද්‍යාව (Cybernetics), ඉලෙක්ට්‍රොනික ආදී කර්මාන්තවලට සහාය ලබා දීම පිණිස එවැනි කර්මාන්ත සඳහා බදු සහන ලබා දීමට ද යෝජනා කරන ලදී. 2017 මාර්තු මාසයේ දී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර,

දැනටමත් හෝමාගම, පිටිපන ප්‍රදේශයේ අක්කර 7 ක භූමි ප්‍රමාණයක් ඒ සඳහා වෙන් කර ඇත. මේ සමඟම, සුදුසු ආයතනවලින් තාක්ෂණික හා මූල්‍ය සහාය සහ අවශ්‍ය උපදේශන සේවා ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය මගින් තෝරා පත් කරගත් කමිටුවක් සඳහා ද අනුමැතිය හිමි විය.

**ආර්ථිකය තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයේ දායකත්වය සැලකිල්ලට ගනිමින් එම කර්මාන්ත සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීම පිණිස, බැංකුවල සමස්ත ණය ප්‍රමාණයෙන් සියයට 10.0 ක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා වෙන් කිරීමට 2017 අයවැය තුළින් යෝජනා කරන ලදී.** මේ අනුව 2017 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව, 2017 අයවැය තුළින් අනුමත කරන ලද, හඳුනාගත් අංශවලට ණය සැපයීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ඉල්ලා සිටින ලදී. විශේෂයෙන්ම, කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, පශු සම්පත්, මල් වගාව, ගෙවතු වගාව, ලුහු ඉංජිනේරු, මුද්‍රණ, සංචාරක ව්‍යාපාරය, අත්කම් හා ඇඟලුම් වැනි ක්ෂේත්‍රවල නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් සහනදායී ණය යෝජනා ක්‍රමයක් ද යෝජනා විය. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ස්වයං රැකියා හා කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සහාය වීම පිණිස "ස්වශක්ති ජාතික ණය යෝජනා ක්‍රමය" ආරම්භ කරන ලදී.

**කුසලතා නැංවීමේ පුහුණු වැඩසටහන්, වෙළඳ ප්‍රදර්ශන සහ වෙළඳ දූත කණ්ඩායම් සංවිධානය කරමින් කාර්මික අංශයේ සංවර්ධනය සඳහා තවදුරටත් වාණිජ මණ්ඩල හා සංගම් විසින් පහසුකම් සපයන ලදී.** ඒකාබද්ධ ඇඟලුම් සංගමය, මුම්බායිහි වර්ඩෙක්ස් ප්‍රදර්ශන හා ප්‍රවර්ධන පෞද්ගලික සමාගම හා එක්ව නූල්, රෙදි, ඇඳුම් උපාංග හා සම්බන්ධිත සේවා පිළිබඳ වූ දකුණු ආසියාවේ එකම ජාත්‍යන්තර ප්‍රදර්ශනය වන "Intex South Asia 2016", ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මෙම ප්‍රදර්ශනය, රෙදි හා ඇඳුම් උපාංග සඳහා අලුත් මූලාශ්‍ර හඳුන්වා දීම තුළින් ඇඟලුම් කර්මාන්තයට ඉහළ ප්‍රතිලාභ අත්කර දීමට සමත් විය. තවද, ඒකාබද්ධ ඇඟලුම් සංගමය, සමාජ හා කම්කරු අනුකූලතාවය පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගන්නා වූ මිනුම් ක්‍රමයක් හඳුන්වා දීම සඳහා තිරසාර ඇඟලුම් හවුල (Sustainable Apparel Coalition) මගින් මුල පුරන ලද සමාජ හා කම්කරු සමායෝජන ව්‍යාපෘතිය (Social and Labour Convergence Project) සඳහා දායක විය. තවද, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සිය අනුකූලතා ඉහළ නංවා ගැනීම සඳහා සහාය ලබා දෙන ලදී. තවද, ඇඟලුම් කර්මාන්තයේ තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ඇඟලුම් හා රෙදිපිළි ආයතනය සමඟ එක්ව ශ්‍රී ලාංකීය ඇඟලුම් කර්මාන්තයට නව්‍ය තාක්ෂණය හඳුන්වා දීම සඳහා පහසුකම් සපයන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය, ශ්‍රී ලංකා වෙළඳ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය වැනි වාණිජ මණ්ඩල ද වෙළඳාම හා ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වෙළඳ දූත නියෝජන, පුහුණු වැඩසටහන් සහ වෙළඳ සංසද සඳහා තවදුරටත් පහසුකම් සපයන ලදී.

## විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය

**2016 වසරේ දී විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 8.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 10.0 කින් වර්ධනය විය.** මෙම කාණ්ඩය සඳහා විශාලතම දායකත්වය සපයන විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයුම් ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 8.4 කින් වර්ධනය විය. සමස්ත විදුලි උත්පාදනය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසර තුළ දී සියයට 8.1 කින් ඉහළ යෑම තුළින් ද මෙම වර්ධනය පිළිබිඹු විය. මේ අතර, 2016 වසරේ බොහෝ කාලයක් පුරා පැවැති නියං තත්ත්වය හේතුවෙන් ජල විදුලිබල උත්පාදනය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 35.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 29.0 කින් පහත වැටුණි. මේ අතර, 2015 වසරේ දී සියයට 47.1 කින් පහත වැටුණු ඉන්ධන තෙල් මගින් විදුලි උත්පාදනය 2016 වසරේ දී සියයට 96.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, 2015 වසරේ දී සියයට 38.8 ක වර්ධනයක් වාර්තා කළ ගල් අඟුරු මගින් විදුලි උත්පාදනය 2016 වසරේ දී සියයට 13.6 කින් වර්ධනය විය. තවද, ජලය එක්රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.4 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.9 කින් වර්ධනය විය. මෙහි දී, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් බෙදාහරින ලද ජල පරිමාව 2015 වසරේ දී වාර්තා කරන ලද සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 12.0 ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, ජලය සඳහා වන ඉල්ලුමෙහි අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කරමින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමස්ත පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව 2015 වසරේ දී වාර්තා කළ

සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.1 කින් වර්ධනය විය. ඒ අතරම, 2016 වසරේ දී මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ ක්‍රියාකාරකම්වල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 24.9 ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව සියයට 17.8 කින් වර්ධනය විය.

### ඉදිකිරීම්

**2015 වසරේ දී සියයට 2.7 කින් පහත වැටුණු ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2016 වසරේ දී සියයට 14.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගරය, දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ කටයුතු, කොළඹ පිටත වටරවුම් මාර්ගයේ තුන්වන අදියර සහ නැගී එන මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීම් ක්‍රියාකාරකම් වැනි මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති, ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා බෙහෙවින් දායක විය. 2015 වසරේ දී සියයට 5.8 ක වර්ධනයක් වාර්තා කළ දේශීය සිමෙන්ති නිෂ්පාදන සහ එහි ආනයන වල සමස්තය 2016 වසරේ දී සියයට 25.3 ක ඉහළ වර්ධනයක් වාර්තා කිරීම තුළින් ද ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මෙම යහපත් ප්‍රවණතාවය පිළිබිඹු විය. මෙහිදී, දේශීය වශයෙන් සිමෙන්ති නිෂ්පාදනය සහ සිමෙන්ති ආනයනය 2016 වසරේ දී පිළිවෙළින් සියයට 17.8 කින් සහ සියයට 29.5 කින් වර්ධනය විය. ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ඇති හිතකර වර්ධනය පෙන්නුම් කරමින් ආයෝජන භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පරිමා දර්ශක ද 2016 වසරේ දී පිළිවෙළින් සියයට 20.0 කින් සහ සියයට 22.9 කින් වර්ධනය විය. තවද, 2016 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් ඉදිකිරීම් කටයුතු සඳහා පෞද්ගලික අංශය වෙත ලබාදෙන ණය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 36.1 ක වර්ධනයට සාපේක්ෂව තවදුරටත් සියයට 26.9 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. එමෙන්ම, නිවාස ඉදිකිරීම් කටයුතුවල වර්ධනය පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පුද්ගලික නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ලබාදෙන ණය ප්‍රමාණය ද 2016 වසරේ දී සියයට 27.1 කින් වර්ධනය විය. තවද, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සහතික කරන ලද, සම්පූර්ණ කළ මහල් නිවාස ඒකක සංඛ්‍යාව 2015 වසරේ දී වාර්තා කරන ලද සියයට 29.5 ක පහත වැටීමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 24.5 කින් වර්ධනය විය. ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මෑතකාලීන ප්‍රවණතාවයන්හි තිරසාරභාවය අධ්‍යයනය කිරීමේ අරමුණෙන් මහල් නිවාස වෙළඳපොළෙහි මෙම නැගී එන උපනතීන් හඳුනාගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොළඹ දිස්ත්‍රික්කය සඳහා සහාධිපත්‍ය දේපළ මිල දර්ශකයක් සම්පාදනය කරන ලදී.

### සේවා

**ද.දේ.නි. සඳහා සමස්තයක් වශයෙන් වැඩිම දායකත්වය ලබාදෙන සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 4.2 කින් වර්ධනය විය.** පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුවද බොහෝ සේවා ආශ්‍රිත ආර්ථික කටයුතු 2016 වසරේ දී හිතකර ලෙස වර්ධනය විය. සේවා කටයුතුවල මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා කටයුතුවල ඉහළ වර්ධනය මෙන්ම භාණ්ඩ හා මගී ප්‍රවාහන සේවාවල ඉහළ යෑම ද බෙහෙවින් ඉවහල් විය. තවද, තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතු, රාජ්‍ය පරිපාලන සේවා, දේපළ වෙළඳාම් කටයුතු, අධ්‍යාපනික සේවා, වෙනත් පෞද්ගලික සේවා, රක්ෂණය, නවාතැන් සහ ආහාර පාන සැපයීමේ සේවා, විදුලි සංදේශ සේවා, සෞඛ්‍ය සේවා මෙන්ම තොරතුරු තාක්ෂණ සේවාවල වර්ධනය ද සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල ප්‍රගතිය කෙරෙහි හිතකර ලෙස දායක විය. කෙසේ වුවද, වසර තුළ දී වෘත්තීයමය සේවාවන්හි පහත වැටීමක් දක්නට ලැබුණි. මේ අතරතුර දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව සම්පාදනය කරනු ලබන සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ද සේවා ආශ්‍රිත ආර්ථික කටයුතුවල අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කරමින් 2016 වසර පුරාම සාධනීය වර්ධනයක් වාර්තා කරන ලදී. ඒ අනුව, නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශක වසර පුරා වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, නිම කිරීමට නියමිත කාර්යයන් උප දර්ශකය පහළ යෑමක් පෙන්නුම් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි සේවා කටයුතුවලට අදාළ උප දර්ශකවල හැසිරීම තුළින් ද සේවා කටයුතුවල දක්නට ලැබුණු මෙම වර්ධනය පිළිබිඹු විය. ඒ අනුව, ව්‍යාපාර තත්ත්වය, ඉල්ලුම සහ විකුණුම් යන උප දර්ශකවල වාර්ෂික සාමාන්‍යය එහි කඩඉම් මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවැතුණි.

#### තොග සහ සිල්ලර වෙළඳාම

**2016 වසරේ දී තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.1 ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.5 කින් වර්ධනය විය.** වසර තුළ දී ආනයන සහ අපනයන පරිමා දර්ශකවල හැසිරීම තුළින් ද මෙම මන්දගාමිත්වය පිළිබිඹු විය. තවද, කෘෂිකාර්මික කටයුතුවල නිමැවුම පහත වැටීම මෙන්ම නිෂ්පාදන කර්මාන්තවල නිමැවුම මන්දගාමී වීම ද වෙළඳ කටයුතුවල ක්‍රියාකාරිත්වය කෙරෙහි අයහපත් ලෙස බලපාන ලදී. 2016 වසරේ දී ආනයන පරිමා දර්ශකය, 2015 වසරේ දී වාර්තා කළ

සියයට 10.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 7.9 කින් ඉහළ යන ලදී. මෙහිදී, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වසර තුළ දී ඉහළ ගිය අතර පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටුණි. ඒ අනුව, අන්තර් භාණ්ඩ ආනයන පරිමා දර්ශකය 2016 වසරේ දී සියයට 10.8 කින් ඉහළ ගිය අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් ඉන්ධන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන ඉහළ යැම හේතු විය. තවද, 2016 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන පරිමා දර්ශකය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 13.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 20.0 කින් අඛණ්ඩව වර්ධනය විය. ප්‍රවාහන උපකරණ ආනයන පහළ යැම මධ්‍යයේ වුවද යන්ත්‍රසූත්‍ර හා උපකරණ මෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයෙහි දක්නට ලැබුණු ඉහළ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවද, 2016 වසරේ දී ආහාර සහ පාන මෙන්ම අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන පහළ යැම හේතුවෙන්, පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා දර්ශකය 2015 වසරේ දී වාර්තා කළ සියයට 24.1 ක වර්ධනයට සාපේක්ෂව සියයට 12.0 කින් පහත වැටුණි. මේ අතර, 2016 වසරේ දී ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අපනයන පහත වැටීම මෙන්ම කාර්මික භාණ්ඩ අපනයනයෙහි දක්නට ලැබුණු මන්දගාමීත්වය ද හේතුවෙන් අපනයන පරිමා දර්ශකය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.7 කින් පහත වැටුණි.

### ප්‍රවාහනය සහ ගබඩා පහසුකම්

**2016 වසරේ දී භාණ්ඩ හා මගී ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීමේ කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.1 කින් වර්ධනය විය.** මෙහිදී, ප්‍රවාහන සේවා මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණයෙහි අඩු වර්ධනයක් දක්නට ලැබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ පෞද්ගලික අංශයේ බස් රථ සේවා මගින් මෙහෙයවන ලද සමස්ත මගී කිලෝමීටර් ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා කළ පිළිවෙළින් සියයට 19.6 ක හා සියයට 6.1 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 6.1 ක හා සියයට 2.0 ක අඩු වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, 2015 වසරේ දී සියයට 8.3 කින් වර්ධනය වූ ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය ද 2016 වසරේ දී සියයට 0.1 ක අඩු වේගයකින් වර්ධනය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකන් ගුවන් සේවය මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා කළ සියයට 0.2 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 0.8 කින් වර්ධනය විය. මේ අතර, ශ්‍රී ලංකා වරායයන් මගින් හසුරුවන ලද බහාලුම් ප්‍රමාණය (අඩි 20 ට සමාන බහාලුම් ඒකකවලින්) සහ ටොන් නෞභාරය 2015 වසර තුළ දී පිළිවෙළින් වාර්තා කරන ලද සියයට 5.7 ක හා සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසර තුළ දී පිළිවෙළින් සියයට 10.6 ක හා සියයට 11.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ටොන් කිලෝමීටර් ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා කළ සියයට 0.3 ක පහත වැටීමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.6 කින් වර්ධනය විය. තවද, ශ්‍රී ලංකන් ගුවන් සේවය මගින් ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ටොන් කිලෝමීටර් ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා කළ සියයට 7.5 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 5.0 කින් වර්ධනය විය. මේ අතර, 2016 වසරේ දී තැපැල් හා කුරියර් සේවාවන් හි එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 0.1 ක පහත වැටීමට සාපේක්ෂව සියයට 5.1 කින් වර්ධනය විය. තැපැල් දෙපාර්තමේන්තුව මගින් වසර තුළ දී දේශීයව මෙන්ම විදේශීයව සිදු කළ ලිපි බෙදාහැරීමේ කටයුතුවල දක්නට ලැබුණු ඉහළ යැම තුළින් ද මෙම වර්ධනය පිළිබිඹු විය.

2

### නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවන්

**2016 වසරේ දී නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවාවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 1.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.0 කින් වර්ධනය විය.** සංචාරක ව්‍යාපාරයට අදාළ කටයුතු සැලකීමේ දී, සංචාරකයන්ගේ පැමිණීම 2015 වසරේ දී වාර්තා කළ සියයට 17.8 ක වර්ධනය හා සැසඳීමේදී සාපේක්ෂව අඩු වේගයකින් වුවද 2016 වසරේ දී සියයට 14.0 කින් වර්ධනය විය. කලාප වශයෙන් සැලකීමේ දී මෙරටට වැඩිම සංචාරකයින් පිරිසක් බටහිර යුරෝපයෙන් පැමිණ ඇති අතර දෙවනුව වැඩිම සංචාරක පිරිසක් දකුණු ආසියාවෙන් පැමිණ ඇත. වාසය කරන රට අනුව සංචාරක පැමිණීම සැලකීමේ දී ඉන්දියාව තවදුරටත් ප්‍රමුඛත්වය ගන්නා අතර මෙම ඉහළ වර්ධනය සඳහා අඛණ්ඩව දායක වෙමින් චීනය එහි දෙවැනි තැනට පත්ව ඇත. මේ අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතිය සහිත ශ්‍රේණිගත හෝටල්වල කාමර උපයෝජන අනුපාතය 2015 වසරේ දී පැවැති සියයට 74.5 ක මට්ටමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 74.8 දක්වා වර්ධනය වී ඇත. තවද, සංචාරක අංශයේ ඉපැයීම් වසර තුළ දී අඛණ්ඩව වර්ධනය වෙමින් එ.ජ. ඩොලර් බිලියන 3.5 ක් දක්වා සියයට 18.0 කින් ඉහළ ගොස් ඇත. මේ අතර, පෞද්ගලික පරිභෝජන වියදමෙහි ඉහළ යැම මගින් ද පිළිබිඹු වූ හෝටල් සහ ආපනශාලා පහසුකම් සඳහා ඉහළ යන ඉල්ලුම, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා ප්‍රසාරණය සඳහා දායක විය.

## තොරතුරු සහ සන්නිවේදනය

**2016 වසරේ දී තොරතුරු සහ සන්නිවේදනය ආශ්‍රිත ආර්ථික කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 10.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.0 කින් වර්ධනය විය.** 2015 වසරේ දී සියයට 10.1 කින් වර්ධනය වූ විදුලි සංදේශ සේවාවල එකතු කළ අගය 2016 වසරේ දී සියයට 8.3 කින් තවදුරටත් අඛණ්ඩව ඉහළ යෑම මෙම කාණ්ඩයෙහි වර්ධනය කෙරෙහි බෙහෙවින් දායක විය. මෙහිදී ජංගම දුරකථන ග්‍රාහක සංඛ්‍යාව මෙන්ම රැහැන් සහිත ස්ථාවර දුරකථන සම්බන්ධතාවන් ද තව දුරටත් අඛණ්ඩව වර්ධනය වුවද රැහැන් රහිත ස්ථාවර දුරකථන සබඳතා සංඛ්‍යාව පහත වැටීමකට ලක්විය. තවද, අන්තර්ජාල සබඳතා මෙන්ම ජංගම පුළුල් පරාස සේවා ද වසර තුළ දී වර්ධනය විය. 2016 වසරේ දී පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 14.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 7.1 කින් වර්ධනය විය. තවද, ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන සහ එම නිෂ්පාදන කටයුතුවල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.4 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.7 කින් වර්ධනය විය.

## මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

**2016 වසරේ දී මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 13.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.4 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙම කාණ්ඩයෙහි සියලුම ආර්ථික කටයුතු 2015 වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුවද වසර තුළ දී අඛණ්ඩව වර්ධනය විය. 2015 වසරේ දී සියයට 17.2 කින් වර්ධනය වූ මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවල එකතු කළ අගය 2016 වසරේ දී සියයට 12.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙම වර්ධනය කෙරෙහි බෙහෙවින් ඉවහල් විය. මෙම වර්ධනය පිළිබිඹු කරමින්, බැංකු ක්ෂේත්‍රයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල දළ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 2015 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 21.1 ක හා සියයට 30.6 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 17.5 ක හා සියයට 20.1 ක වර්ධනයක් වාර්තා කර ඇත. තවද, බැංකු ක්ෂේත්‍රයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු ප්‍රමාණය 2015 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 15.3 ක හා සියයට 16.1 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 16.5 කින් හා සියයට 10.5 කින් ඉහළ ගොස් ඇත. ඒ අනුව, බැංකු ක්ෂේත්‍රයේ සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල දළ ණය සහ තැන්පතුවල සමස්ත එකතුව 2015 වසරේ දී පිළිවෙළින් වාර්තා කරන ලද සියයට 17.9 ක හා සියයට 24.9 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 17.0 කින් හා සියයට 16.6 කින් වර්ධනය විය. මේ අතරතුර දී, 2016 වසරේ දී රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් කළමනාකරණය ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කරන ලද සියයට 9.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.5 කින් ඉහළ යන ලදී. මේ අතර, රක්ෂණ ක්ෂේත්‍රයේ වාරික ආදායම් සහ හිමිකම් ගෙවීම්වල එකතුව 2015 වසරේ දී වාර්තා කරන ලද සියයට 16.6 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 15.1 කින් ඉහළ යෑම තුළින් ද රක්ෂණ කටයුතුවල දක්නට ලැබුණු මෙම ප්‍රගතිය පිළිබිඹු විය. තවද, 2015 වසරේ දී සියයට 10.2 ක වර්ධනයක් වාර්තා කළ නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම් කටයුතුවල එකතු කළ අගය 2016 වසරේ දී සියයට 4.2 ක වර්ධනයක් වාර්තා කරන ලදී.

## වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන්

**2016 වසරේ දී වෘත්තීයමය සේවා සහ වෙනත් පෞද්ගලික සේවාවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 1.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.7 ක වර්ධනයක් වාර්තා කර ඇත.** මෙම කාණ්ඩය සඳහා ප්‍රධානතම දායකත්වය දක්වන රෙදිපිළි සේදීම්, නිර්මාණාත්මක කලාවන් හා විනෝදාස්වාදය සැපයීමේ සේවා, කේශාලංකරණය හා වෙනත් රූපලාවණ්‍ය සත්කාර සේවා සහ අවමංගල්‍ය කටයුතු හා සම්බන්ධ කාර්යයන් වැනි කටයුතුවලින් සමන්විත වන වෙනත් පෞද්ගලික සේවාවල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 3.6 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී වඩා අඩු වේගයකින් වුවද සියයට 1.3 කින් අඛණ්ඩව වර්ධනය විය. විශේෂ නිපුණතා හා දැනුම අවශ්‍ය වන ආර්ථික කටයුතු වන ගෘහ නිර්මාණ හා ඉංජිනේරු කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධනය, ප්‍රචාරණය සහ වෙළඳ දැන්වීම් පර්යේෂණ, නීතිමය මෙන්ම ගණකාධිකරණ සේවාවන් ද ඇතුළත් වන වෘත්තීයමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන හා සහායක සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 7.4 ක පහත වැටීමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 3.1 කින් තවදුරටත් පහත වැටුණි.

## රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය හා සමාජ සේවාවන්

**2016 වසරේ දී, රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍යය හා සමාජ සේවාවන් ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 3.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.9 ක වර්ධනයක් වාර්තා කර ඇත.** මෙම

කටයුතු සඳහා ප්‍රධානතම දායකත්වය දක්වන රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 6.9 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 5.2 කින් ඉහළ යෑම මෙම වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් විය. මේ අතර, අධ්‍යාපන සේවාවල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 8.1 ක පහත වැටීමට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.5 කින් හිතකර ලෙස වර්ධනය විය. තවද, 2016 වසරේ දී සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවා හා සමාජ සේවාවල එකතු කළ අගය 2015 වසරේ දී වාර්තා කළ සියයට 8.1 ක වර්ධනයට සාපේක්ෂව සියයට 1.5 කින් වර්ධනය විය.

## 2.5 වියදම

**දේශීය පරිභෝජන සහ ආයෝජන වියදම තුළින් ජනනය වන දළ දේශීය වියදම (ද.දේ.වි.) නාමික වශයෙන් 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් බිලියන 12,742.8 ක් දක්වා සියයට 8.2 කින් වර්ධනය විය.** මේ සඳහා ප්‍රධාන වශයෙන් ආයෝජන වියදමෙහි වාර්තා වූ සියයට 19.6 ක වර්ධනය මෙන්ම පරිභෝජන වියදමෙහි වාර්තා වූ සියයට 4.1 ක වර්ධනය ද හේතු විය. මේ අතර, ද.දේ.වි. මූර්ත වශයෙන් 2015 වසරේ දී වාර්තා කළ සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 6.2 කින් වර්ධනය විය. මූර්ත වශයෙන් සැලකීමේ දී, ආයෝජන වියදම 2015 වසරේ දී වාර්තා කළ සියයට 1.2 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 18.1 ක ඉහළ වර්ධන වේගයක් වාර්තා කරන ලදී. 2016 වසරේ දී පරිභෝජන වියදම, 2015 වසර තුළ දී වාර්තා කරන ලද සියයට 8.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.9 ක සාපේක්ෂ අඩු වර්ධනයක් වාර්තා කරමින් පරිභෝජන වියදම කෙරෙහි මිල මට්ටම් ඉහළ යාම නිසා ඇති වූ බලපෑම පෙන්නුම් කරන ලදී. මේ අතර, 2016 වසරේ දී ශුද්ධ විදේශීය ඉල්ලුම නාමික වශයෙන් සැලකූ විට, 2015 වසරේ දී වාර්තා කළ සියයට 1.4 ක වර්ධනයට සාපේක්ෂව සියයට 9.6 කින් පහත වැටුණි. මෙහිදී, රුපියල් වටිනාකම අනුව භාණ්ඩ හා සේවා අපනයන සහ ආනයන 2015 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 5.3 ක හා සියයට 3.5 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 10.3 කින් හා සියයට 10.1 කින් වර්ධනය විය. මූර්ත වශයෙන් ආනයන සියයට 7.9 කින් වර්ධනය වූ අතර අපනයන සියයට 0.7 කින් පහත වැටීම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම මූර්ත වශයෙන් ද පහළ ගියේය. තවද, ආනයන මිල මට්ටම්වලට සාපේක්ෂව අපනයන මිල මට්ටම් ඉහළ අගයක පැවැති බව පිළිබිඹු කරමින් 2015 වසරේ දී සියයට 2.7 කින් වර්ධනය වූ වෙළඳ මිල අනුපාතය 2016 වසරේ දී සියයට 3.7 කින් වර්ධනය විය. විදේශ ඉල්ලුමෙහි දක්නට ලැබුණු මෙම ප්‍රවණතාවය ආනයන හා අපනයන දර්ශක මගින් ද පිළිබිඹු විය. මෙහිදී, වටිනාකම මෙන්ම පරිමාව අනුව ද ආනයන වර්ධනය විය. කෙසේ වුවද, අපනයන පරිමා දර්ශකය පහළ ගිය අතර වටිනාකම අනුව අපනයන දර්ශකය ඉහළ යන ලදී. ආනයන ප්‍රමාණාත්මකව මෙන්ම වටිනාකම අනුව වර්ධනය සඳහා ආයෝජන කටයුතු වර්ධනය වීමත් සමගම ආයෝජන භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, වසර තුළ පරිභෝජන භාණ්ඩ ආනයනයෙහි පහත වැටීමක් දක්නට ලැබුණි. මේ අතර, 2016 වසරේ දී වටිනාකම අනුව කෘෂිකාර්මික, කාර්මික සහ ඛනිජ ද්‍රව්‍ය යන සියලුම අපනයන දර්ශකවල වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ වුවද, ප්‍රමාණාත්මක වශයෙන් සැලකූ විට කෘෂිකාර්මික අපනයනවල පහත වැටීමක් දක්නට ලැබුණු අතර කාර්මික සහ ඛනිජ ද්‍රව්‍ය අපනයනවල වර්ධනයක් දක්නට ලැබුණි. ඒ අනුව, ද.දේ.වි. ශුද්ධ විදේශීය ඉල්ලුමට ගැලපීමෙන් ලැබෙන ද.දේ.නි. 2016 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව රුපියල් බිලියන 11,839 ක් දක්වා සියයට 8.1 කින් වර්ධනය වූ අතර මේ සඳහා මූර්ත වශයෙන් ද.දේ.නි. සියයට 4.4 කින් වර්ධනය වීම සහ ද.දේ.නි. ගම්‍ය අවධමනකය සියයට 3.6 කින් වර්ධනය වීම දායක විය.

### පරිභෝජනය

**2016 වසරේ දී සමස්ත වියදමෙන් සියයට 76.2 කට දායකත්වය දක්වන ලද පරිභෝජන වියදමෙහි නාමික වටිනාකම, 2015 දී වාර්තා කළ සියයට 10.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.1 ක වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 9,018.9 ක් දක්වා ඉහළ යන ලදී.** 2015 වසරට සාපේක්ෂව 2016 වසර තුළ දී පෞද්ගලික මෙන්ම රාජ්‍ය පරිභෝජන වියදම ද අඩු වේගයකින් වර්ධනය වීම මෙම පසුබෑම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2016 වසරේ දී සමස්ත පරිභෝජන වියදමෙන් සියයට 88.7 කට දායකත්වය දක්වන ලද පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 10.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.3 කින් වර්ධනය විය. වටිනාකම අනුව මෙන්ම පරිමාව අනුව ද පරිභෝජන භාණ්ඩ ආනයන දර්ශකයෙහි පහත වැටීම මගින් ද පෞද්ගලික පරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු මෙම සාපේක්ෂ අඩු වර්ධනය පිළිබිඹු විය. කෙසේ වුවද, පරිභෝජන භාණ්ඩ ආනයනයේ දී වටිනාකම අනුව දක්නට ලැබුණු පහත වැටීමට සාපේක්ෂව වඩා වැඩි වේගයකින් ප්‍රමාණාත්මකව පහත වැටීම තුළින් ආනයනවල මිල මට්ටම් ඉහළ යෑමෙන් පෞද්ගලික පරිභෝජනය කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම පිළිබිඹු විය. තවද, දේශීය වශයෙන් ගත් කල රජයේ බදු ඉහළ නැංවීම ද පෞද්ගලික පරිභෝජනය

2

2

**විශේෂ සටහන 4**

## ව්‍යාපාර බුද්ධි තොරතුරු සහ විසල් දත්ත: මහ බැංකු සංඛ්‍යා දත්තවල නව මානයක්

තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සංඛ්‍යාත්මක මෙන්ම සංඛ්‍යාත්මක නොවන තොරතුරු ද අඩංගු වන ප්‍රාථමික දත්ත එක්රැස්කිරීම හා ප්‍රතිසැකසීම් සඳහා තාක්ෂණික ක්‍රමවේද යොදාගන්නා සමස්ත ක්‍රියාවලිය ව්‍යාපාර බුද්ධි තොරතුරු සම්පාදනය ලෙස සැලකිය හැක. මෙවන් ක්‍රමවේදයන් බහුල ලෙස ලොව පුරා මහ බැංකු විසින් මහ බැංකුකරණයේ පුළුල් අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී උපකාරී කරගනු ලැබේ. එසේම මෑතකාලීනව අනාගත දැක්මකින් යුතුව වඩා දැනුවත් භාවයකින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා ව්‍යාපාර බුද්ධි තොරතුරු මහ බැංකු විසින් භාවිතා කරනු දක්නට ලැබෙයි. තවද, නියාමන වාතාවරණය හිතකර වීම හේතුවෙන් පහසු වූ නවෝත්පාදන කටයුතු සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙහි වැඩි දියුණුවීම ගෝලීය ආර්ථිකයේ සහ මූල්‍ය පද්ධතිවල වෙනස්කම් රැසක් සිදු කිරීමට හේතු වී ඇත. විශේෂයෙන්ම, ගෝලීය මූල්‍ය අර්බුදයෙහි ප්‍රතිඵලයක් ලෙස වඩාත් ගැඹුරු සහ පෘථුල තොරතුරු කෙරෙහි වර්තමානයෙහි අවධානය යොමුව ඇත. ඒ අනුව මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂකයන් විසින් ආර්ථිකය පිළිබඳ අතිරේක අවබෝධයක් ලබාගැනීම උදෙසා සාර්ව විචක්ෂණශීලී ගුණාත්මක දත්ත කෙරෙහි වැඩිපුර නැඹුරු වී ඇත. මෙවැනි පසුබිමක් තුළ විසල් දත්ත (Big Data) නම් නවමු සංකල්පයක් ඉදිරියට පැමිණෙමින් පවතී. මෙය තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරික ගනුදෙනුවලින් ජනනය වන ඩිජිටල් දත්ත, සමාජ ජාල, ජාලගත පරිගණක සහ ද්‍රව්‍ය අන්තර්ජාලගත කිරීම[1] (Internet of Things) වැනි කටයුතු සමග සහසම්බන්ධ වී ඇත. විසල් දත්ත යනු විශාල දත්ත ප්‍රමාණයක් වන අතර, ව්‍යාපාර බුද්ධි තොරතුරු සම්පාදනය යනු එම දත්ත උපයෝගී කොටගෙන වඩා සුදුසු තීරණ ගැනීමට, කාර්යක්ෂමතාවය වැඩි කිරීමට සහ අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි වඩා අර්ථවත් තොරතුරු උකහා ගැනීම සඳහා යොදාගන්නා ක්‍රියාවලිය ලෙස හැඳින්විය හැක. වෙනත් ආකාරයකින් ගත් කල විසල් දත්ත යනු පිළිතුරු ඇතුළත් පුස්තකාලයක් වන අතර ව්‍යාපාර බුද්ධි තොරතුරු සම්පාදනය යනු එම පිළිතුරු උකහාගැනීමට උපකාරී වන ක්‍රියාවලිය වේ.

මෙම වර්ධනයන් ඉතාමත් වේගයෙන් සිදුවන පසුබිමක් තුළ වර්තමානයේ පවතින නිල මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු පමණක් වඩා දැනුම්වත් ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති සම්පාදනයේ දී ප්‍රමාණවත් නොවිය හැකි අතරම පවතින ආර්ථික උපනතීන් කල් ඇතිව හඳුනාගැනීම පිණිස නිසි වේලාවට එම තොරතුරු නොලැබෙන අවස්ථා ද ඇත. ඒ අනුව, මෙම තොරතුරු හිඩැස පියවීමට ගෝලීය වශයෙන් මහ බැංකු විසල් දත්ත හා ව්‍යාපාර බුද්ධි තොරතුරු ලබාගැනීම කෙරෙහි උනන්දු වේ. කෙසේ වුවද, ප්‍රතිපත්ති ප්‍රමුඛතා තීරණය කිරීම සඳහා භාවිතයේදී මහ බැංකු විසින් ලබාගන්නා එම දත්තවල පවතින ගැඹුර හා තීව්‍රත්වය සම්බන්ධ ගැටලු තවදුරටත් අභියෝගයක්ව පවතියි.

### දත්ත සඳහා වූ නව සංකල්පය: විසල් දත්ත

විසල් දත්ත යනු ප්‍රතිපත්ති සම්පාදනය තිව්‍ර කිරීම සඳහා අඛණ්ඩව දායක වන සංවිධිත මෙන්ම අසංවිධිත වූ ඉහළ පරිමාවකින් යුතු දත්ත සමූහයකි. ඩිජිටල් පරිණාමන ක්‍රියාවලියෙහි පවතින ඉහළ වර්ධනය පිළිබිඹු කරමින් තොරතුරු තාක්ෂණය මේ වන විට දෛනික ව්‍යාපාරික මෙන්ම පෞද්ගලික කටයුතුවල දී ද අත්‍යවශ්‍ය සාධකයක් වෙමින් පවතියි. මෙම ඩිජිටල් ආර්ථිකය, ජනමාධ්‍ය, බැංකුකරණය (මූල්‍ය තාක්ෂණික නිපැයුම් - Fin-Tech[2] තුළින්), සිල්ලර වෙළඳාම (e-commerce තුළින්), බලශක්තිය, ප්‍රවාහනය සහ සෞඛ්‍යය (ඉලෙක්ට්‍රොනික වශයෙන් වාර්තා තබාගැනීම සහ ඩිජිටල් තාක්ෂණය මගින් සෞඛ්‍ය ගැටලු සඳහා පිළියම් යෙදවීම - Digital Health Solutions) ආදී අංශ මෙන්ම විනෝදාස්වාදය සැපයීම හා සමාජයීය අන්තර්ක්‍රියා (සමාජ ජාල, අන්තර්ජාල ක්‍රීඩා, බහුමාධ්‍ය දත්ත බාගත කිරීමකින් තොරව භාවිතා කිරීමට සැලසීම - Streaming Services) ආදී අංශ සමග වඩා සහසම්බන්ධ වෙමින් පවතියි.

මෙම මූලාශ්‍රයන්ගෙන් එක්රැස් කරගත් විසල් දත්ත ප්‍රධාන වශයෙන් ලක්ෂණ හතරකින් යුතු වේ: පරිමාව, විවිධත්වය, ප්‍රවේගය සහ නිරවද්‍යතාවය

- පරිමාව - විසල් දත්ත ප්‍රමාණාත්මකව විශාල වන අතර සාම්ප්‍රදායික දත්තවලට සාපේක්ෂව ඉතාම ක්ෂුද්‍ර මට්ටමේ තොරතුරු ද ඇතුලත් වේ.
- විවිධත්වය - ප්‍රමාණාත්මකව ඉහළ අගයක් ගැනීමට අමතරව, මිනිසා මෙන්ම යන්ත්‍ර විසින් නිපදවන ලද විවිධ මූලයන්ගෙන් ජනනය වූ මෙම දත්ත ඉතා සංකීර්ණ මෙන්ම විවිධ පැතිකඩවලින් ද යුතු වේ.
- ප්‍රවේගය - තාක්ෂණයේ දියුණුවත් සමගම මෙම දත්ත ඉහළ සංඛ්‍යාතයකින් යුතුව ඉතා ඉක්මණින් ජනනය කිරීමට මෙන්ම සකස් කිරීමේ ක්‍රියාවලියට භාජනය කිරීමට ද හැකි වනු ඇත.

---

1 දත්ත හුවමාරු කළ හැකි පරිදි, එදිනෙදා භාවිතා කරන උපකරණ තුළ අඩංගු පරිගණක මෙවලම්වල තිබෙන අන්තර්ජාල සබඳතා තුළින් එකිනෙකා හා සම්බන්ධ වීම.

2 මූල්‍ය තාක්ෂණික නිපැයුම් (Fin-Tech) යනු මූලික වශයෙන් මෘදුකාංග මගින් මූල්‍ය සේවා සැපයීම් කටයුතු සිදුකිරීමය. මෙම සංකල්පය මූල්‍ය සාක්ෂරතාවය සහ අධ්‍යාපනය හා සම්බන්ධ නවෝත්පාදන, සිල්ලර බැංකු කටයුතු, ආයෝජන සහ බිට්කොයින් (Bitcoin) වැනි ඩිජිටල් ව්‍යවහාර මුදල් (Crypto-Currencies) ආදී මූල්‍ය අංශයේ ඕනෑම තාක්ෂණික නවෝත්පාදනයක් ඇතුළත් වන පරිදි පුළුල්ව ඇත.

- නිරවද්‍යතාවය - මෙම දත්තවල ඉතා වැදගත් ලක්ෂණයක් වන්නේ ඒවා විවිධ දත්ත මූලාශ්‍රවලින් ලබාගන්නා හෙයින් යම් අවස්ථාවල දී එක් එක් මූලාශ්‍ර අතර දත්තවල වෙනස්කම් පැවතීම හෝ දත්තවල ගුණාත්මක භාවයෙහි වෙනස්කම් තිබිය හැකි වීමය. එම නිසා දත්තවල නිරවද්‍යතාවය සහ ප්‍රමිතිය පිළිබඳව නිරන්තර පරීක්ෂාවට ලක් කළ යුතුය. තවද නිරවද්‍යතාව සහ පවතින ප්‍රමිතිය සාම්ප්‍රදායික දත්තවල මට්ටමේම හෝ ඊට වඩා ඉහළ මට්ටමක විය යුතුය. මෙහිදී, දත්තවල ආවරණ පරාසය සහ භාවිතා කරන ක්‍රමවේදය පිළිබඳව පාරදෘශ්‍යභාවය පවත්වා ගැනීම නිරවද්‍යතාවය ඉහළ නැංවීම සඳහා ඉවහල් වනු ඇත.

### ආර්ථික හා මිල ස්ථායීතාවය සඳහා විසල් දත්ත

ආර්ථික ක්‍රියාකාරකම් හා මිල මට්ටම් නිරීක්ෂණය කිරීම සඳහා නව්‍ය ප්‍රවේශයකින් යුතුව පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමේ දී ප්‍රමාණාත්මකව විශාල වූ ඩිජිටල් දත්ත ස්වරූපයෙන් පවතින මෙම විසල් දත්ත යොදාගැනීමේ වාසි රැසක් පවතියි. තවද, ආර්ථිකයේ ඉදිරි ක්‍රියාකාරකම් පිළිබඳව පූර්ව දැනුම්දීමේ දර්ශක සම්පාදනය කිරීම තුළින් මෙන්ම ආර්ථිකයේ වත්මන් ස්වරූපය පිළිබඳව එසැනින් තොරතුරු ලබාදීම තුළින් තත්කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමේ දී ද විසල් දත්තවල කාලානුරූපී භාවය ඉවහල් වේ. සාම්ප්‍රදායික දත්ත මූලාශ්‍ර ආශ්‍රිතව මෙම තොරතුරු ලබාගැනීමට සැලකිය යුතු කාලයක් ගතවෙයි.

මුදල් ප්‍රතිපත්ති සඳහා විසල් දත්තවල එක් භාවිතයක් ලෙස භාණ්ඩ පැස නිරන්තරයෙන් වෙනස් කරමින් දෛනික උද්ධමන දර්ශකය ගණනය කිරීම සඳහන් කළ හැක. තවද, ජෝන් මේනාඩ් කේන්ස් ගෙනහැර දැක්වූ පරිදි ආර්ථික සමීකරණ සහ ආකෘතීන්ගෙන් නිශ්චය කර ගත නොහැකි මානව ස්වභාවය (Animal Spirit), එනම් මානවයාගේ සහජ සහ භාවාත්මක ස්වභාවයන් අධ්‍යයනය කිරීම සඳහා ලිඛිත කරුණු උකහා ගැනීමේ (Text mining) ක්‍රමවේදයක් සම්පාදනය කිරීමට ද විසල් දත්ත යොදාගත හැක. මෙම විසල් දත්තයන්හි විශාල ප්‍රගතියක් දක්නට ලැබුණ ද මහ බැංකුවල ප්‍රතිපත්ති සැකසීම සඳහා වඩාත් සුදුසු ආකාරයට මෙම විධික්‍රම ක්‍රියාකාරීව භාවිතා කිරීම තවමත් වැඩිදියුණු වෙමින් පවතින අතර එය අභියෝගාත්මක ද වෙයි. ඒ අනුව, විසල් දත්ත භාවිතයේ දී දත්ත පහසුවෙන් ලබාගැනීමට අපහසු වීම, පෞද්ගලිකත්වය පිළිබඳ සැලකිලිමත් විය යුතු වීම සහ දත්ත විශ්ලේෂණයේ දී ක්‍රමෝපායාත්මක ගැටලු පැවැතීම වැනි අභියෝග පවතී.

### මූල්‍ය පද්ධති ස්ථායීතාවය සඳහා විසල් දත්ත

මූල්‍ය පද්ධති ස්ථායීතාවය සඳහා මූල්‍ය අංශයේ කාලීන තොරතුරු ඉතා වැදගත් වන අතර විශේෂයෙන්ම ලෝක මූල්‍ය අර්බුදයෙන් පසු මෙම තොරතුරුවල වැදගත් භාවය තවත් වැඩි වෙමින් පවතී. තවද, බොහෝ ආර්ථිකයන්ගේ ආර්ථික හා මිල ස්ථායීතාවය සඳහා මූල්‍ය පද්ධතියේ ස්ථාවර භාවය අත්‍යවශ්‍ය කරුණක් ලෙස සැලකේ.

මූල්‍ය වෙළඳපොළ තොරතුරු එක්රැස්කර ගැනීම සඳහා මහ බැංකුවලට මනා හැකියාවක් පවතී. නැගී එන වෙළඳපොළ උපනතීන් සහ නව්‍යකරණයන් පිළිබඳ එවැනි තොරතුරු ඉදිරියේ දී මතුවිය හැකි අවදානම් පිළිබඳව පූර්ව දැනුම්දීමේ සංඥා ලෙස සැලකිය හැක. මේ ආකාරයේ තොරතුරු මූල්‍ය වෙළඳපොළ පිළිබඳව තවත් ආකාරයක ව්‍යාපාර බුද්ධි තොරතුරු රැස්කිරීමක් වෙයි. තවද, මූල්‍ය තාක්ෂණික නිපැයුම් (Fin-Tech) ආශ්‍රිතව හඳුන්වාදෙනු ලබන නව නිපැයුම් ආර්ථිකයේ ගෙවීම් හා පියවීම් පද්ධතීන්ට බලපානු ලැබේ. මෙම ආකාරයට පුළුල් පරාසයක් ආවරණය වන පරිදි මූල්‍ය අංශය පිළිබඳව ඉහළ සංඛ්‍යාතයකින් යුතු තොරතුරු එක්රැස් කර ගැනීම, මූල්‍ය අංශයේ වර්ධනය වන අවදානම් කලින් හඳුනාගැනීමට සහ දේශීය මෙන්ම විදේශීය මූල්‍ය ආයතන අතර පවතින අන්තර් සබඳතා හඳුනාගැනීම සඳහා ද මහ බැංකුවලට ඉතා වැදගත් වේ.

අන්තර්ජාතික පියවීම් බැංකුව (Bank of International Settlements) විසින් 2015 වසරේ දී සිදු කරන ලද සමීක්ෂණයක්[3] තුළින් විසල් දත්ත යනු සාර්ව ආර්ථික සහ මූල්‍ය ස්ථායීතාවය පිළිබඳව විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා කළ හැකි ඵලදායී මෙවලමක් ලෙස හඳුනාගෙන ඇත. සමීක්ෂණයට සහභාගි වූ බොහෝ මහ බැංකු විසින් විශේෂයෙන්ම ආර්ථික පුරෝකථනය, ව්‍යාපාර චක්‍රය පිළිබඳව විශ්ලේෂණය කිරීම සහ මූල්‍ය ස්ථායීතාවය පිළිබඳව විශ්ලේෂණය කිරීම වැනි සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථාවර භාවය සම්බන්ධ කටයුතුවල දී විසල් දත්තවල භාවිතය වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කර ඇත.

### ජාත්‍යන්තර යහ පිළිවෙත් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ක්‍රියාමාර්ග


විසල් දත්ත මෙන්ම ඉහළ සංඛ්‍යාතයකින් යුතු දර්ශක භාවිතය සඳහා වන නව නැඹුරුවත් සමග ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණ සිදු කරන මහ බැංකු ප්‍රමාණය

3 2015 ජනවාරි මස මහ බැංකු සංඛ්‍යා දත්ත පිළිබඳ අර්වින් ෆිෂර් කමිටුව (IFC) විසින් අන්තර්ජාතික පියවීම් බැංකුව, තුර්කි ජනරජයේ මහ බැංකුව සහ යුරෝපීය මහ බැංකුවේ සහයෝගය මත මහ බැංකුවල විසල් දත්තවල භාවිතය හා ඒ කෙරෙහි ඇති උනන්දුව පිළිබඳව අන්තර්ජාලය තුළින් සමීක්ෂණයක් සිදු කරන ලදී. ලොව පුරා පැතිරුණු IFC සාමාජික මහ බැංකු සහ මුදල් අධිකාරීන් 69 ක් මෙම සමීක්ෂණයට පිළිතුරු සපයන ලද අතර ප්‍රතිචාර දක්වන ලද ප්‍රතිශතය සියයට 83 ක් විය.

2

**රූප සටහන වි.ස. 4.1**

**විසල් දත්ත ගවේෂණය කිරීමෙන් මහ බැංකු විසින් බලාපොරොත්තු වන ප්‍රතිඵල**




මූලය : මහ බැංකු සංඛ්‍යා දත්ත පිළිබඳ අර්වින් ෆිෂර් කමිටුව, 2015 සමීක්ෂණය

පසුගිය දශකය තුළ ඉතා වේගයෙන් ඉහළ ගොස් ඇත. ආර්ථිකය පිළිබඳ වැදගත් බුද්ධි තොරතුරු එක්රැස් කර ගැනීමේ අරමුණින් යුතු එම සමීක්ෂණ ෆෙඩරල් සංචිත බැංකුවේ බේජ් බුක් (Beige Book) සමීක්ෂණය, කැනේඩියානු මහ බැංකුවේ ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, එංගලන්ත මහ බැංකුවේ ව්‍යාපාර තත්ත්වය පිළිබඳ නියෝජිත සාරාංශය (Agents' Summary of Business Conditions), ජපාන මහ බැංකුවේ ටන්කන් (Tankan) සමීක්ෂණය සහ ඕස්ට්‍රේලියානු සංචිත බැංකුවේ ව්‍යාපාර සබඳතා වැඩසටහන (Business Liaison Programme) ලෙස විවිධ නම්වලින් හඳුන්වා දී ඇත. මෙම ගුණාත්මක දත්ත එක්රැස් කරන සමීක්ෂණ මගින් විවිධ සිද්ධීන් පිළිබඳව ප්‍රතිචාර දක්වන්නන්ගේ අදහස් සහ පවත්නා තත්ත්වයන් යටතේ ඔවුන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු එක්රැස් කරගනු ලැබේ. සමීක්ෂණ ප්‍රතිඵල අනන්‍ය මෙන්ම අදාළ අවස්ථාවට විශේෂිත සහ යම් නිශ්චිත අවස්ථාවකට අදාළව ප්‍රතිචාර දක්වන්නන්ගේ මතය පිළිබිඹු කරන හෙයින් අළුතින් දත්ත පැමිණිය ද එසේ ලබාගත් තොරතුරු පසුකාලීනව සංශෝධනයන්ට ලක් නොවෙයි. ඒ අනුව, මෙම දත්ත යල් පනින ලද සහ වෙනස්වීමට බඳුන්විය හැකි නිල දත්තවලට වඩා ප්‍රයෝජනවත් වන මගපෙන්වීමක් ලබා දේ. මෙයට අමතරව, මෙම සමීක්ෂණ මගින් සාර්ව ආර්ථික විචල්‍යයන් තහවුරු කිරීමට උපකාරී වන පාරිභෝගික හා ව්‍යාපාරික චේතනා, විශ්වාස සහ අපේක්ෂා වැනි අතිරේක තොරතුරු උකහා ගැනීමට ද හැකියාවක් ඇත.

උද්ධමනය කෙරෙහි සහ මුදල් ප්‍රතිපත්ති ප්‍රමුඛතා සඳහා පීඩනයන් ඇති කරනු ලබන දැනට පවත්නා සහ අපේක්ෂිත ප්‍රවණතාව පිළිබඳ තොරතුරු මෙම සමීක්ෂණ තුළින් ලබා දෙන බැවින් මෙම ආර්ථිකයන්හි මහ බැංකු හෝ මූල්‍යය අධිකාරීන් මෙවැනි සමීක්ෂණ මගින් එක්රැස් කර ගන්නා තොරතුරු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. මෙම තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින් හට සිය ප්‍රතිපත්ති ක්‍රමයෙන් ආර්ථිකයට බලපාන ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය විකල්ප දර්ශක ද ජනනය කරයි. සමස්තයක් ලෙස, ආකෘතීන් මගින් පහසුවෙන් ග්‍රහණය කර ගැනීමට නොහැකි ව්‍යාපාර චක්‍රයේ හැරවුම් ලක්ෂ පිළිබඳ සංඥාවන් මෙන්ම ඒ සඳහා පාදක වූ හේතූන් සහ අදාළ පූර්ව දැනුම් දීම් මෙම සමීක්ෂණ තුළින් සපයනු ලබයි. තවද, ව්‍යාපාර අංශ තුළ සිදුවන දිගුකාලීන ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳව වඩාත් ගැඹුරු ලෙස අවබෝධ කරගැනීමට ද ආර්ථික පරිසරයේ සිදුවන වෙනස්කම් හඳුනාගැනීමට ද මෙම තොරතුරු ඉතා වැදගත් වේ.

මෙවන් ජාත්‍යන්තර භාවිතයන්ට සමගාමීව ශ්‍රී ලංකා මහ බැංකුව ද මෑතකාලීනව ව්‍යාපාර හා කර්මාන්ත සමග සබඳතා තවදුරටත් වර්ධනය කර ගැනීමේ අරමුණෙන් පහත සඳහන් ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණ ආරම්භ කරන ලදී. ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය සහ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය මගින් සම්පාදනය කරන ලද ව්‍යාපාර මතය පිළිබඳ දර්ශක මහජනතාවගේ දැනුම්වත් වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කරනු ලබන අතර ණය තත්ත්වය පිළිබඳ සමීක්ෂණයෙහි ප්‍රතිඵල අභ්‍යන්තර අධ්‍යයනයන් සඳහා භාවිතා වේ.

| | |
|---|---|
| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය | නිෂ්පාදන කර්මාන්ත සහ සේවා ක්‍රියාකාරකම් වලට අදාල වැදගත් විචල්‍යයන් අධ්‍යයනය කිරීම සඳහා මාසිකව සිදුකරන සමීක්ෂණයකි. |
| ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය | ප්‍රධාන ව්‍යාපාර ආයතනවල ව්‍යාපාර මතය පිළිබඳව කාර්තුමය වශයෙන් සිදුකරන සමීක්ෂණයකි. |
| ණය තත්ත්වය පිළිබඳ සමීක්ෂණය | ආර්ථිකයෙහි ණය තත්ත්වය ඇගයීම සඳහා සිදුකරන අර්ධ වාර්ෂික සමීක්ෂණයකි. |

**මහ බැංකු සංඛ්‍යා දත්තවල නව මානයන්**

ව්‍යාපාර බුද්ධි තොරතුරු සහ විසල් දත්ත සම්බන්ධව මහ බැංකු වර්තමානයෙහි ඉහළ අවධානයක් යොමු කර ඇත. අනාගතයේ දී ව්‍යාපාර බුද්ධි තොරතුරු සහ විසල් දත්තවලින් ලැබෙන තොරතුරු මහ බැංකුවල ප්‍රතිපත්ති සම්පාදනය ඔප්නැංවීමට හේතු වනු ඇත. එම නිසා ඉදිරි දැක්මක් සහිතව ප්‍රතිපත්ති සැකසීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් මෙම නව ප්‍රවණතාවයන් පිළිබඳ දැනුම්වත් විය යුතු අතර ඒවායෙන් ඉහළ ප්‍රයෝජන ලබාගෙන අනෙකුත් පුද්ගලයන් හා ආයතනවලට වඩා ඉදිරියෙන් ක්‍රියාත්මක විය යුතු වේ. එබැවින් මහ බැංකුවල ව්‍යාපාර බුද්ධි තොරතුරු එක්රැස් කරන්නන් ආර්ථිකය පිළිබඳව සිය අවබෝධය වර්ධනය කර ගැනීම සඳහා ආර්ථිකයේ පුළුල් පරාසයක් ආවරණය වන පරිදි අන්තර් පුද්ගල සන්නිවේදනය වර්ධනය කරගත යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව ද ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණවලට අමතරව

ඉහළ සංඛ්‍යාතයකින් යුතු තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා විවිධ පියවර ගෙන ඇති අතර එමගින් සංවර්ධිත ආර්ථිකයන්ගේ මහ බැංකු හා බොහෝ දුරට සමගාමීව යමින් ඉතා ප්‍රයෝජනවත් තොරතුරු සහිත ගුණාත්මක දත්ත සමූහයක් එක් රැස් කර ගැනීමට හැකි වී ඇත.

තොරතුරුවල මෙම නව විකසනයන් අඛණ්ඩව ඇගයිය යුතු අතර, ව්‍යාපාර බුද්ධි තොරතුරු ව්‍යාපාර චක්‍රයන්හි හැරවුම් ලක්ෂ්‍යය පුරෝකථනය කිරීම සඳහා අනාගතයේ දී පෘථුලව භාවිතා කළ යුතු වේ. එබැවින් මෙම නව ප්‍රවණතාවයන්ගේ වැදගත්කම සහ සීමාවන් වටහාගෙන කටයුතු කිරීම මහ බැංකුවලට අභියෝගාත්මක වන තීරණ ගැනීමේ ක්‍රියාදාමයට නිවැරදි දිශානතියකින් යුතුව මුහුණ දීමට උපකාරී වනු ඇත. මේ අතර, වර්තමානයේ දී අතීතයට වඩා දත්ත ඉහළ පරිමාවකින් යුතු වීම සහ එම දත්ත සඳහා ප්‍රවේශ වීම හා ලබාගැනීමට හැකියාව තිබීම හේතුවෙන් මහ බැංකුවල සංඛ්‍යාඥයන්ගේ භූමිකාව පරිවර්තනය වෙමින් පවතී. ඔවුන් තවදුරටත් පැරණි ආකාරයේ අතීත සරල දත්ත පහසුවෙන් සම්පාදනය කරන්නන් නොව, අනාගතයේ දී ආර්ථිකයට බලපානු ලබන වෙනස්කම් කලින් දැනගැනීමට සමත් බුද්ධි නියෝජිතයෙකු, නිපුන දත්ත විශ්ලේෂකයෙකු හෝ දත්ත පිළිබඳ විද්‍යාඥයෙකු ලෙස ඔවුන්ගේ අනාගත භූමිකාව විකාශනය වනු ඇත.


මූලාශ්‍ර:

IFC Report, Central banks' use of and interest in "big data", Irving Fisher Committee on Central Bank Statistics (IFC), October 2015.

Markets Committee, "Market intelligence gathering at Central Banks", Bank of International Settlements, December 2016.

Nii Ayi Armah, 2013. "Big Data Analysis: The Next Frontier," Bank of Canada Review, Bank of Canada, vol. 2013(Summer), pages 32-39.

Organisation for Economic Cooperation and Development (OECD). 2015. OECD Digital Economy Outlook 2015. Paris: OECD Publishing.

Per Nymand-Andersen 2016. "Big data: the hunt for timely insights and decision certainty", Irving Fisher Committee on Central Bank Statistics, IFC Working Papers No 14


මන්දගාමී වීම කෙරෙහි හේතු විය. මේ අතර, රාජ්‍ය පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 13.4 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 3.1 කින් වර්ධනය විය. ඒ අනුව, අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සඳහා වන රාජ්‍ය වියදම් ඇතුළත් වන රජයේ පුද්ගල පරිභෝජන වියදම සහ රජයේ සමූහ පරිභෝජන වියදම 2015 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 22.6 ක සහ සියයට 9.5 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 2.7 කින් සහ සියයට 3.3 කින් වර්ධනය විය. මෙම මන්දගාමීත්වය සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, වැටුප් සහ වේතන සඳහා වන රජයේ පුනරාවර්තන වියදම් 2015 වසරේ දී වාර්තා කළ සියයට 27.4 ක වර්ධනය 2016 වසරේ දී සියයට 2.6 ක් දක්වා මන්දගාමී වූ අතර අනෙකුත් භාණ්ඩ සහ සේවා මිලට ගැනීම් සඳහා වන වියදම 2015 වසරේ දී වාර්තා කළ සියයට 64.9 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 19.5 කින් පහත වැටුණි.

**පෞද්ගලික පරිභෝජන වියදම සඳහා ඉහළම දායකත්වය දක්වන ආහාරපාන සහ මද්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය කාණ්ඩය 2015 වසරේ දී වාර්තා කළ සියයට 18.4 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 5.1 කින් වර්ධනය විය.** රුපියල් වටිනාකම අනුව ආහාර සහ පාන වර්ග ආනයන දර්ශකය 2015 වසරේ දී වාර්තා කළ සියයට 3.5 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී 7.3 කින් වර්ධනය විය. කෙසේ වුවද, ආනයන පරිමා දර්ශකය සලකා බැලීමේ දී ආහාර සහ පාන වර්ග කාණ්ඩයේ පහත වැටීමක් දක්නට ලැබුණි. මෙමගින් එම කාණ්ඩයේ භාණ්ඩ ආනයනයෙහි දක්නට ලැබුණු නාමික වර්ධනය කෙරෙහි ඉහළ මිල මට්ටම් හේතු වූ බව පිළිබිඹු විය. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013 = 100) ආහාර සඳහා වූ උද්ධමනය 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක අගයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 3.1 ක සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ ගියේය. පෞද්ගලික පරිභෝජන වියදම සඳහා මෙම කාණ්ඩයේ දායකත්වය 2015 වසරේ දී වාර්තා කළ සියයට 27.7 ක අගයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 27.9 ක් විය.

**2016 වසරේ දී මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන හා වෙනත් මත්ද්‍රව්‍ය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 10.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 16.7 කින් වර්ධනය විය.** වසර තුළ දී මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන හා වෙනත් මත්ද්‍රව්‍ය සඳහා රජය විසින් අය කරනු ලබන බදු ඉහළ නැංවීම මෙම කාණ්ඩයේ පරිභෝජන වියදමෙහි නාමික වටිනාකම ඉහළ යාමට යම් දායකත්වයක් දැක්වීය. 2016 වසරේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) මද්‍යසාර හා දුම්කොළ සඳහා වූ උද්ධමනය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 17.5 ක අගයට සාපේක්ෂව සියයට 22.1 ක් දක්වා ඉහළ යෑම තුළින් ද මෙම නිෂ්පාදනවල මිල මට්ටම්වල ඉහළ යෑම පිළිබිඹු විය. ඒ අනුව, 2016 වසරේ දී පෞද්ගලික පරිභෝජන වියදම සඳහා මෙම කාණ්ඩයෙහි දායකත්වය, 2015 වසරේ දී පැවැති සියයට 1.9 ක අගයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 2.1 ක් දක්වා වර්ධනය විය.

**2016 වසරේ දී ඇඳුම් පැළඳුම් සහ පාවහන් සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 7.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 17.7 කින් පහත වැටුණි.** රුපියල් වටිනාකම අනුව 2016 වසරේ දී

2

**2.10 සංඛ්‍යා සටහන**
**සමස්ත ඉල්ලුම (අ)**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළඳපොළ මිල අනුව | | | 2010 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2014 (ආ) | 2015 (ආ)(ඇ) | 2016 (ඇ) | 2014 (ආ) | 2015 (ආ)(ඇ) | 2016 (ඇ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 7,850,006 | 8,661,886 | 9,018,895 | 6,109,435 | 6,645,230 | 6,704,462 |
| (% වෙනස) | 8.6 | 10.3 | 4.1 | 3.9 | 8.8 | 0.9 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 3,347,638 | 3,114,674 | 3,723,875 | 2,896,597 | 2,931,967 | 3,463,352 |
| (% වෙනස) | 5.0 | -7.0 | 19.6 | 11.5 | 1.2 | 18.1 |
| **මුළු දේශීය ඉල්ලුම** | **11,197,644** | **11,776,561** | **12,742,771** | **9,006,032** | **9,577,198** | **10,167,814** |
| **(% වෙනස)** | **7.5** | **5.2** | **8.2** | **6.2** | **6.3** | **6.2** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 2,185,039 | 2,301,065 | 2,538,695 | 1,533,668 | 1,605,147 | 1,593,861 |
| (% වෙනස) | 12.1 | 5.3 | 10.3 | 4.3 | 4.7 | -0.7 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 3,021,531 | 3,125,931 | 3,442,490 | 2,304,271 | 2,548,455 | 2,749,649 |
| (% වෙනස) | 8.9 | 3.5 | 10.1 | 9.6 | 10.6 | 7.9 |
| **ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-836,493** | **-824,865** | **-903,795** | **-770,603** | **-943,307** | **-1,155,787** |
| **(% වෙනස)** | **-1.2** | **1.4** | **-9.6** | **-21.9** | **-22.4** | **-22.5** |
| 3. මුළු ඉල්ලුම | **10,361,151** | **10,951,695** | **11,838,975** | **8,235,429** | **8,633,890** | **9,012,026** |
| **(% වෙනස)** | **8.0** | **5.7** | **8.1** | **5.0** | **4.8** | **4.4** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රෙදිපිළි සහ උපාංග ආනයන දර්ශකය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 43.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.4 ක සාපේක්ෂ අඩු වර්ධනයක් පෙන්වීම තුළින් ද මෙම පහළ යෑම පිළිබිඹු විය. තවද, 2015 වසරේ දී සියයට 26.3 ක වර්ධනයක් වාර්තා කළ රෙදිපිළි සහ උපාංග ආනයන පරිමා දර්ශකය 2016 වසරේ දී සියයට 13.7 කින් පහත වැටුණි. ඒ අනුව, පෞද්ගලික පරිභෝජන වියදම සඳහා මෙම කාණ්ඩයෙහි දායකත්වය 2015 වසරේ දී පැවැති සියයට 3.9 හි සිට 2016 වසරේ දී සියයට 3.0 ක් දක්වා පහළ ගියේය.

**2016 වසරේ දී නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන් සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 11.5 ක වර්ධනයට සාපේක්ෂව සියයට 9.5 කින් වර්ධනය විය.** ගෘහස්ථ අංශයේ සමස්ත විදුලි පරිභෝජනයෙහි අඛණ්ඩ ඉහළ යෑමක් පෙන්නුම් කරමින් ගෘහස්ථ අංශය සඳහා වූ විදුලි බල අලෙවිය 2015 වසරේ දී වාර්තා කළ සියයට 10.1 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 8.3 කින් වර්ධනය විය. තවද, ගෘහස්ථ අංශය සඳහා බෙදාහරින ලද ජල ඒකක ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා කළ සියයට 7.1 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසර තුළ දී සියයට 12.9 කින් වර්ධනය විය. මේ අතර, විදුලිය සහ ජල ගාස්තු මෙන්ම ඩීසල් සහ පෙට්‍රල් මිල ගණන් ද වසර තුළ දී ස්ථාවර මට්ටමක පැවැති අතර ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් මිල 2016 නොවැම්බර් මාසයේ දී පහත දමන ලදී. 2016 වසරේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති සඳහා වූ උද්ධමනය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 4.2 ට සාපේක්ෂව සියයට 0.1 ක සුළු වර්ධනයක් පෙන්වීම තුළින් ද මෙම කාණ්ඩය සඳහා මිල ඉහළ යෑම මගින් ඇති වූ බලපෑම අඩු බව පිළිබිඹු විය.

**2016 වසර තුළ දී ප්‍රවාහන කටයුතු සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 7.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.2 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙහි දී ප්‍රවාහනය ආශ්‍රිත භාණ්ඩ සඳහා වන පෞද්ගලික පරිභෝජන වියදම පිළිබිඹු කරනු ලබන මෝටර් රථ සහ මෝටර් සයිකල් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාවෙහි වසර තුළ දී සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි. එසේ වුවද, 2016 වසරේ අගෝස්තු මාසයේ දී මගී ප්‍රවාහන ගාස්තුවල වැඩිවීම ප්‍රවාහනය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම යම්තාක් දුරට ඉහළ යෑමට හේතු විය.

**2015 වසරේ දී සියයට 22.1 කින් වර්ධනය වූ සෞඛ්‍ය කටයුතු සඳහා වන පෞද්ගලික පරිභෝජන වියදම 2016 වසරේ දී සියයට 10.4 ක සාපේක්ෂ අඩු වේගයකින් වර්ධනය වූ අතර, 2015 වසරේ දී**

**සියයට 0.3 කින් පහළ ගිය අධ්‍යාපන කටයුතු සඳහා වන පෞද්ගලික පරිභෝජන වියදම 2016 වසරේදී ද සියයට 1.8 කින් පහත වැටුණි.** ඉල්ලුම කෙරෙහි බලපෑම් ඇති කරමින් වසර තුළ දී පනවන ලද වක්‍ර බදු, සෞඛ්‍යය සහ අධ්‍යාපනය සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු පසුබෑම කෙරෙහි යම් තරමකට දායක විය. මේ අතර, තෝරාගත් ඖෂධ වර්ගවල මිල ගණන් පහත දැමීම ද සෞඛ්‍ය සේවා සඳහා යන වියදම පහළ යෑම කෙරෙහි හේතුවන්නට ඇත. මෙහි දී, පෞද්ගලික පරිභෝජන වියදම සඳහා මෙම කාණ්ඩවල දායකත්වය පිළිවෙළින් සියයට 3.1 ක් සහ සියයට 1.5 ක් වශයෙන් අඩු මට්ටමක පවතින අතර රජය විශාල වශයෙන් මූලික අධ්‍යාපනික සහ සෞඛ්‍යය සේවාවන් නොමිලයේ සැපයීම මෙම කාණ්ඩය සඳහා වන පෞද්ගලික පරිභෝජන වියදම අඩු වීම කෙරෙහි හේතු විය. මෙම ප්‍රවණතාවය නිෂ්පාදන ප්‍රවේශ ඇස්තමේන්තුවල සෞඛ්‍ය හා අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය අංශය වැඩිම දායකත්වය දැක්වීම තුළින් ද පිළිබිඹු විය.

**2016 වසරේ දී සන්නිවේදන කටයුතු සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 17.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.5 කින් වර්ධනය විය.** සන්නිවේදන සේවා සඳහා එකතු කළ අගය මත බදු පැනවීම හේතුවෙන් අදාළ ඒකක පිරිවැය ඉහළ යෑම මෙම සේවා සඳහා පවතින ඉල්ලුම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. තවද, සන්නිවේදන සේවාවල පැවැති අවම මිල මට්ටම ද වසර තුළ දී ඉහළ නංවන ලදී. 2016 වසරේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) සන්නිවේදන සේවා කාණ්ඩය සඳහා වන උද්ධමනය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 0.1 ට සාපේක්ෂව සියයට 6.8 කින් ඉහළ යෑම තුළින් ද මෙය පිළිබිඹු විය. එමෙන්ම, 2015 වසරේ දී පිළිවෙළින් සියයට 8.8 කින් හා සියයට 20.9 කින් වර්ධනය වූ දුරකථන සහ සමස්ත අන්තර්ජාල සේවා සබඳතා 2016 වසරේ දී පිළිවෙළින් සියයට 6.6 ක් සහ සියයට 20.3 ක් ලෙස සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. තවද, රුපියල් වටිනාකම අනුව සන්නිවේදන උපාංග ආනයන දර්ශකය ද 2016 වසර තුළ දී අඩු වේගයකින් වර්ධනය විය.

**2016 වසර තුළ දී හෝටල් සහ ආපනශාලා පහසුකම් සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 1.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.0 කින් අඛණ්ඩව වර්ධනය විය.** රට තුළ පවතින හිතකර වාතාවරණයත් සමගම ජනතාවගේ ජීවන රටාවෙහි දක්නට ලැබෙන වෙනස්වීම් මෙන්ම හෝටල් සහ ආපනශාලාවල ශීඝ්‍ර වර්ධනය, ජාත්‍යන්තර ආපනශාලා ජාලවල ව්‍යාප්තිය මෙන්ම සංචාරක ක්‍රියාකාරකම් ඉහළ යෑම ද මෙම අංශය සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව පැවැතීම සඳහා දායක වී ඇත.

**2.11 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය (අ)**

| | කාණ්ඩය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|---|
| | | 2014(ආ) | 2015 (ආ)(ඇ) | 2016 (ඇ) | 2015 (ආ)(ඇ) | 2016 (ඇ) |
| 1. | ආහාරපාන සහ මද්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය | 25.7 | 27.7 | 27.9 | 18.4 | 5.1 |
| 2. | මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ වෙනත් මත්ද්‍රව්‍ය | 1.9 | 1.9 | 2.1 | 10.3 | 16.7 |
| 3. | ඇඳුම්-පැළඳුම් සහ පාවහන් | 3.9 | 3.9 | 3.0 | 7.7 | -17.7 |
| 4. | නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන් | 10.7 | 10.9 | 11.4 | 11.5 | 9.5 |
| 5. | ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ සහ දෛනික නිවාස අලුත්වැඩියාවන් | 1.3 | 1.2 | 1.4 | 1.0 | 18.1 |
| 6. | සෞඛ්‍යය | 2.6 | 2.9 | 3.1 | 22.1 | 10.4 |
| 7. | ප්‍රවාහනය | 22.2 | 21.7 | 21.5 | 7.6 | 3.2 |
| 8. | සන්නිවේදනය | 0.9 | 1.0 | 1.0 | 17.9 | 8.5 |
| 9. | ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු | 1.3 | 1.7 | 1.5 | 44.5 | -9.8 |
| 10. | අධ්‍යාපනය | 1.8 | 1.6 | 1.5 | -0.3 | -1.8 |
| 11. | හෝටල් සහ ආපනශාලා පහසුකම් | 4.4 | 4.1 | 4.2 | 1.7 | 8.0 |
| 12. | වෙනත් තැනක සඳහන් නොවන විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීම | 25.3 | 24.2 | 24.9 | 5.0 | 7.2 |
| 13. | ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 2.5 | 2.7 | 2.9 | 16.5 | 15.0 |
| 14. | අඩු කළා: විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 4.6 | 5.3 | 6.5 | 27.4 | 26.3 |
| | **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **10.0** | **4.3** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2


**රජයේ සමූහ පරිභෝජන වියදම සහ පුද්ගල පරිභෝජන වියදමෙන් සමන්විත වන රජයේ සමස්ත පරිභෝජන වියදම, වසර තුළ දී රජය විසින් ක්‍රියාත්මක කරන්නට යෙදුණු රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවට අදාළ ක්‍රියාමාර්ග සමග මන්දගාමී විය.** රජයේ පරිභෝජන වියදමෙහි ප්‍රධානතම කාණ්ඩය වන රජයේ සමූහ පරිභෝජන වියදම 2016 වසරේ දී සමස්ත රාජ්‍ය පරිභෝජන වියදමෙන් සියයට 67.7 කට දායක විය. මෙහි රජය විසින් මහජනතාවගේ සුභසිද්ධිය උදෙසා සමස්තයක් ලෙස දරනු ලබන සාමාන්‍ය රජයේ සේවාවන්, ආරක්ෂාව, නීතිය හා සාමය, ආර්ථික කටයුතු, පරිසර ආරක්ෂාව, නිවාස සහ පොදු පහසුකම්, ක්‍රීඩා හා විනෝදාංශ, ආගමික හා සංස්කෘතික කටයුතු සහ සමාජ ආරක්ෂාව සඳහා වන වියදම් අන්තර්ගත වේ. ඒ අනුව, 2016 වසර තුළ දී රජයේ සමූහ පරිභෝජන වියදමෙහි නාමික වටිනාකම, 2015 වසර තුළ දී වාර්තා කළ සියයට 9.5 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.3 කින් වර්ධනය විය. මෙම සාපේක්ෂ අඩු වර්ධනය සඳහා 2015 වසරේ දී සියයට 4.2 ක ඉහළ යෑමක් වාර්තා කළ ආරක්ෂාව සඳහා වන රජයේ සමූහ පරිභෝජන වියදම මෙම වසරේ දී සියයට 9.0 කින් පහත වැටීම මූලික වශයෙන් හේතු විය. මේ අතර, එක් එක් පුද්ගලයින්ගේ අධ්‍යාපන සහ සෞඛ්‍ය කටයුතු සඳහා ප්‍රතිලාභ වශයෙන් රජය විසින් දරනු ලබන රජයේ පුද්ගල පරිභෝජන වියදම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 22.6 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 2.7 ක් දක්වා මන්දගාමී විය. ඒ අනුව, 2015 වසරේ දී පිළිවෙළින් සියයට 28.4 ක හා සියයට 16.1 ක වර්ධනයක් වාර්තා කළ අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා වන රජයේ පරිභෝජන වියදම් 2016 වසරේ දී පිළිවෙළින් සියයට 1.2 කින් හා සියයට 4.5 කින් වර්ධනය විය.

## ආයෝජන

**2016 වසරේ දී ආයෝජන වියදමෙහි නාමික වටිනාකම, 2015 වසරේ දී වාර්තා කළ සියයට 7.0 ක පහළ යෑමට සාපේක්ෂව යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් සියයට 19.6 ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී.** 2015 වසරේ දී සියයට 0.2 ක සුළු පහත වැටීමක් වාර්තා කළ ඉදිකිරීම් කටයුතු සඳහා වන ආයෝජන වියදම 2016 වසරේ දී සියයට 18.0 ක ඉහළ වර්ධනයක් වාර්තා කරමින් සමස්ත ආයෝජනවල වර්ධනය සඳහා බෙහෙවින් දායක විය. වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලබාදෙන ණය ප්‍රමාණයෙහි ඉහළ වර්ධනය තුළින් ද පිළිබිඹු වූ පරිදි ආයෝජන සඳහා පෞද්ගලික අංශයේ ඉහළ දායකත්වය මෙන්ම රජයේ මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘති ද සමස්ත ආයෝජන ඉහළ යෑම සඳහා හේතු විය. තවද, ඉදිකිරීම් කටයුතු සඳහා

**2.8 රූප සටහන**

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවල විදේශීය සෘජු ආයෝජන (අ) (එ.ජ.ඩොලර් මිලියන)**




(අ) ණය ද ඇතුළත්ව

මූලය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

යොදාගනු ලබන ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනයේ සැලකිය යුතු ඉහළ යෑම මගින් ද, මෙම වර්ධනය පිළිබිඹු විය. මේ අතර, යන්ත්‍රසූත්‍ර සහ යුධමය ආම්පන්න සඳහා වූ වියදම 2015 වසරේ දී වාර්තා කළ සියයට 2.0 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.3 කින් වර්ධනය විය. වසර තුළ දී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන දර්ශකය වටිනාකම අනුව මෙන්ම පරිමාව අනුව ද ඉහළ වර්ධනයක් අත්කර ගැනීම මගින් ද මෙම වර්ධනය පිළිබිඹු විය. තවද, ප්‍රවාහන උපකරණ, තොරතුරු තාක්ෂණ උපකරණ සහ බුද්ධිමය දේපළ සඳහා වන ආයෝජන 2016 වසරේ සමස්ත ආයෝජන ක්‍රියාකාරකම්වල වර්ධනය සඳහා දායක වූ අතර වගා කළ ජෛව විද්‍යාත්මක සම්පත් සඳහා වන ආයෝජන වසර තුළ දී පහත වැටුණි. තවද, තොග පරිලේඛන වෙනස්වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම් 2015 වසරේ දී වාර්තා කළ සියයට 56.1 ක පහත වැටීමට සාපේක්ෂව 2016 වසර තුළ දී සියයට 121.8 කින් ඉහළ යමින් ආයෝජනවල වර්ධනය සඳහා දායක විය.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත 2016 වසරේ දී ලැබුණු සමස්ත විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 801 ක් වූ අතර, එය 2015 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 969.7 හා සාපේක්ෂව සියයට 17.4 ක පමණ පසුබෑමක් පෙන්නුම් කරයි.** ආයෝජන ලැබීම් යටිතල පහසුකම් ව්‍යාපෘති, සේවා අංශයේ කටයුතු, නිෂ්පාදන අංශයේ කටයුතු සඳහා, පිළිවෙළින්, සියයට 25.1 කින්, සියයට 17.0 කින් හා සියයට 3.6 කින් අඩු වීම මෙම කාලය තුළ දී ආයෝජන ලැබීම් පහත වැටීමට ප්‍රධාන හේතුව විය. මෙම කාලය තුළ ලද විදේශීය

**2.12 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායවල ආයෝජන සහ සේවා නියුක්තිය**

| | ව්‍යාපෘති සංඛ්‍යාව | | ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 (අ) | 2016 (ආ) | 2015 (අ) | | | 2016 (ආ) | | | 2015 (අ) | 2016 (ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| **ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ)** | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 241 | 205 | 337,716 | 257,907 | 595,623 | 1,009,516 | 347,838 | 1,357,354 | 38,408 | 27,153 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 224 | 191 | 335,840 | 256,535 | 592,375 | 1,008,467 | 347,766 | 1,356,233 | 37,616 | 26,850 |
| 16 වන වගන්තිය යටතේ | 17 | 14 | 1,876 | 1,373 | 3,248 | 1,049 | 72 | 1,121 | 792 | 303 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 155 | 180 | 147,631 | 141,675 | 289,307 | 528,215 | 226,566 | 754,781 | 23,426 | 27,300 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ) | 1,989 | 1,929 | 1,236,251 | 755,557 | 1,991,808 | 1,345,715 | 834,098 | 2,179,813 | ලැ.නො. | ලැ.නො. |
| වාණිජ කටයුතුවල නිරතවූ ව්‍යාපෘති (ඈ) | 2,758 | 2,831 | 446,553 | 4,166,703 | 4,613,256 | 477,167 | 4,210,416 | 4,687,583 | 414,744 | 424,320 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 2,032 | 2,097 | 411,962 | 4,155,929 | 4,567,892 | 441,744 | 4,199,306 | 4,641,050 | 377,586 | 387,112 |
| 16 වන වගන්තිය යටතේ | 726 | 734 | 34,591 | 10,774 | 45,365 | 35,423 | 11,110 | 46,534 | 37,158 | 37,208 |
| **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය** ලියාපදිංචි වූ සමාගම් (ඈ) | 2,276 | 2,436 | - | - | 204,522 | - | - | 204,975 | 311,698 | 315,681 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘති ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත.
සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘති, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තීරුබදු සහ විනිමය පාලන විධිවිධානවලින් නිදහස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

සෘජු ආයෝජනවලින් බහුතරය යටිතල පහසුකම් අංශය සඳහා වන අතර, එය සමස්ත විදේශීය සෘජු ආයෝජනවලින් සියයට 42.4 ක් පමණ (එ.ජ.ඩොලර් මිලියන 339.5 ක්) වේ. 2016 වසරේ දී ලැබුණු සමස්ත විදේශීය සෘජු ආයෝජනවලින් සියයට 30.9 ක් පමණ නියෝජනය කරමින් නිෂ්පාදන අංශයේ විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 247.7 ක් වූ අතර, සේවා අංශයේ විදේශීය සෘජු ආයෝජන ප්‍රමාණය සමස්ත විදේශීය සෘජු ආයෝජනවලින් සියයට 26.5 ක් (එ.ජ.ඩොලර් මිලියන 211.9 ක්) විය.

**ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වන වගන්ති යටතේ 2016 වසරේ දී අනුමත කළ ව්‍යාපෘති වෙත ලැබුණු සමස්ත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 1,357.4 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** සේවා අංශය, රසායනික ද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන මෙන්ම ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත අංශය සඳහා අනුමත කරන ලද ආයෝජන වටිනාකම 2015 වසරට සාපේක්ෂව ඉහළ අගයක් වාර්තා කළේය. කෙසේ වුවද, ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත, රෙදිපිළි, ඇඟලුම් හා සම් නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිතයන්, යන්ත්‍ර හා ප්‍රවාහන උපකරණ අංශවල ව්‍යාපෘති සඳහා ලැබුණු ඇස්තමේන්තුගත ආයෝජන අඩු අගයක් වාර්තා කළේය. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 754.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2015 වසරට සාපේක්ෂව සියයට 160.9 ක වර්ධනයකි. 2016 වසර අවසානය වන විට ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වන වගන්ති යටතේ වාණිජ කටයුතුවල නිරත වූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 4,687.6 ක් විය. ආයෝජන මණ්ඩලය යටතේ දැනට සිදු කර ඇති ආයෝජනවල සමුච්චිත අගය 2016 වසර අවසානය වන විට රුපියල් බිලියන 2,179.8 ක් විය.

## පවත්නා සම්පත් සහ උපයෝජනය

**2016 වසරේ දී ආර්ථිකයේ පවත්නා සම්පත් ප්‍රමාණය, 2015 වසරේ දී නාමික වශයෙන් වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව සියයට 8.6 කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 15,281.5 ක අගයක් වාර්තා කරන ලදී.** මෙහිදී, 2015 වසරට සාපේක්ෂව ද.දේ.නි. මෙන්ම විදේශ සම්පත්වල නාමික වටිනාකමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණි. ද.දේ.නි. ගම්‍ය අවධමනකයෙහි ඉහළ යෑම තුළින් ද පිළිබිඹු වූ මිල මට්ටම්වල ඉහළ යෑම


2

2

දේශීය සම්පත්වල නාමික වර්ධනය කෙරෙහි බෙහෙවින් දායක විය. තවද, දේශීය සම්පත් ඉහළ යෑම කෙරෙහි කර්මාන්ත සහ සේවා කටයුතුවල වර්ධනය දායක වූ අතර කෘෂිකාර්මික කටයුතුවල පහත වැටීම අයහපත් ලෙස බලපාන ලදී. විදේශීය සම්පත් සැලකූ විට දේශීය මුදල් ඒකකයෙහි අගය පිරිහීම හේතුවෙන් ආනයන භාණ්ඩවල මිල ඉහළ යෑම නාමික වටිනාකම අනුව ආනයන වර්ධනය වීම කෙරෙහි දායක විය. කෙසේ වුවද, මූර්ත වශයෙන් ද.දේ.නි. මෙන්ම විදේශ සම්පත්වල ද දක්නට ලැබුණු සාපේක්ෂ අඩු වර්ධනය හේතුවෙන් පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය මූර්ත වශයෙන්, 2015 වසරේ දී වාර්තා කළ සියයට 6.1 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 5.2 ක් දක්වා මන්දගාමී විය.

**2.9 රූප සටහන**

**2016 වසරේ ආර්ථිකය**
**(පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)**




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.13 සංඛ්‍යා සටහන**

**සම්පත් සංයුතිය සහ උපයෝජනය**
**(පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ඇ)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2015(ආ) | 2016 | 2015(ආ) | 2016 |
| 1. සම්පත් | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය | 77.8 | 77.5 | 5.7 | 8.1 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 22.2 | 22.5 | 3.5 | 10.1 |
| **එකතුව** | **100.0** | **100.0** | **5.2** | **8.6** |
| 2. උපයෝජනය | | | | |
| පරිභෝජනය | 61.5 | 59.0 | 10.3 | 4.1 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 20.6 | 21.4 | 1.1 | 12.3 |
| තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම | 1.5 | 3.0 | -56.1 | 121.8 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 16.3 | 16.6 | 5.3 | 10.3 |
| **එකතුව** | **100.0** | **100.0** | **5.2** | **8.6** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2016 වසරේ දී ද ආර්ථිකයේ පවත්නා සම්පත් ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් පරිභෝජන කටයුතු සඳහා උපයෝජනය කරන ලදී.** මෙහි දී සමස්ත සම්පත් උපයෝජනයෙහි ප්‍රතිශතයක් ලෙස පරිභෝජන කටයුතු 2015 වසරේ දී වාර්තාකළ සියයට 61.5 ක අගය හා සැසඳීමේ දී පරිභෝජන වියදම්වල පහළ යෑම හේතුවෙන් මෙම වසර තුළ සියයට 59.0 ක් දක්වා පහත වැටුණි. මේ අතර, ආයෝජන කටයුතු සඳහා වූ සම්පත් උපයෝජනය, 2015 වසරේ දී වාර්තා කළ සියයට 22.1 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 24.4 ක් දක්වා වර්ධනය විය. 2015 වසරේ දී සියයට 1.1 කින් වර්ධනය වූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 2016 වසරේ දී සියයට 12.3 කින් වර්ධනය වෙමින් සමස්ත සම්පත් ප්‍රමාණය සඳහා සියයට 21.4 ක දායකත්වයක් දැක්වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2016 වසරේ දී සමස්ත සම්පත් උපයෝජනයෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන, 2015 වසරේ දී වාර්තා කළ සියයට 16.3 ක අගයට සාපේක්ෂව සියයට 16.6 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. වසර තුළ දී අපනයන මිල මට්ටම් සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවැති හෙයින් අපනයන නාමික වශයෙන් වර්ධනය වීම මේ සඳහා හේතු විය. මූර්ත වටිනාකම සැලකීමේ දී, පරිභෝජන වියදම් පහළ යෑම මෙන්ම අපනයන පහත වැටීම හේතුවෙන් සම්පත් උපයෝජනය පහළ යන ලදී.

**2.14 සංඛ්‍යා සටහන**

**පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ඇ)**

| කාණ්ඩය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2015(ආ) | 2016 | 2015(ආ) | 2016 | 2015(ආ) | 2016 |
| 1. වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | 10,951,695 | 11,838,975 | 5.7 | 8.1 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 8,661,886 | 9,018,895 | 10.3 | 4.1 | 79.1 | 76.2 |
| පෞද්ගලික | 7,677,131 | 8,003,789 | 10.0 | 4.3 | 70.1 | 67.6 |
| රජය | 984,755 | 1,015,107 | 13.4 | 3.1 | 9.0 | 8.6 |
| 3. ආයෝජන | 3,114,674 | 3,723,875 | -7.0 | 19.6 | 28.4 | 31.5 |
| 4. දේශීය ඉතුරුම් | 2,289,809 | 2,820,080 | -8.8 | 23.2 | 20.9 | 23.8 |
| පෞද්ගලික | 2,536,588 | 2,891,799 | -3.9 | 14.0 | 23.2 | 24.4 |
| රජය | -246,779 | -71,719 | -93.3 | 70.9 | -2.3 | -0.6 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -824,865 | -903,795 | 1.4 | -9.6 | -7.5 | -7.6 |
| 6. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඈ) | -281,337 | -332,758 | -19.2 | -18.3 | -2.6 | -2.8 |
| 7. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම | 842,082 | 939,782 | 3.6 | 11.6 | 7.7 | 7.9 |
| 8. ජාතික ඉතුරුම් | 2,850,554 | 3,427,104 | -7.7 | 20.2 | 26.0 | 28.9 |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයන්වලින් වෙනස් වනුයේ ගණනය කිරිමේදී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ඉතුරුම්

**2015 වසරේ දී සියයට 8.8 ක පහත වැටීමක් වාර්තා කළ දේශීය ඉතුරුම් 2016 වසරේ දී රුපියල් බිලියන 2,820.1 ක් දක්වා සියයට 23.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** දේශීය ඉතුරුම්වල දක්නට ලැබුණු මෙම වර්ධනය, 2015 වසරට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් රජයේ ආදායම් ඉහළ යෑම මෙන්ම රජයේ පුනරාවර්තන වියදම් මන්දගාමී වීමෙහි ද ප්‍රතිඵලයක් ලෙස රජයේ නිර්-ඉතුරුම් සැලකිය යුතු ලෙස පහත වැටීම සහ පෞද්ගලික ඉතුරුම්වල දක්නට ලැබුණු සාධනීය වර්ධනයෙහි ද සමස්ත ප්‍රතිඵලයකි. ඒ අනුව, ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ දී සියයට 20.9 ක් වූ දේශීය ඉතුරුම් 2016 වසරේ දී සියයට 23.8 ක් දක්වා වර්ධනය විය.

**2015 වසරේ දී සියයට 7.7 කින් පහත වැටුණු ජාතික ඉතුරුම් 2016 වසරේ දී රුපියල් බිලියන 3,427.1 ක් දක්වා සියයට 20.2 කින් වර්ධනය විය.** දේශීය ඉතුරුම්වල දක්නට ලැබුණු ඉහළ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. තවද, විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම 2016 වසර තුළ දී සියයට 11.6 ක වර්ධනයක් වාර්තා කරමින් ජාතික ඉතුරුම්වල වර්ධනය සඳහා හිතකර ලෙස දායක විය. මේ අතර, විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් 2016 වසර තුළ දී පහත වැටුණි. මේ අනුව, 2016 වසරේ දී ජාතික ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස, 2015 වසරේ දී වාර්තා කළ සියයට 26.0 ක අනුපාතයට සාපේක්ෂව සියයට 28.9 ක් දක්වා වර්ධනය විය. කෙසේ වුවද, ආයෝජනවල ඉහළ වර්ධනය හේතුවෙන් ඉතුරුම්-ආයෝජන පරතරය ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ දී වාර්තා කළ සියයට 2.4 ක අනුපාතයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 2.5 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය.

## 2.6 ආදායම

**ජාතික ගිණුම්කරණයේ ආදායම් ප්‍රවේශය මගින් වසර තුළ දී රටෙහි ආර්ථිකය තුළ ආදායම් ජනනය කරන ලද සංරචක නිරූපණය කෙරෙයි.** ආර්ථිකයේ ප්‍රධානතම ආදායම් සංරචකය වන දළ මෙහෙයුම් අතිරික්තය 2016 වසරේ දී සමස්ත එකතු කළ අගයෙන් සියයට 69.0 ක් සඳහා දායකත්වය දැක්වූ අතර, සේවක ආදායම් සහ නිෂ්පාදන ක්‍රියාවලිය මත වන වෙනත් බදුවල (සහනාධාර අඩු කළ පසු) එකතු කළ අගය පිළිවෙළින් සියයට 30.6 ක් සහ සියයට 0.4 ක් විය. දළ මෙහෙයුම් අතිරික්තය නාමික වශයෙන් 2015 වසරේ දී වාර්තා කළ සියයට 2.8 ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 6.5 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා දළ මෙහෙයුම් අතිරික්තයෙහි ප්‍රධානතම ආදායම් සංරචකය වන ශුද්ධ මෙහෙයුම් අතිරික්තය 2015 වසරේ දී වාර්තා කළ සියයට 2.0 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 7.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතු විය. තවද, දළ මෙහෙයුම් අතිරික්තයෙහි අනෙකුත් සංරචක වන ස්ථාවර

2

**2.15 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ)(ඇ)**

| අයිතමය | ප්‍රතිශතක දායකත්වය (%) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 (ආ) | | | | | 2016 | | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. නො. ගෘ. සේ. ආ.* අංශය | සමස්ත ආර්ථිකය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා. නො. ගෘ. සේ. ආ.* අංශය | සමස්ත ආර්ථිකය |
| **සේවක ආදායම්** | **31.3** | **5.2** | **28.9** | **34.6** | **100.0** | **30.9** | **5.3** | **28.9** | **34.9** | **100.0** |
| **දළ මෙහෙයුම් අතිරික්තය** | **34.8** | **3.9** | **2.8** | **58.5** | **100.0** | **35.7** | **4.4** | **1.8** | **58.1** | **100.0** |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 38.2 | 4.6 | 1.8 | 55.4 | 100.0 | 39.3 | 5.3 | 0.9 | 54.5 | 100.0 |
| මිශ්‍ර ආදායම | - | - | - | 100.0 | 100.0 | - | - | - | 100.0 | 100.0 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 42.9 | 2.4 | 12.1 | 42.6 | 100.0 | 43.3 | 2.4 | 9.7 | 44.6 | 100.0 |
| **නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර)** | **91.4** | **8.3** | **-** | **0.3** | **100.0** | **91.0** | **8.7** | **-** | **0.3** | **100.0** |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | **34.0** | **4.3** | **10.7** | **51.0** | **100.0** | **34.5** | **4.7** | **10.1** | **50.7** | **100.0** |

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
* ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රාග්ධන පරිභෝජනය සහ මිශ්‍ර ආදායම 2015 වසරේ දී පිළිවෙළින් වාර්තා කළ සියයට 5.9 ක සහ සියයට 5.5 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී පිළිවෙළින් සියයට 1.9 කින් හා සියයට 5.8 කින් වර්ධනය විය. මේ අතර, නිෂ්පාදන ක්‍රියාවලිය මත වන වෙනත් බදු (සහනාධාර අඩු කළ පසු) 2015 වසරේ දී වාර්තා කළ සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 10.8 කින් වර්ධනය විය.

**ආයතනික අංශ අනුව වර්ගීකරණය සැලකීමේ දී, 2016 වසරේදී සියයට 6.2 කින් වර්ධනය වූ ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය ආදායම් සඳහා විශාලතම දායකත්වය ලබාදුන් අතර එය සමස්ත එකතු කළ අගයෙන් සියයට 50.7 ක් විය.** එමෙන්ම, සියයට 8.3 කින් වර්ධනය වූ මූල්‍ය නොවන ආයතන අංශය සියයට 34.5 ක දෙවැනි වැඩිම දායකත්වයක් ලබා දෙන ලදී. මේ අතර, නාමික වටිනාකම සැලකීමේ දී දළ මෙහෙයුම් අතිරික්තය සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය 2016 වසරේදී සියයට 58.1 ක දායකත්වයක් ලබා දෙමින් සියයට 5.7 කින් වර්ධනය වූ අතර, මූල්‍ය නොවන ආයතන අංශය සියයට 35.7 ක දායකත්වයක් ලබා දෙමින් සියයට 9.3 කින් වර්ධනය විය. මේ අතර, සේවක ආදායම් සැලකීමේ දී, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය සහ මූල්‍ය නොවන ආයතන අංශය 2016 වසරේ දී පිළිවෙළින් සියයට 34.9 ක සහ සියයට 30.9 ක දායකත්වයක් ලබාදුන් අතර එම අංශ පිළිවෙළින් සියයට 8.2 ක සහ සියයට 5.9 ක නාමික වර්ධනයක් වාර්තා කරන ලදී. ඒ අතරම, 2016 වසරේ දී සේවක ආදායම් සඳහා රාජ්‍ය අංශය සියයට 28.9 ක දායකත්වයක් ලබාදෙමින් සියයට 7.0 කින් වර්ධනය විය. තවද, නිෂ්පාදන ක්‍රියාවලිය මත වන සහනාධාර අඩු කළ බදු සඳහා 2016 වසරේ දී විශාලතම දායකත්වය මූල්‍ය නොවන ආයතන අංශය වෙතින් ජනනය වූ අතර එය සියයට 91.0 ක දායකත්වයක් ලබා දෙමින් සියයට 10.4 කින් වර්ධනය විය. මේ අතර, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන ආයතන අංශය 2016 වසරේ සමස්ත එකතු කළ අගය සඳහා සියයට 50.7 ක දායකත්වයක් ලබා දුන්නද එම අංශය, නිෂ්පාදන ක්‍රියාවලිය මත වන වෙනත් බදු (සහනාධාර අඩු කළ පසු) ප්‍රමාණය සඳහා දක්වන ලද දායකත්වය සියයට 0.3 කට සීමා විය.